# මුදල් හා බැංකු කටයුතු

## මුදල් සැපයුම

### සමස්ත උපනතීන්

ආර්ථිකය තුළ අඛණ්ඩ අධි ඉල්ලුම් පීඩනයක් සනිටුහන් කරමින් 1994 වර්ෂය තුළ දී මුදල් සැපයුමෙහි වර්ධන වේගය නොකඩවා ඉහළ මට්ටමක පැවතුණි. පටු මුදල් සැපයුම ($M_1$) වර්ෂය අවසාන වන විට සියයට 19 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින්, 1993 වර්ෂයේ පැවති වර්ධන මට්ටමෙහි ම පැවති අතර පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) වර්ධන වේගය පසුගිය වර්ෂයෙහි පැවති සියයට 23.5 ක මට්ටමෙහි සිට 1994 වර්ෂයේ දී සියයට 19.6 දක්වා තරමක් පහළ ගියේය. 1994 ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ දී මුදල් සැපයුමේ වර්ධනයෙහි තරමක අඩු වීමක් පෙන්නුම් කළ ද සාමාන්‍ය වශයෙන් මූල්‍ය වර්ධනය වර්ෂය පුරාම අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතියේය.


1994 වර්ෂය තුළ දී ඉහළ මට්ටමක පැවති මූල්‍ය ප්‍රසාරණයට මූලික හේතුව වූයේ දේශීය ණය නොකඩවා ඉහළ යාමයි. පෞද්ගලික අංශයට දුන් ණය සියයට 21 කින් හා රාජ්‍ය අංශයට දුන් ශුද්ධ ණය සියයට 4 කින් ප්‍රසාරණය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ණය, පසුගිය වර්ෂයෙහි සියයට 3.5 ක වර්ධනය හා සසඳා බලන කල 1994 දී සියයට 14.7 කින් තියුණු ලෙස ඉහළ ගියේය. එහෙත් සමස්ත ගෙවුම් ශේෂයෙහි අඩු අතිරික්තයක් පිළිබිඹු කරමින් ශුද්ධ විදේශ වත්කම් 1993 වසරෙහි සියයට 87.9 ක තියුණු වර්ධනයට වෙනස්ව 1994 වසරෙහි මූල්‍ය ප්‍රසාරණය කෙරෙහි ඇති කරන බලපෑම අඩු කරමින් සියයට 37.7 ක අඩු වර්ධනයක් වාර්තා විය.

පසුගිය වසරෙහි සියයට 25.9 (රුපියල් දශලක්ෂ 11,609) ක ඉහළ වර්ධනය හා සසඳන කල මූල්‍ය පදනම (ව්‍යවහාර මුදල් නිකුතුව හා වාණිජ බැංකු සහ රජයේ නියෝජිත ආයතන විසින් මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතුවලින් සමන්විත වූ මූල්‍ය පදනම නැතහොත් සංචිත මුදල්) 1994 දී සියයට 20.5 (රුපියල් දශලක්ෂ 11,588) කින් ඉහළ ගිය අතර, එය වසර අවසානය වන විට රුපියල් දශලක්ෂ 68,055 ක් විය. සංචිත මුදල් ප්‍රසාරණයට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ මහ බැංකුව වෙත ශුද්ධ විදේශ වත්කම් ඒකරාශී වීමයි. මෙම ශුද්ධ විදේශ වත්කම් 1994 දී රුපියල් දශලක්ෂ 14,288 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ම මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම හා මහ බැංකු ප්‍රතිමූල්‍ය පහසුකම් ක්‍රමයෙන් පහළයාම මගින් මහ බැංකුවෙහි ශුද්ධ දේශීය වත්කම් රුපියල් දශලක්ෂ 2,700 කින් අඩු වීම, 1994 වසරෙහි සංචිත මුදල්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 11,588 ක මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය. පසුගිය වසරෙහි සංචිත මුදල්හි ඉහළ යාම රුපියල් දශලක්ෂ 11,609 ක් විය. කෙසේ වෙතත් මුදල් සැපයුමේ ($M_2$) වර්ධනයට සාපේක්ෂව සංචිත මුදල් හි අධික වර්ධනය හේතුකොට ගෙන, මුදල් සැපයුම සහ මූල්‍ය පදනම අතර අනුපාතිකය වන මූල්‍ය ගුණකය 1993 අග දී 2.86 ක සිට 1994 අග වන විට 2.84 දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මූල්‍ය ගුණකයේ මෙම පහත වැටීම සහ ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතිකය 1993 දී සියයට 24.8 සිට 1994 දී සියයට 25.2 දක්වා ඉහළයාම මගින් පිළිබිඹු වනුයේ ගණුදෙනු චේතනාව මත මුදලට ඇති ඉල්ලුම කෙරෙහි දැඩි කැමැත්තයි.

ආර්ථිකය තුළ අධි ද්‍රවශීලතා තත්ත්වයක් පැවතිය ද මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අඩුවීමේ හේතුවෙන් 1994 වර්ෂය තුළ දැඩි විවට වෙළෙඳපොළ කටයුතු පවත්වා ගෙනයාමට මහ බැංකුවට තිබූ හැකියාව සීමාවිය. මෙම බාධකය හේතුවෙන් ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දී කල්පිරුණු සියළුම භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ම අලෙවි වීමට ඉඩ හරිනු ලැබූ අතර අධි ද්‍රවශීලතාවය උරා ගැනීම සඳහා මහ බැංකුව විසින් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම ආරම්භ කරනු ලැබිණ. මීට අමතරව 1993 අගෝස්තු මස රුපියල් තැන්පතු සඳහා මෙන් ම විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් සඳහා ද අගෝස්තු මස සියයට 15 දක්වා වැඩි කරන ලද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය එම මට්ටමෙන් ම පවත්වා ගනු ලැබිණ. කෙසේ වෙතත් ,වාණිජ බැංකු සතු විදේශීය මුදල් විදේශයන්හි ආයෝජනය කිරීම දිරිගන්වනු වස් හා එමගින් සංචිත මුදල් ප්‍රසාරණයට ඇති වන බලපෑම අඩු කිරීමේ අදහසින් විදේශයන්හි ආයෝජනය කර ඇති විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලට අදළ වන ව්‍යවස්ථාපිත සංචිත

# මුදල් සැපයුම

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1.65 සංඛ්‍යා සටහන

## සමස්ත මුල්‍ය අගයන් 1992 - 1994


ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| කාලච්ඡේදය අවසානයට | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | වෙනස% 1991/92 | වෙනස% 1992/93 | වෙනස% 1993/94 | 1992 | 1993 | 1994 | වෙනස% 1991/92 | වෙනස% 1992/93 | වෙනස% 1993/94 |
| ජනවාරි | 44,833 | 51,582 | 58,607 | +12.3 | +15.1 | +13.6 | 112,367 | 133,234 | 160,310 | +24.6 | +18.6 | +20.3 |
| පෙබරවාරි | 46,128 | 51,519 | 63,133 | +14.1 | +11.7 | +22.5 | 113,572 | 135,238 | 164,598 | +25.0 | +19.1 | +21.7 |
| මාර්තු | 48,312 | 53,869 | 63,763 | +15.4 | +11.5 | +18.4 | 116,193 | 140,062 | 167,443 | +23.9 | +20.5 | +19.5 |
| අප්‍රේල් | 48,492 | 53,954 | 62,337 | +17.1 | +11.3 | +15.5 | 118,710 | 142,177 | 168,155 | +25.9 | +19.8 | +18.3 |
| මැයි | 47,304 | 53,003 | 61,484 | +14.8 | +12.0 | +16.0 | 118,398 | 140,838 | 167,719 | +24.2 | +19.0 | +19.1 |
| ජූනි | 47,007 | 52,465 | 63,082 | +13.0 | +11.6 | +20.2 | 117,627 | 139,508 | 172,529 | +22.3 | +18.6 | +23.7 |
| ජූලි | 46,208 | 53,443 | 64,099 | +13.3 | +15.7 | +19.9 | 117,513 | 142,054 | 174,109 | +21.8 | +20.9 | +22.6 |
| අගෝස්තු | 46,687 | 54,073 | 64,232 | +11.6 | +15.8 | +18.8 | 119,144 | 143,054 | 174,951 | +20.4 | +20.1 | +22.3 |
| සැප්තැම්බර් | 47,285 | 55,149 | 66,866 | + 9.3 | +16.6 | +21.2 | 120,447 | 146,286 | 179,287 | +18.2 | +21.5 | +22.6 |
| ඔක්තෝබර් | 46,758 | 55,693 | 67,798 | + 8.3 | +19.1 | +21.7 | 122,975 | 149,584 | 184,336 | +16.7 | +21.6 | +23.2 |
| නොවැම්බර් | 47,107 | 55,996 | 67,813 | + 9.2 | +18.9 | +21.1 | 125,090 | 154,153 | 185,792 | +15.8 | +23.2 | +20.5 |
| දෙසැම්බර් | 50,490 | 60,104 | 71,520 | + 7.3 | +19.0 | +19.0 | 130,701 | 161,362 | 192,990 | +16.6 | +23.5 | +19.6 |
| මාසික සාමාන්‍යය | 47,218 | 54,238 | 64,561 | +12.0 | +14.9 | +19.0 | 119,395 | 143,963 | 174,352 | +21.1 | +20.6 | +21.1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# දේශීය ණය

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.66 සංඛ්‍යා සටහන
# සමස්ත මූල්‍ය අගයන් සහ ඒවාට තුඩුදුන් සාධක 1992 - 1994

ප්‍රමාණය රුපියල් දශලක්ෂ


| ශීර්ෂය | 1992 දෙසැ. | 1993 දෙසැ. | 1994 දෙසැ. | 1992/1993 වෙනස | | 1993/1994 වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 27,280 | 32,133 | 38,906 | + 4,853 | + 17.8 | + 6,773 | + 21.1 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු | 23,210 | 27,971 | 32,614 | + 4,761 | + 20.5 | + 4,643 | + 16.6 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 50,490 | 60,104 | 71,520 | + 9,614 | + 19.0 | +11,416 | + 19.0 |
| 3. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු | 80,211 | 101,258 | 121,470 | +21,047 | + 26.2 | +20,212 | + 20.0 |
| 3.1 සමුපකාර ආයතන | 2,714 | 3,287 | 3,781 | + 573 | + 21.1 | + 495 | + 15.1 |
| 3.2 රාජ්‍ය සංස්ථා | 7,391 | 10,287 | 13,236 | + 2,896 | + 39.2 | + 2949 | + 28.7 |
| 3.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් (අ) | 70,106 | 87,684 | 104,452 | +17,578 | + 25.1 | +16,768 | + 19.1 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 130,701 | 161,362 | 192,990 | +30,661 | + 23.5 | +31,628 | + 19.6 |
| **තුඩු දුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය | 153,347 | 158,709 | 182,044 | + 5,362 | + 3.5 | +23,336 | + 14.7 |
| 1.1 රජයට දෙන ලද ශුද්ධ ණය | 42,350 | 35,004 | 36,397 | - 7,346 | - 17.3 | + 1,393 | + 4.0 |
| 1.1.1 රජයට දෙන ලද දළ ණය | 54,090 | 43,110 | 48,500 | - 10,980 | - 20.3 | + 5,390 | + 12.5 |
| මහ බැංකුව විසින් | 40,604 | 24,810 | 27,818 | - 15,794 | - 38.9 | + 3,008 | + 12.1 |
| වාණිජ බැංකු විසින් | 13,486 | 18,300 | 20,682 | + 4,814 | + 35.7 | + 2,382 | + 13.0 |
| 1.1.2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ | 11,740 | 8,105 | 12,103 | - 3,634 | - 31.0 | + 3,998 | + 49.3 |
| 1.2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය | 110,997 | 123,704 | 145,647 | +12,707 | + 11.4 | +21,943 | + 17.1 |
| 1.2.1 සමුපකාර ආයතන | 2,021 | 1,903 | 2,541 | - 118 | - 5.8 | + 638 | + 33.5 |
| 1.2.2 රාජ්‍ය සංස්ථා | 14,750 | 7,775 | 5,163 | - 6,975 | - 47.3 | - 2,612 | - 33.6 |
| 1.2.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් | 94,226 | 114,026 | 137,943 | +19,800 | + 21.0 | +23,917 | + 21.0 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) | 24,162 | 45,400 | 62,502 | +21,238 | + 87.9 | +17,102 | + 37.7 |
| 2.1 මහ බැංකුවෙන් | 21,049 | 45,725 | 60,013 | +24,676 | +117.2 | +14,288 | + 31.2 |
| 2.2 වාණිජ බැංකු වලින් | 3,113 | - 325 | 2,489 | - 3,438 | -110.4 | + 2,814 | + 865.9 |
| 3 අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) | -46,808 | -42,747 | -51,557 | + 4,062 | + 8.7 | - 8,810 | - 20.6 |
| 3.1 මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) | -19,903 | -17,170 | -20,341 | + 2,733 | + 13.7 | - 3,171 | - 18.5 |
| 3.2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) | -25,721 | -20,335 | -24,314 | + 5,386 | + 20.9 | - 3,979 | - 19.6 |
| 3.3 හුවමාරුවෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි | - 1,184 | - 5,242 | - 6,902 | - 4,058 | - 342.7 | - 1,660 | - 31.7 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 130,701 | 161,362 | 192,990 | +30,661 | + 23.5 | +31,628 | + 19.6 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන : සලකුණු වලින් (+ හා -) පුළුල් මුදල් සැපයුම ($M_2$) හි බලපෑම් දැක්වේ.
(අ) නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

# බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

අනුපාතය 1994 පෙබරවාරි මස දී සියයට 5 දක්වා අඩු කළේය. එයට අමතරව ද්‍රවශීලතා ප්‍රසාරණය අඩු කිරීම සඳහා මහ බැංකුව කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ණය නවතා දමන ලද අතර මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ. දි. ණ. අ.) යටතේ ණය ලබා දීම සීමා කරනු ලැබිණ.

## මුදල් සැපයුම හා එයට බලපෑ සාධක

මහජනතාව විසින් දරණු ලබන ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත පටු මුදල් සැපයුම ($M_1$) 1994 අග වන විට සියයට 19 කින් ( රුපියල් දශලක්ෂ 11,416) ඉහළ යමින් රුපියල් දශලක්ෂ 71,520 ක් විය. සියයට 19 ක (රුපියල් දශලක්ෂ 9, 614) ක මෙවැනිම ඉහළ යාමක් පසුගිය වසරෙහි දී ද දක්නට ලැබිණ. ගණුදෙනු චේතනාව මත මුදලට ඇති ඉල්ලුම කෙරෙහි දැඩි කැමැත්තක් පෙන්නුම් කරමින් සංසරණයේ පවත්නා මුදල් 1993 දි සියයට 18 කින් (රුපියල් දශලක්ෂ 4,853) ඉහළ යාම හා සසඳා බලන කළ 1994 දි සියයට 21 කින් (රුපියල් දශලක්ෂ 6,773 ) ඉහළ ගිය අතර පසුගිය වසරේ දී සියයට 21 (රුපියල් දශලක්ෂ 4,761) ඉහළ ගිය ඉල්ලුම් තැන්පතු සියයට 17 (රුපියල් දශලක්ෂ 4,643) කින් වැඩි විය. ඒ අනුව $M_1$ හි සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් ප්‍රමාණය 1993 සියයට 53 සිට අවසානය වනවිට සියයට 54 දක්වා ඉහළ ගියේය.

මේ අතර වාණිජ බැංකු අනුගමනය කරනු ලැබූ දැඩි තැන්පතු රාශීකරණ ප්‍රයත්නයට ප්‍රතිචාරිව වාණිජ බැංකුවල මහජනතාව විසින් දරණු ලබන කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු (ආසන්න මුදල්) 1993 දී වූ සියයට 26 ක (රුපියල් දශලක්ෂ 21,047) ඉහළයෑම හා සසඳා බලන කළ 1994 දී සියයට 20 කින් (රුපියල් දශලක්ෂ 20,212) ඉහළ ගියේය. පසුගිය වර්ෂයේ දී මෙන් මෙම තැන්පතුවල ඉහළ යාමට විශාල වශයෙන් දායක වූයේ පෞද්ගලික අංශයේ තැන්පතුවල ඉහළයාම වන අතර එම අංශයේ තැන්පතු සියයට 19 කින් (රුපියල් දශලක්ෂ 16,768) ඉහළ ගියේය. රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතනවල තැන්පතු පිළිවෙලින් සියයට 29 කින් (රුපියල් දශලක්ෂ 2,949) හා සියයට 15 (රුපියල් දශලක්ෂ 495) කින් ඉහළ ගියේය. මේ අනුව $M_1$ සහ කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතුවලින් සමන්විත වූ පුළුල් මුදල් සැපයුම ($M_2$) 1994 දි සියයට 19.6 කින් ප්‍රසාරණය විය.

1994 ඉහළ මූල්‍ය ප්‍රසාරණයට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ පෞද්ගලික අංශයට දෙන ලද ණය විශාල ලෙස ඉහළ යාමයි. රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද ණයෙහි පහළ යාමක් පැවතිය ද පෞද්ගලික අංශයට දෙන ලද ණය සියයට 21 කින් (රුපියල් දශලක්ෂ 23,917) විශාල ලෙස ඉහළයාම හේතුකොට ගෙන පසුගිය වසරෙහි සියයට 3.5 (රුපියල් දශලක්ෂ 5,362) ක වැඩිවීම හා සසඳා බලන කල දේශීය ණය සියයට 14.7 (රුපියල් 23,336) ක ඉහළ වර්ධනයක් වාර්තා කරනු ලැබිණ.

බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ශුද්ධ ණය 1993 දි සියයට 17 ක (රුපියල් දශලක්ෂ 7,346) සැලකිය යුතු පහළ යාමට ප්‍රති විරුද්ධව 1994 දී සියයට 4 කින් (රුපියල් දශලක්ෂ 1,393) ඉහළයාම මගින් දේශීය ණය ප්‍රසාරණය තවදුරටත් තීව්‍ර කරනු ලැබිණ. රාජ්‍ය තැන්පතු රුපියල් දශලක්ෂ 1,011 කින් වර්ධනය වී එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් රුපියල් දශලක්ෂ 237 කින් පහළ යාමක් පැවතිය ද 1994 වර්ෂය තුළ අයහපත් රාජ්‍ය මූල්‍ය තත්වයක් පිළිබිඹු කරමින් මහ බැංකුව මගින් දරණු ලබන භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශලක්ෂ 1,145 කින් ඉහළයාම හා රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් රුපියල් දශලක්ෂ 1,863 කින් ඉහළයාම හේතුකොටගෙන මහ බැංකුව විසින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශලක්ෂ 1,760 කින් ඉහළ ගියේය. මේ අතර වාණිජ බැංකු මගින් රජයට දෙන ලද ශුද්ධ ණය සලකා බලන කාලය තුළ දී පහළ ගියේය. වාණිජ බැංකු මගින් දෙන ලද දළ ණය රුපියල් දශලක්ෂ 2,382 කින් ඉහළ ගියද රාජ්‍ය තැන්පතු ශේෂ රුපියල් දශලක්ෂ 2,986 කින් ඉහළ යාම නිසා වාණිජ බැංකු මගින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශලක්ෂ 604 කින් පහළ ගියේය.

1994 වර්ෂය තුළ දී රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද ණය සියයට 33.6 කින් (රුපියල් දශලක්ෂ 2,612) කින් පහළ වැටිණ. බොරතෙල් සඳහා වූ පහළ ජාත්‍යන්තර මිළ ගණන් හේතුකොටගෙන මූල්‍ය තත්වයෙහි වැඩි දියුණුවක් පෙන්නුම් කරමින් රාජ්‍ය බණිජ තෙල් නීතිගත සංස්ථාව මගින්

ලබාගත් ණය 1993 දී පැවති රුපියල් දශලක්ෂ 416 ක වැඩිවීමට වෙනස්ව 1994 දී රුපියල් දශලක්ෂ 2,400 කින් පහළ ගියේය. 1994 ජූලි හා අගෝස්තු මාසවල දී තිරිඟු පිටිවල තොග මිළ පහළ ගියද සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවෙහි (ස.තො.ස) බැංකු ණය විශේෂයෙන්ම වර්ෂයෙහි මුල් කාලය තුළ දී පැවති සතුටුදායක මිළ හා සහනදායී වැඩපිළිවෙලවල් යටතේ තිරිඟු ධාන්‍ය ලබාගත හැකිවීම නිසා රුපියල් දශලක්ෂ 67 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. ලංකා සිමෙන්ති සංස්ථාවට දෙන ලද නොපියවා පැවති අත්තිකාරම් ප්‍රමාණය සංස්ථාව පෞද්ගලීකරණය කිරිම නිසා රුපියල් දශලක්ෂ 384 කින් පහළ ගියේය. මේ අතර සමූපකාර ආයතනයන්ට දෙන ලද මුළු බැංකු ණය ප්‍රමාණය 1993 දී රුපියල් දශලක්ෂ 1,903 ක සිට 1994 දී රුපියල් දශලක්ෂ 2,541 ක්වා ඉහළ ගියේය.

නොකඩවා පස්වන වතාවට ද සමස්ත ගෙවුම් ශේෂයෙහි අතිරික්තයක් පෙන්නුම් කරන තත්වයක් තුළ බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් 1993 වර්ෂයෙහි සියයට 87.9 ක (රුපියල් දශලක්ෂ 21,238) විශාල වර්ධනය හා සසඳා බලන කල වර්ෂය තුළ දී සියයට 37.7 කින් (රුපියල් දශලක්ෂ 17,102) තවදුරටත් ඉහළ ගියේය. මහ බැංකුවෙහි ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශලක්ෂ 14,288 කින් ඉහළ ගිය අතර වාණිජ බැංකුවල එම වත්කම් රුපියල් දශලක්ෂ 2,814 කින් ඉහළ යනු ලැබිණ.

මහ බැංකුවෙහි විදේශ සංචිතයෙහි විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනයන් රුපියල් දශලක්ෂ 14,374 කින් ඉහළ ගිය අතර විදේශයන්හි ඇති මුදල් ශේෂයන් රුපියල් දශලක්ෂ 4,985 කින් පහළ ගියේය. වගකීම් අතින් බලන කල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තුන් අවුරුදු ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ලැබුණ පළමුවන වාරිකය නිසා ජාත්‍යන්තර සංවිධානයන්හි තැන්පතු රුපියල් දශලක්ෂ 4139 කින් වැඩිවිය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ව්‍යුවහාත්මක ගැළපුම් පහසුකම් යටතේ ලැබුණ දිමනා දැනට ආර්ථිකයේ ක්‍රියාත්මකවෙමින් පවත්නා ප්‍රතිව්‍යුහගත කිරීම්වලට සහයෝගය සඳහා දෙනු ලැබූවකි.

වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි ඇති තැන්පතු ඉහළයාම හා විදේශ බැංකුවල ඇති තැන්පතු ශේෂයන් ඉහළ යාමයි. වාණිජ බැංකුවල දළ විදේශීය සංචිතය සියයට 24.8 ක (රුපියල් දශලක්ෂ 6,350) ඉහළ යාමක් වාර්තා කළ අතර 1994 අග වන විට එය රුපියල් දශලක්ෂ 31,917 ක් විය. මේ අතර වාණිජ බැංකුවල දළ විදේශිය වගකීම් සියයට 15.4 කින් (රුපියල් දශලක්ෂ 3,536) වැඩිවිය. විදේශ වගකීම් වැඩිවීම විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලට සීමා වූ අතර එය 1993 දී සියයට 29.5 කින් (රුපියල් දශලක්ෂ 5,322) වැඩිවීම හා සසඳා බලන කල 1994 දී සියයට 15.4 කින් (රුපියල් දශලක්ෂ 3602) ඉහළ ගියේය. මේ අනුව වාණිජ බැංකුවල විදේශ වත්කම් තත්වයෙහි වෙනස්වීමක් පෙන්නුම් කරමින් වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් 1993 දී රුපියල් දශලක්ෂ 325 ක සෘණ අගයක සිට 1994 අග වන විට රුපියල් දශලක්ෂ 2,489 දක්වා වැඩිවිය.

# වාණිජ බැංකු කටයුතු

## සමස්ත උපනතීන්

වර්ෂය තුළ දී, වාණිජ බැංකු කටයුතු ශක්තිමත් තැන්පතු හා ප්‍රාග්ධන පදනමකින් යුතුව තවදුරටත් වර්ධනය විය. වාණිජ බැංකුවල විදේශ වත්කම් තත්ත්වයෙහි වර්ධනය 1994 වර්ෂය තුළ දී දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණයක් විය. විමසුමට ලක්වන කාලය තුළ දී රටේ බැංකු ක්‍රමය තුළ තරඟකාරීත්වය තීව්‍ර වෙමින් පෞද්ගලික වාණිජ බැංකුවල ක්‍රියාකාරීත්වය තවදුරටත් ශක්තිමත් විය. වාණිජ බැංකු ක්‍රමය සතු වත්කම්වලින් රාජ්‍ය බැංකු සතු වත්කම් ප්‍රමාණය 1990 දි සියයට 67 ක සිට 1993 දී සියයට 64 දක්වා පහත වැටුණු අතර, 1994 දි සියයට 62 දක්වා තවදුරටත් පහත වැටිණි. මීට සමානවම වාණිජ බැංකුවල මුළු තැන්පතු වගකීම්වලින් රාජ්‍ය බැංකු දෙක සතු තැන්පතු වගකීම් ප්‍රමාණය1990 සියයට 68 සිට 1993 දී සියයට 61 දක්වා ද, 1994 දි තවදුරටත් සියයට 60 දක්වා ද පහළ වැටිණි.

තැන්පතු වගකීම් විශාල ලෙස ඉහළ යාම නිසා වාණිජ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වය 1994 වර්ෂය තුළ දී ද ඉහළ මට්ටමක පැවතුණි. වාණිජ බැංකුවල ද්‍රවශීල වත්කම් පසුගිය වසරෙහි සියයට 23.4 ක (රුපියල් දශලක්ෂ 12,504) ඉහළ යාම හා සසඳ බලන කළ1994 වර්ෂය තුළ දී සියයට 18.5 කින් (රුපියල් දශලක්ෂ 12,204 ) වර්ධනය විය. ද්‍රවශීල වත්කම් හි ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් ම සිදු වූයේ විදේශීය ශේෂයන්, අතැති මුදල් හා භාණ්ඩාගාර බිල්පත් හි ආයෝජනයන් මගිනි. වර්ෂය තුළ දී තැන්පතු වගකීම්හි වැඩිවීමට වඩා ද්‍රවශිල වත්කම් හි මන්දගාමී ඉහළ යාමක් පෙන්නුම් කරමින් ද්‍රවශීල වත්කම් හා තැන්පතු අනුපාතය 1993 දී සියයට 190.8 ක සිට 1994 අග වන විට සියයට 187.4 දක්වා පහළ වැටිණ. මේ අතර, ද්‍රවශීල වත්කම් හා මුළු තැන්පතු වගකීම් අතර අනුපාතය මෙම කාලය තුළ දී සියයට 40.6 සිට 40.2 දක්වා සුළු වශයෙන් පහත වැටිණ.

## වත්කම් හා වගකීම් ව්‍යුහය

වාණිජ බැංකුවල මුළු වත්කම් හා වගකීම් ප්‍රමාණය (ප්‍රති සටහන් හැර) පසුගිය වසරෙහි පැවති සියයට 32 ක (රුපියල් දශලක්ෂ 59,397) ඉතා ඉහළ වැඩිවීම හා සසඳ බලන කළ වර්ෂය තුළ දි සියයට 15 කින් (රුපියල් දශලක්ෂ 37,162) ප්‍රසාරණය විය. වාණිජ බැංකුවල වත්කම් හා වගකීම් ව්‍යුහයෙහි වෙනස්කම් කිපයක් ම දක්නට ලැබිණ. වාණිජ බැංකුවල මුළු වත්කම්වලින් ද්‍රවශිල වත්කම් ප්‍රමාණය 1993 දි සියයට 27.0 ක සිට 1994 දි සියයට 27.8 දක්වා ඉහළ ගියේය. විදේශ වත්කම් ප්‍රමාණය හා රජයේ සුරැකුම්පත් හි හා අනෙකුත් ආයෝජන පිළිවෙලින් 1993 දී සියයට 8.4 හා සියයට 8.0 ක සිට 1994 දී සියයට 9.5 හා 9.3 දක්වා ඉහළ ගියේය. ස්ථාවර වත්කම් හි ප්‍රමාණය 1993 දී සියයට 21 ක සිට 1994 දි සියයට 17.9 දක්වා පහළ වැටුණ අතර, ණය සහ අත්තිකාරම් හි ප්‍රමාණය සියයට 51 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතිණි. වගකීම් අංශයෙහි ඉල්ලුම් තැන්පතුවල ප්‍රමාණය සියයට 14.2 සිට සියයට 14.8 දක්වා ඉහළ ගිය අතර, කාලින හා ඉතිරි කිරීමේ තැන්පතු සියයට 51.1 සිට සියයට 53.ද දක්වා ඉහළ ගියේය. මේ අතර, මුළු වගකීම්වලින් ගෙවා නිමි ප්‍රාග්ධනයෙහි ප්‍රමාණය සියයට 1 සිට සියයට 10 දක්වා ඉහළ ගිය අතර, අනෙකුත් වගකීම් හි ප්‍රමාණය සියයට 21.1 සිට සියයට 17.6 දක්වා පහළ වැටිණ.

වගකීම් අංශයෙහි වාණිජ බැංකුවල සම්පත් පදනම පුළුල් කිරීම සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වූයේ තැන්පතු, ප්‍රාග්ධන පදනම හා දේශීය අන්තර් බැංකු ණය ගැනීම් හි ඇති වූ වර්ධනයයි. වර්ෂය තුළ දී ඉල්ලුම් තැන්පතු සියයට 20.6 (රුපියල් දශලක්ෂ 7,116) කින් හා කාලින හා ඉතිරි කිරිමේ තැන්පතු සියයට 19.3(රුපියල් දශලක්ෂ 24,137) කින් ඉහළ යාම හේතුකොට ගෙන මුළු තැන්පතු රුපියල් දශලක්ෂ 31,252 කින් ඉහළ ගියේය. මේ අතර, ගෙවා නිමි ප්‍රාග්ධනය, සංචිත අරමුදල්. හා නොබෙදු ලාභවලින් සමන්විත ප්‍රාග්ධන පදනම වර්ෂය තුළ දී සියයට 29.4 (රුපියල් දශලක්ෂ 6,428) ඉහළ ගියේය. මෙයට එක් හේතුවක් වූයේ බාල් සම්මුතිය (Basle Agrement) යටතේ අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයට සරිලන පරිදි බැංකු සිය ප්‍රාග්ධන පදනම පුළුල් කිරීමයි. බැංකු මෙම අනුපාතය 1994 සිට පවත්වා ගත යුතු විය. දේශීය අන්තර් ණය ගැනීම් සියයට 15.7 (රුපියල් දශලක්ෂ 1,434) කින් ඉහළ ගිය අතර, විදේශීය ණය ගැනීම්

## 1.67 සංඛ්‍යා සටහන

## වාණිජ බැංකු වත්කම් හා වගකීම් හි තෝරාගත් ශීර්ෂ 1993-1994

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | මාසික සංඛ්‍යාවන්ගේ සාමාන්‍යය | | කාලච්ඡේදය අවසානයේදී | |
|---|---|---|---|---|
| | 1993 | 1994 | 1993 | 1994 |
| අතැති මුදල් සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත ඇතුළත්ව) | 18,172 | 23,365 | 20,562 | 25,389 |
| විදේශීය ශේෂ | 19,653 | 22,353 | 20,529 | 26,804 |
| භාණ්ඩාගාර බිල්පත් | 11,230 | 13,957 | 14,274 | 15,143 |
| වට්ටම් කළ බිල්පත් | 10,712 | 10,904 | 10,541 | 10,773 |
| මුළු ද්‍රවශීල වත්කම් | 59,766 | 70,578 | 65,905 | 78,109 |
| මුළු ආයෝජන (අ) | 3,188 | 8,531 | 5,176 | 10,861 |
| මුළු ණය මුදල් සහ අයිරාවන් (ආ) | 109,667 | 42,160 | 114,641 | 132,447 |
| ඉල්ලුම් තැන්පතු (ඇ) | 31,810 | 37,377 | 34,543 | 41,678 |
| කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු (ඈ) | 114,058 | 138,600 | 127,919 | 152,601 |
| මුළු තැන්පතු | 145,868 | 175,977 | 162,462 | 194,279 |
| අනුපාතය | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට මුදල් | 57.1 | 62.5 | 59.5 | 60.9 |
| මුළු තැන්පතුවලට මුදල් | 12.5 | 13.3 | 12.7 | 13.1 |
| මුළු තැන්පතුවලට විදේශීය ශේෂ | 13.5 | 12.7 | 12.6 | 13.8 |
| මුළු තැන්පතුවලට භාණ්ඩාගාර බිල්පත් | 7.7 | 7.9 | 8.8 | 7.8 |
| මුළු තැන්පතුවලට වට්ටම් කළ වාණිජ බිල්පත් | 7.3 | 6.2 | 6.5 | 5.5 |
| ඉල්ලුම් තැන්පතුවලට ද්‍රවශීල වත්කම් | 187.9 | 188.8 | 190.8 | 187.4 |
| මුළු තැන්පතුවලට ද්‍රවශීල වත්කම් | 41.0 | 40.1 | 40.6 | 40.2 |
| මුළු තැන්පතුවලට ආයෝජන | 2.2 | 4.8 | 3.2 | 5.6 |
| මුළු තැන්පතුවලට ණය මුදල් සහ අයිරාවන් | 75.2 | 24.0 | 70.6 | 68.2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) භාණ්ඩාගාර බිල්පත් හැර රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත්, මහ බැංකු සුරැකුම්පත් සහ පෞද්ගලික සුරැකුම්පත්.

(ආ) වට්ටම්කළ බිල්පත් ඇතුළත් නොවේ.

(ඇ) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නොවේ.

(ඈ) 1993 හා 1994 වර්ෂයන්හිදී රාජ්‍ය බැංකු දෙක මගින් විශේෂ ඉතිරි කිරීමේ ගිණුම් ක්‍රමය යටතේ දිගු කාලීන තැන්පතු වශයෙන් රැස්කරන ලද පිළිවෙලින් රුපියල් දශලක්ෂ 3,174 ක් සහ රුපියල් දශලක්ෂ 3,719 ක ඉතිරිකිරීම් ඇතුළත් වේ.

සටහන : මෙහි දක්වා ඇති සංඛ්‍යා වල සහ මෙම වාර්තාවෙහි ම වෙනත් ස්ථානයක දක්වා ඇති සංඛ්‍යාවල වෙනස්කම් ඇත්තේ අර්ථ නිරූපනයෙහි ඇති වෙනස්කම් හේතුවෙනි.

## 1.68 සංඛ්‍යා සටහන

## වාණිජ බැංකු තම සම්පත් ලබාගත් මාර්ග සහ ඒවා යෙදවූ මාර්ග 1992 - 1994

රුපියල් දශලක්ෂ

| අංශය සහ විස්තර විශ්ලේෂණය | 1992 අවසානයේ සිට 1993 අවසානය දක්වා | | 1993 අවසානයේ සිට 1994 අවසානය දක්වා | |
|---|---|---|---|---|
| | මූලයන් | භාවිතය | මූලයන් | භාවිතය |
| **1. රාජ්‍ය අංශය** | - | **7,584.3** | **604.3** | - |
| රජයේ සුරැකුම්පත් දැරීම් | - | 3,391.3 | - | 1,410.6 |
| නැන්පතු | - | 2,770.5 | 2,985.8 | - |
| ආනයන බිල්පත් | - | 904.8 | - | 397.6 |
| කෙටි කාලීන ණය | - | 659.4 | - | 604.8 |
| අයිරාවන් | 141.7 | - | 31.5 | - |
| **2. මහබැංකුව** | - | **5,644.4** | - | **9,850.2** |
| ණය ගැනීම් | 240.2 | - | - | 1,789.2 |
| සංචිත | - | 3,662.2 | - | 4,468.0 |
| මහ බැංකු සුරැකුම්පත්හි ආයෝජනය | - | 1,612.0 | - | 3,234.0 |
| කැට මුදල් | - | 610.4 | - | 359.0 |
| **3. රාජ්‍ය සංස්ථා** | **9,870.8** | - | **5,107.4** | - |
| නැන්පතු | 2,896.0 | - | 2,495.9 | - |
| අත්තිකාරම් | 6,974.8 | - | 2,611.5 | - |
| **4. සමූපකාර** | **690.7** | - | - | **142.8** |
| නැන්පතු * | 572.8 | - | 494.9 | - |
| අත්තිකාරම් | 117.9 | - | - | 637.7 |
| **5. අනෙකුත් දේශීය පෞද්ගලික අංශය** | **8,299.4** | - | - | **1,687.0** |
| නැන්පතු | 28,099.9 | - | 22,229.9 | - |
| දේශීය බිල්පත් | 22.2 | - | - | 2.7 |
| ආනයන බිල්පත් | - | 1,601.2 | 332.5 | - |
| අයිරාවන් | - | 5,747.5 | - | 7,066.8 |
| ණය මුදල් | - | 11,528.9 | - | 13,658.4 |
| සුරැකුම්පත් හා බැඳුම්කරවල ආයෝජනය | - | 945.1 | - | 3,521.5 |
| **6. අන්තර් බැංකු ගණුදෙනු** | **480.5** | - | **2,024.8** | - |
| දේශීය බැංකුවල ඇති ශේෂයන් | - | 644.5 | - | 1,179.4 |
| දේශීය බැංකුවල නැන්පතු හා ණය ගැනීම් | 1,125.0 | - | 3,204.2 | - |
| **7. විදේශීය අංශය** | - | **2,286.8** | - | **2,723.5** |
| ණය ගැනීම් | 11.9 | - | 16.7 | - |
| නැන්පතු | 106.9 | - | 3,610.5 | - |
| අපනයන බිල්පත් ද ඇතුළුව විදේශීය ශේෂයන් | - | 2,405.6 | - | 6,350.7 |
| **8. අනෙකුත් වත්කම් හා අනෙකුත් වගකීම්** | - | **3,825.9** | **6,667.0** | - |
| ප්‍රාග්ධන හා සංචිත | 11,983.0 | - | 6,427.5 | - |
| ස්ථාවර හා අනෙකුත් වත්කම් | - | 32,940.9 | 2,753.4 | - |
| අනෙකුත් වගකීම් | 17,132.0 | - | - | 2,513.9 |
| **මුළු ශුද්ධ සම්පත් ලැබීම් / භාවිතය** | 19,341.4 | | 14,403.5 | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

* විශේෂ ඉතිරි කිරීමේ ක්‍රමය යටතේ රාජ්‍ය අංශයේ බැංකු දෙක විසින් යොදවන ලද දිගුකාලීන නැන්පතු ද ඇතුළත් වේ.

සටහන : කළු අකුරින් දක්වා ඇති සංඛ්‍යාවන්ගෙන් එක් එක් අංශයෙහි මුළු ශුද්ධ සම්පත් ලැබීම් හෝ භාවිතය දැක්වේ.

සියයට 0.8 (රුපියල් දශලක්ෂ 16.7) කින් සුළු වශයෙන් වැඩි විය. වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් සලකා බලන කාලච්ඡේදය තුළ දී සියයට 3.8 (රුපියල් දශලක්ෂ 1,969) කින් පහළ වැටිණ.

වාණිජ බැංකුවල වැඩි වූ සම්පත් පදනම මුළු වත්කම් හි ප්‍රසාරණයට හේතු විය. ඒ අනුව මුළු ණය සහ අත්තිකාරම් 1993 දී සියයට 11.1 කින් (රුපියල් දශලක්ෂ 12,547) ප්‍රසාරණයට සංසන්දනාත්මකව 1994 දී සියයට 14.4 (රුපියල් දශලක්ෂ 18,039) කින් ඉහළ ගියේය. භාණ්ඩාගාර බිල්පත් හි කරන ලද ආයෝජන සියයට 6 (රුපියල් දශලක්ෂ 869 කින් ඉහළ ගිය අතර, රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත්, මහ බැංකු සුරැකුම්පත් හා පෞද්ගලික සුරැකුම්පත්වලින් සමන්විත අනෙකුත් ආයෝජන සියයට 110 (රුපියල් දශලක්ෂ 5,685) කින් ඉහළ ගියේය. වර්ෂය තුළ දී අතැති විදේශීය ව්‍යවහාර මුදල් හා විදේශීය බැංකුවලින් ලැබිය යුතු ශේෂයන් සියයට 30.6 (රුපියල් දශලක්ෂ 6,276) කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ම විදේශීය ශේෂයන් සියයට 30.6 කින් ද (රුපියල් දශලක්ෂ 6,276) භාණ්ඩාගාර බිල්පත් ආයෝජනයන් සියයට 6.0 කින් ද (රුපියල් දශලක්ෂ 869), අතැති මුදල් හා මහ බැංකුව වෙතැති තැන්පතු සියයට 23.4 (රුපියල් දශලක්ෂ 4,827) කින් වැඩිවීම නිසා ද්‍රවශීල වත්කම් හි ප්‍රසාරණය සියයට 18.5 ක් විය.

## සම්පත් ලැබීම් හා සම්පත් භාවිතය

රාජ්‍ය සංස්ථා, රජය, අන්තර් බැංකු ගණුදෙනු හා ප්‍රාග්ධනය හා සංචිත ද අන්තර්ගත වන අනෙකුත් වගකීම්වලින් වාණිජ බැංකුවලට අවශ්‍ය සම්පත් සැපයුනු අතර මහ බැංකුව, විදේශීය අංශය, දේශීය පෞද්ගලික අංශය හා සමුපකාර ආයතන 1994 වර්ෂය තුළ දී වාණිජ බැංකුවල සම්පත් භාවිතයට ගනු ලැබූ අංශ විය.

ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි ශක්තිමත් මූල්‍ය පදනමක් සනිටුහන් කරමින් රාජ්‍ය සංස්ථාවන් රුපියල් දශලක්ෂ 2,496 කින් බැංකුවල ඇති තැන්පතු ප්‍රමාණය වැඩි කිරීමෙන් හා එම ආයතන ගණු ලැබූ අත්තිකාරම් ප්‍රමාණය අඩු කිරීමෙන් ද වාණිජ බැංකු ක්‍රමය වෙත රුපියල් දශලක්ෂ 5,107 ක අරමුදල් ප්‍රමාණයක් සපයනු ලැබිණ. ප්‍රධාන වශයෙන් ම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි නොපියවා පැවති ණය ප්‍රමාණය සියයට 69.6 (රුපියල් දශලක්ෂ 2,400) කින් පහළ යාම නිසා රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද අත්තිකාරම් රුපියල් දශලක්ෂ 2,612 කින් 1994 වර්ෂය තුළ දී පහළ ගියේය.

1994 වර්ෂය තුළ දී රජයේ අරමුදල් කළමනාකරණයෙහි වූ දුර්වලතාවයන් පෙන්නුම් කරමින් 1993 දී රුපියල් දශලක්ෂ 7,584 ක සම්පත් ප්‍රමාණයක් භාවිතයට ගනු ලැබූ රාජ්‍ය අංශය 1994 දී රුපියල් දශලක්ෂ 604 ක් සපයමින් වාණිජ බැංකුවලට සම්පත් සැපයුම්කරුවෙකු විය. මෙයට ප්‍රධාන හේතුව රාජ්‍ය තැන්පතු රුපියල් දශලක්ෂ 2,986 කින් ඉහළ යාමයි. මේ අතර, බැංකු අංශය ආනයන බිල්පත් හා කෙටිකාලීන අත්තිකාරම් ලෙස සපයන ලද රුපියල් දශලක්ෂ 1,002 කට අමතරව රාජ්‍ය සු.රැකුම්පත් හි කරන ලද ආයෝජන රුපියල් දශලක්ෂ 1,411 කින් ඉහළ ගියේය.

අන්තර් බැංකු ගණුදෙනු වාණිජ බැංකු සම්පත් ප්‍රවාහයට පසුගිය වසරෙහි සපයන ලද රුපියල් දශලක්ෂ 481 හා සසඳා බලන කල 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 2,025 ක් සපයනු ලැබිණ. මේ හැරුණු විට සංචිත හා ප්‍රාග්ධනය ඉහළ යාම මගින් රුපියල් දශලක්ෂ 6,428 ක සම්පත් ප්‍රමාණයක් බැංකු ක්‍රමය තුළට එක් විය. මෙයට එක් හේතුවක් වූයේ 1994 මාර්තු මස සිට සියයට 8 ක අවදානම මත බරතැබූ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයක් පවත්වා ගැනීමට බැංකු ගන්නා ලද උත්සාහයයි.

මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් 1994 වසරේදී වාණිජ බැංකු සතු විශාල සම්පත් ප්‍රමානයක්, ශුද්ධ වශයෙන් රුපියල් දශලක්ෂ 9,850 ක් මහ බැංකුව වෙත ඇද ගැනීමට හේතු සාධකය විය. වාණිජ බැංකුවල තැන්පතු පදනම ඉහළයාම අනුව වාණිජ බැංකු විසින් පවත්වා ගතයුතු ඉහළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය හේතුකොට මහ බැංකුව වෙතැති වාණිජ බැංකු සංචිත ප්‍රමාණය රුපියල් දශලක්ෂ 4,468 කින් ඉහළ ගියේය. මහ බැංකුව වෙතැති

භාණ්ඩාගාර බිල්පත් තොගය අඩු වූ වාතාවරණයක් තුළ මූල්‍ය ප්‍රසාරණය සීමා කිරීම සඳහා 1994 දී මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම මහ බැංකුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබිණ. ඒ අනුව වාණිජ බැංකු 1994 වර්ෂයේ දී මහ බැංකු සුරැකුම්පත් හි රුපියල් දශලක්ෂ 3,234 ක් ආයෝජනය කරනු ලැබිණ. එපමණක් නොව මහ බැංකුව සංචිත මුදල් ප්‍රසාරණය පාලනය කිරීම සඳහා කෙටි කාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් නවතා දැමීමත් මැදි හා දිගු කාලීන ප්‍රතිමූල්‍ය සීමා කිරීමත් හේතුවෙන් වාණිජ බැංකු මහ බැංකුවෙන් ගන්නා ලද ණය රුපියල් දශලක්ෂ 1,789 කින් පහළ යනු ලැබිණ. කෙසේ වෙතත් වෙළෙඳපොළ ණය ගැනීම් පහළ යාම හා වර්ෂය අවසානය වන විට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි දුර්වලතාවයන් නිසා රුපියල් දශලක්ෂ 1,145 කින් මහ බැංකුවෙහි රාජ්‍ය සහ රජය සහතික කළ සුරැකුම්පත් දැරීම ඉහළ යාමට හේතුවිය.

1994 වර්ෂය තුළ දී පහළ පොලී අනුපාතයන් පැවතිය ද වාණිජ බැංකු දේශීය පෞද්ගලික අංශයෙන් රුපියල් දශලක්ෂ 22,230 ක තැන්පතු ප්‍රමාණයක් ඒකරාශී කරගනු ලැබූ අතර, ණය සහ අත්තිකාරම් වශයෙන් රුපියල් දශලක්ෂ 20,395 ක සම්පත් ප්‍රමාණයක් දේශීය පෞද්ගලික අංශය වෙත සපයනු ලැබිණ. මේ අතර, වාණිජ බැංකු පෞද්ගලික අංශයෙහි සුරැකුම්පත්හි හා පිළිනපත්හි කරන ලද ආයෝජනයන් රුපියල් දශලක්ෂ 3,522 කින් ඉහළ ගියේය. මේ නිසා 1994 වර්ෂය තුළ දී පෞද්ගලික අංශයෙහි සම්පත් සැපයීමට වඩා සම්පත් භාවිතය රුපියල් දශලක්ෂ 1,687 කින් වැඩි විය.

පසුගිය වසරෙහි දී මෙන්ම 1994 වර්ෂය තුළ දී විදේශීය අංශය ශුද්ධ වශයෙන් වාණිජ බැංකු අරමුදල් භාවිතා කරන්නෙකු විය. තැන්පතු හා ණය වශයෙන් විදේශීය අංශය සපයන ලද සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 3,627 කින් ඉහළ ගිය අතර, වාණිජ බැංකුවල විදේශයන්හි ඇති ශේෂ ඉහළ යාම මගින් විදේශීය අංශයෙහි සම්පත් භාවිතය රුපියල් දශලක්ෂ 6,351 කින් ඉහළ ගියේය. මේ අතර පසුගිය වසරෙහි රුපියල් දශලක්ෂ 691 ක සම්පත් ප්‍රමාණයක් සපයන ලද සමූපකාර අංශය ඊට වෙනස්ව රුපියල් දශලක්ෂ 143 ක සම්පත් ප්‍රමාණයක් භාවිතයට ගනු ලැබිණ.

මේ අතර, තැන්පතුවල වර්ධනයට (සියයට 19.6 ක් හෝ රුපියල් දශලක්ෂ31,252) සරිලන වර්ධනයක් ණය සහ අත්තිකාරම් (සියයට 14.4 ක් හෝ රුපියල් දශලක්ෂ 18,039) වල නොවුයෙන් වර්ෂය තුළ දී වාණිජ බැංකු තැන්පතු අතිරික්ත තත්ත්වයක පැවතිණි. මුළු තැන්පතුවල අනුපාතයක් ලෙස ණය සහ අත්තිකාරම් 1993 දී සියයට 78.6 ක සිට 1994 අවසානයේ දී සියයට 75.1 දක්වා පහත වැටිණ. වාණිජ බැංකු පෞද්ගලික අංශයට සපයන ලද ණය පසුගිය වසරෙහි ප්‍රවනතාවයට අනුකූල වෙමින් 1994 වර්ෂය තුළ දී සියයට 21 කින් (රුපියල් දශලක්ෂ 23,917) ඉහළ ගියේය.

## වාණිජ බැංකු ණය සහ අත්තිකාරම් බෙදීයාම[1]

පෞද්ගලික අංශයෙහි, රාජ්‍ය ව්‍යවසායයන් හි හා සමූපකාර ආයතනවල නොපියවා පැවති වාණිජ බැංකු ණය සහ අත්තිකාරම් 1993 මුල් කාර්තු තුනෙහි දී සියයට 15.7 ක (රුපියල් දශලක්ෂ 16,823) වර්ධනය හා සසඳා බලන කල 1994 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන දොළොස් මාසය තුළ දී සියයට 15.3 ක (රුපියල් දශලක්ෂ 18,978) ඉහළ යාමක් වාර්තා කරනු ලැබිණ. වාණිජ බැංකු ආර්ථිකයේ සියලුම අංශවලට සපයන ණය ප්‍රමාණය මෙම කාලය තුළ දී වැඩි විය. මෙයින් විශාල ණය ප්‍රමාණයක් වෙළෙඳ අරමුණු සඳහා සපයන ලද ණය විය.

මුළු ණය සහ අත්තිකාරම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් (සියයට 44) අපනයන, ආනයන හා දේශීය වෙළෙඳාමෙන් සමන්විත වූ වෙළෙඳ කටයුතු මූල්‍යකරණය සඳහා සපයනු ලැබිණ. මෙම අංශයට සපයන ලද ණය සහ අත්තිකාරම්වලින් සියයට 73 ක් ම කෙටිකාලීන ස්වරූපයක් ගනු ලැබිණ. වෙළෙඳ අංශයට දී ඇති ණයවලින් නොපියවා පැවති ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 1993 දී සියයට 29 ක (රුපියල් දශලක්ෂ 13,443) වර්ධනය හා සසඳා බලන කල 1994 දී සියයට 3 කින් (රුපියල් දශලක්ෂ 2,177) කින් ඉහළ ගියේය.

---

1. මෙම කොටසෙහි කෙරෙන විශ්ලේෂණය 1994 මුල් කාර්තු තුන අවසානයෙහි පැවති දත්තයන් මත පදනම් වෙයි.

## 1.69 සංඛ්‍යා සටහන

## අරමුණු හා කල්පිරීම් රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු අත්තිකාරම් * 1993-1994

රුපියල් දශලක්ෂ

| වර්ගීකරණය | කෙටි කාලීන (අවු. 1ට අඩු) | | මැදි කාලීන (අවු. 1සිට 5 දක්වා) | | දිගු කාලීන (අවු. 5 ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | (1) | (2) (1) (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (1) | (2) (3) (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (5) | (6) (5) (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (7) | (6) (7) එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| අ. වෙළෙඳ | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 43,851.9 | 72.3 | 10,248.3 | 16.9 | 6,511.4 | 10.7 | 60,610.6 | 47.3 |
| 1994 මාර්තු | 41,693.5 | 73.9 | 10,042.0 | 17.8 | 4,682.7 | 8.3 | 56,418.2 | 42.3 |
| 1994 ජූනි | 44,238.9 | 74.0 | 11,054.6 | 18.5 | 4,509.1 | 7.5 | 59,802.6 | 44.1 |
| 1994 සැප්තැම්බර් | 45,452.8 | 72.6 | 11,835.1 | 18.9 | 5,292.5 | 8.5 | 62,580.4 | 43.9 |
| ආ. මූල්‍ය | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 4,186.2 | 72.4 | 1,049.0 | 18.1 | 548..2 | 9.5 | 5,783.4 | 4.5 |
| 1994 මාර්තු | 3,798.4 | 55.6 | 2,657.4 | 38.9 | 381.8 | 5.6 | 6,837.6 | 5.1 |
| 1994 ජූනි | 3,458.0 | 58.6 | 2,056.8 | 34.8 | 390.9 | 6.6 | 5,905.7 | 4.4 |
| 1994 සැප්තැම්බර් | 3,422.0 | 54.5 | 2,244.6 | 35.7 | 617.2 | 9.8 | 6,283.8 | 4.4 |
| ඇ. කෘෂිකාර්මික | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 5,308.6 | 59.3 | 1,847.3 | 20.6 | 1,793.6 | 20.0 | 8,949.5 | 7.0 |
| 1994 මාර්තු | 5,390.2 | 63.8 | 1,788.2 | 21.2 | 1,263.9 | 15.0 | 8,442.3 | 6.3 |
| 1994 ජූනි | 6,427.7 | 66.7 | 1,951.7 | 20.2 | 1,261.4 | 13.1 | 9,640.8 | 7.1 |
| 1994 සැප්තැම්බර් | 6,991.2 | 69.4 | 1,913.2 | 19.0 | 1,174.6 | 11.7 | 10,079.0 | 7.1 |
| ඈ. කාර්මික ** | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 12,067.1 | 65.4 | 2,583.4 | 14.0 | 3,799.8 | 20.6 | 18,450.3 | 14.4 |
| 1994 මාර්තු | 12.233.5 | 67.7 | 2,503.0 | 13.8 | 3,340.5 | 18.5 | 18,077.0 | 13.6 |
| 1994 ජූනි | 13,018.2 | 72.1 | 2,818.4 | 15.6 | 2,219.8 | 12.3 | 18,056.4 | 13.3 |
| 1994 සැප්තැම්බර් | 13,551.9 | 69.5 | 3,468.5 | 17.8 | 2,488.3 | 12.8 | 19,508.7 | 13.7 |
| ඉ. සංචාරක | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 963.2 | 44.8 | 504.3 | 23.5 | 682.9 | 31.8 | 2,150.4 | 1.7 |
| 1994 මාර්තු | 970.9 | 50.9 | 419.3 | 22.0 | 516.6 | 27.1 | 1,906.8 | 1.4 |
| 1994 ජූනි | 1,084.5 | 55.3 | 362.6 | 18.5 | 515.3 | 26.3 | 1,962.4 | 1.4 |
| 1994 සැප්තැම්බර් | 998.3 | 50.2 | 466.8 | 23.5 | 524.2 | 26.4 | 1,989.3 | 1.4 |
| ඊ. නිවාස | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 3,111.2 | 21.8 | 3,792.2 | 26.6 | 7,379.8 | 51.7 | 14,283.2 | 11.1 |
| 1994 මාර්තු | 3,068.3 | 17.9 | 3,854.2 | 22.4 | 10,260.0 | 59.7 | 17,182.5 | 12.9 |
| 1994 ජූනි | 3,299.7 | 18.3 | 4,216.0 | 23.4 | 10,514.1 | 58.3 | 18,029.8 | 13.3 |
| 1994 සැප්තැම්බර් | 3,622.2 | 18.6 | 4,429.1 | 22.8 | 11,383.3 | 58.6 | 19,434.6 | 13.6 |
| උ. පරිභෝජන | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 4,205.3 | 64.2 | 1,366.4 | 20.9 | 980.7 | 15.0 | 6,552.4 | 5.1 |
| 1994 මාර්තු | 10,348.5 | 78.7 | 1,391.4 | 10.6 | 1,409.6 | 10.7 | 13,149.5 | 9.9 |
| 1994 ජූනි | 7,587.7 | 67.1 | 1,480.2 | 13.1 | 2,235.0 | 19.8 | 11,302.9 | 8.3 |
| 1994 සැප්තැම්බර් | 7,676.9 | 70.0 | 1,610.7 | 14.7 | 1,677.6 | 15.3 | 10,965.2 | 7.7 |
| ඌ. අනෙකුත් ණය | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 5,816.4 | 50.7 | 3,606.3 | 31.4 | 2,057.7 | 17.9 | 11,480.4 | 9.0 |
| 1994 මාර්තු | 5,751.1 | 50.8 | 3,384.3 | 29.9 | 2,176.9 | 19.2 | 11,312.3 | 8.5 |
| 1994 ජූනි | 7,059.0 | 64.9 | 2,520.9 | 23.2 | 1,292.8 | 11.9 | 10,872.7 | 8.0 |
| 1994 සැප්තැම්බර් | 7,458.8 | 63.2 | 3,062.4 | 25.9 | 1,284.3 | 10.9 | 11,805.5 | 8.3 |
| එ. එකතුව | | | | | | | | |
| 1993 දෙසැම්බර් | 7,9508.9 | 62.0 | 24,997.2 | 19.5 | 23,754.1 | 18.5 | 128,260.2 | 100.0 |
| 1994 මාර්තු | 83,254.4 | 62.4 | 26,039.8 | 19.5 | 24,032.0 | 18.0 | 133,326.2 | 100.0 |
| 1994 ජූනි | 86.173.7 | 63.6 | 26,461.2 | 19.5 | 22,938.4 | 16.9 | 135,573.3 | 100.0 |
| 1994 සැප්තැම්බර් | 89,174.1 | 62.5 | 29,030.4 | 20.4 | 24,442.0 | 17.1 | 142,646.5 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

* අත්තිකාරම්වලට සංසරණයෙහි පවත්නා මුදල් ශීර්ෂයන් හැර ණය, අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත්ය.

** ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර, කැනීම් සහ ධීවර කර්මාන්තය සඳහා දෙන ලද අත්තිකාරම් ඇතුළත් වේ.

1.70 සංඛ්‍යා සටහන

## සුරැකුම් වර්ගය අනුව අත්තිකාරම්* 1993 දෙසැම්බර් - 1994 සැප්තැම්බර්

| ශීර්ෂය | 1993 දෙසැම්බර් 31 | | 1994 මාර්තු 31 | | 1994 ජූනි 30 | | 1994 සැප්තැම්බර් 30 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1. ලේඛන ගත බිල්පත් | 7,584.7 | 5.9 | 6,931.6 | 5.2 | 5,760.0 | 4.2 | 7,830.7 | 5.5 |
| 2. රජයේ සුරැකුම්පත් | 3,662.6 | 2.9 | 5,457.6 | 4.1 | 6,805.0 | 5.0 | 6,426.0 | 4.5 |
| 3. බද්ධ ව්‍යාපාර වස්තු සමාගම්වල කොටස්, බැඳුම්කර ණයකර, ජීවිත රක්ෂණ සහතිකවල මූල්‍ය වටිනාකම් ඇතුළුව අනෙකුත් | 3,650.4 | 2.8 | 3,955.8 | 3.0 | 6,117.9 | 4.5 | 4,634.0 | 3.2 |
| 4. ස්ථාවර, ඉතිරිකිරීම් සහ තැන්පතු සහතික ඇතුළු අනෙකුත් මුදල් තැන්පතු | 14,071.5 | 11.0 | 12,547.7 | 9.4 | 12,017.4 | 8.9 | 13,363.9 | 9.4 |
| 5. වෙළෙඳ තොග | 12,386.7 | 9.7 | 9,050.2 | 6.8 | 11,264.4 | 8.3 | 12,634.0 | 8.9 |
| 6. නිශ්චල දේපල, යන්ත්‍ර උපකරණ | 27,687.7 | 21.6 | 34,370.3 | 25.8 | 33,182.0 | 24.5 | 35,016.6 | 24.5 |
| 7. පොරොන්දු නෝට්ටු සහ පෞද්ගලික ඇපවීම් | 17,829.8 | 13.9 | 19,422.5 | 14.6 | 21,348.3 | 15.7 | 23,405.4 | 16.4 |
| 8. භාර කුවිතාන්සි | 8,442.2 | 6.6 | 7,465.7 | 5.6 | 5,767.4 | 4.3 | 5,484.8 | 3.8 |
| 9. කුලී, පිට ගැනුම් ගිවිසුම් | 1,880.3 | 1.5 | 2,067.9 | 1.6 | 1,808.4 | 1.3 | 1,775.6 | 1.2 |
| 10. ට්‍රැක්ටර් සහ මෝටර් රථ | 2,182.9 | 1.7 | 2,287.2 | 1.7 | 2,220.6 | 1.6 | 2,155.2 | 1.5 |
| 11. අනෙකුත් සුරැකුම්පත් | 22,243.5 | 17.3 | 20,048.1 | 15.0 | 21,207.2 | 15.6 | 18,698.1 | 13.1 |
| 12. සුරැකුම්පත් රහිත | 6,637.9 | 5.2 | 9,721.6 | 7.3 | 8,074.7 | 6.0 | 11,222.2 | 7.9 |
| එකතුව | 128,260.2 | 100.0 | 133,326.2 | 100.0 | 135,573.3 | 100.0 | 142,646.5 | 100.0 |

* පැනුවෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් සහ සහතික මිල යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා ප්‍රදානය කළ අත්තිකාරම් හැර.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1994 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන දොළොස් මාසය පුරා කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ 1993 අදාළ කාලය තුළ දී සියයට 8 කින් (රුපියල් දශලක්ෂ 1,536) පහළ වැටුණු කාර්මික අංශයට දෙන ලද ණය 1994 දී සියයට 14 කින් (රුපියල් දශලක්ෂ 2,343) 1994 දී ඉහළ යාමයි. මෙම අංශයෙ හි නොපියවා පැවති ණය ප්‍රමාණය මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 14 ක මට්ටමෙහි පැවතිණි. කාර්මික අරමුණු සඳහා දෙන ලද ණයවලින් විශාල ප්‍රමාණයක් කෙටිකාලීන ස්වරූපයක් ගත් අතර, එය කාර්මික අංශයෙහි නොපියවා පැවති මුළු ණයවලින් සියයට 70 ක් විය. මේ අතර, කාර්මික අරමුණු සඳහා දෙන ලද නොපියවා පැවති මැදි කාලීන ණයවල ප්‍රමාණය 1993 සැප්තැම්බර් මස අග දී සියයට 15 ක සිට 1994 සැප්තැම්බර් මාසය අවසන් වන විට සියයට 18 දක්වා ඉහළ ගියේය.

නිවාස හා දේපල සංවර්ධනය සඳහා දෙන ලද නොපියවා පැවති ණය ප්‍රමාණය 1994 සැප්තැම්බර් මස අවසාන වන විට මුළු බැංකු ණයවලින් සියයට 14 ක් ව රුපියල් දශලක්ෂ 19,435 ක් විය. එය 1993 දෙන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 38 ක( රුපියල් දශලක්ෂ 5,354) වැඩිවීමකි. නිවාස හා දේපළ සංවර්ධනය සඳහා දෙන ලද ණයවලින් විශාල ප්‍රමාණයක් (සියයට 59) දිගු කාලීන ස්වරූපයක් ගත්තේය.

කෘෂිකාර්මික අංශය මගින් 1994 වර්ෂයේ දි භාවිතයට ගන්නා ලද ණය ප්‍රමාණය 1993 දී සියයට 20 කින් (රුපියල් දශලක්ෂ 2,316) පහළ යාමට ප්‍රතිවිරුද්ධව සියයට 10 කින් (රුපියල් දශලක්ෂ 883) වර්ධනය විය. 1994 සැප්තැම්බර් වන විට කෘෂිකාර්මික ණය ප්‍රමාණය මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 7. ක් විය. මේ අතර, රුපියල් දශලක්ෂ 6,284 ක් වූ මූල්‍ය අංශයට දෙන ලද ණය ප්‍රමාණය 1994 සැප්තැම්බර් වන විට නොපියවා ඇති මුළු ණයවලින් සියයට 4 ක් විය.

පාරිභෝජන ණය සඳහා ඉහළ ඉල්ලුමක් සනිටුහන් කරමින් දිගුකල් පවත්නා පරිභෝජන භාණ්ඩ හා අනෙකුත් පෞද්ගලික අවශ්‍යතා අන්තර්ගත වන පාරිභෝජන අරමුණු සඳහා දෙන ලද ණය පසුගිය වසරෙහි සියයට 33 ක (රුපියල් දශලක්ෂ 1,457) ඉහළ යාම හා සසඳා බලන කළ සියයට 87 කින් (රුපියල් දශලක්ෂ 5,113) ඉහළ ගියේය. 1993 සැප්තැම්බර් අග වන විට නොපියවා පැවති මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 5 ක් වූ මෙම අරමුණු සඳහා දෙන ලද ණය ප්‍රමාණය හා සසඳා බලන විට 1994 සැප්තැම්බර් අග වන විට එය සියයට 8 ක් විය.

1994 සැප්තැම්බර් අග වන විට වාණිජ බැංකු ණය සහ අත්තිකාරම්වලින් සියයට 36 ක ප්‍රමාණයක්, සියයට 21 - 25 ත් අතර පොළී අනුපාතයක් මත දෙනු ලැබිණ. මෙය පසුගිය වසරෙහි මෙම පොළී පරාසය තුළ පැවති නොපියවා පැවති මුළු ණය සහ අත්තිකරම්වලින් සියයට 45 හා සැසඳේ. මේ අතර පසුගිය වසරෙහි දී මෙන්ම මුළු ණය ස අත්තිකාරම්වලින් සියයට 23 ත් සියයට 18.0-20.0 අතර පොළී පරාසය තුළ දෙනු ලැබිණ. සියයට 26-30 අතර පොළී ප්‍රමාණයක් යටතේ වූ ණය සහ අත්තිකාරම්වල ප්‍රමාණය පසුගිය වසරෙහිදී සියයට 17 හා සසඳන කල සියයට 19 ක් විය. අත්තිකාරම්, පුරුකුම් අනුව වර්ගකර බැලීමේ දී නිශ්චල දේපළ, පෞද්ගලික ඇපවීම්, තැන්පතු ගිණුම්, ලේඛණගත බිල්පත් හා වෙළෙඳ තොගවලට එරෙහිව දෙන ලද ණයවල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබිණ.

# මහ බැංකු කටයුතු

## සමස්ත උපනතීන්

මූල්‍ය පදනම (සංචිත මුදල් හෝ අධි බලැති මුදල්) 1993 අග වන විට රුපියල් දශලක්ෂ 56,467 ක සිට 1994 අග වන විට රුපියල් දශලක්ෂ 68,055 දක්වා ඉහළ ගියේය. මහ බැංකුවෙහි විදේශ වත්කම්හි මද වර්ධනයක් පිළිබිඹු කරමින් මූල්‍ය පදනමේ ප්‍රසාරණය 1993 දි පැවති සියයට 25.9 ක සිට 1994 දි සියයට 20.5 දක්වා අඩු විය.

මහ බැංකුවෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිතය සියයට 31.2 ක ඉහළ යාමක් වාර්තා කරමින් 1994 අග වන විට රුපියල් දශලක්ෂ 60,013 ක් විය. මෙයට මූලික වශයෙන් හේතු වූයේ විදේශීය ප්‍රේෂණයන් ඉහළ යාම හා ජාත්‍යන්තර සංචිතය ආයෝජනයෙන් ලද ආදායමයි. මහ බැංකුවෙහි ශුද්ධ දේශීය වත්කම් ප්‍රමාණය 1993 දී රුපියල් දශලක්ෂ 10,742 ක සිට 1994 අග වන විට රුපියල් දශලක්ෂ 8,042 දක්වා තවදුරටත් අඩු විය.

වගකීම් අංශයෙහි සංසරණයෙහි පවත්නා මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,132 කින් (සියයට 19.8) ඉහළ ගිය අතර, වාණිජ බැංකු තැන්පතු, රුපියල් දශලක්ෂ 4,366 (සියයට 21.3) කින් ඉහළ ගියේය.

## වත්කම් හා වගකීම් ව්‍යුහය

1994 අග වන විට රුපියල් දශලක්ෂ 155,958 ක් වූ මහ බැංකුවෙහි මුළු වත්කම් හා වගකීම් ප්‍රමාණය පසුගිය වසරෙහි සියයට 32 ක( රුපියල් දශලක්ෂ 32,380) ඉහළ යාම හා සසඳා බලන විට සියයට 16.7 කින් (රුපියල් දශලක්ෂ 22,324) ඉහළ ගියේය.

වත්කම් අංශයෙහි මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ මහ බැංකුවෙහි විදේශ සංචිතය ප්‍රසාරණය වීමයි. විදේශ මුදල් හා විදේශයන්හි ඇති ශේෂ, විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් හා විශේෂ ගැණුම් හිමිකම් ( වි. ගැ.හි.) වලින් සමන්විත වන විදේශ වත්කම් 1993 අග දී රුපියල් දශලක්ෂ 76,694 ක සිට 1994 අගදී රුපියල් දශලක්ෂ 95,671 දක්වා ඉහළ ගියේය. විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශලක්ෂ 24,374 කින් (සියයට 41.8) වැඩිවී වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 82,648 ක් විය. රුපියල් දශලක්ෂ 13,007 ක් වූ මුදල් හා විදේශයන් හි ඇති ශේෂ රුපියල් දශලක්ෂ 5,394 ක (සියයට 29.3) අඩුවීමක් වාර්තා කරනු ලැබූ අතර, විශේෂ ගැණුම් හිමිකම් රුපියල් දශලක්ෂ 16.5 දක්වා රුපියල් දශලක්ෂ 2.4 කින් (සියයට 12.4) අඩු විය.

රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වාණිජ බැංකුවලට දෙන ලද ණය, රජය හා රජය සහතික කළ සුරැකුම්පත් හා අනෙකුත් වත්කම්වලින් සමන්විත දේශීය වත්කම් 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 3,346 කින් වැඩි විය. වර්ෂයෙහි මුල් එකොළොස් මාසය තුළ දී මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් අළෙවි කිරීම මගින් අඛණ්ඩව විවට වෙළෙඳ පොළ කටයුතුවල නිරතවීම රජය සහ රජය සහතික කළ සුරැකුම්පත් ප්‍රමාණය පහළ යාමට හේතු විය. කෙසේ වෙතත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය දුර්වල වීම නිසා 1994 දෙසැම්බර් මස දී රුපියල් දශලක්ෂ 3,000 ක භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට සිදුවූව ද වෙළෙඳ පොළ ද්‍රවශීලතාවයෙහි කාලීන පහළ යාම නිසා මෙම මාසය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හි පෞද්ගලික අංශයේ ආයෝජන අඩු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුව දරණ රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් හි ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,145 කින් වැඩි වී 1994 අගවන විට රුපියල් දශලක්ෂ 5,099 ක් බවට පත්විය.

මහ බැංකුවෙහි තාවකාලික අත්තිකාරම් ලෙසින් සහ රජයේ සුරැකුම් පත්හි ආයෝජනයන් මගින් මහ බැංකුව විසින් රජයට දෙන ලද ණය රජයෙහි තැන්පතු වලින් අඩු කළ පසු 1994 වර්ෂය තුළ දී රුපියල් දශලක්ෂ 1,998 කින් වැඩි විය. එසේ වුවද ණය දෙන ආයතනවලට දෙන ලද ණය ප්‍රමාණය (දිගුකාලීන, මැදිකාලින හා කෙටිකාලීන) 1993 දී රුපියල් දශලක්ෂ 4,903

සිට 1994 දී රුපියල් දශලක්ෂ 3,376 දක්වා පහළ ගියේය. ප්‍රධාන පහළ යාම වාර්තා කෙරුනේ 1993 දී රුපියල් දශලක්ෂ 753 ක සිට 1994 දී රුපියල් දශලක්ෂ 72 දක්වා පහළ ගිය කෙටි කාලීන ණයවලය. කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ණය නවතා දැමීමත්, මැදි හා දිගුකාලීන ණය අරමුදලෙන් දෙන ණය සීමා කිරීමත් නිසා මහ බැංකු ප්‍රතිමූල්‍ය වැඩපිළිවෙල යටතේ දෙනු ලැබූ මුළු ණය, ණය අවදානම සඳහා කරන ලද වෙන්කිරීම්හි වැඩිවීම වූ රුපියල් දශලක්ෂ 271 අඩුකල පසු1994 දී රුපියල් දශලක්ෂ 1,256 කින් පහළ වැටිණ.

වගකීම් අංශයෙහි නොපියවා පැවති මහ බැංකු සුරැකුම්පත් හි වටිනාකම විවට වෙළෙඳපොළ කටයුතු නිසා 1993 දී රුපියල් දශලක්ෂ 2,155 ක සිට 1994 දී රුපියල් දශලක්ෂ 3,740 දක්වා (සියයට 73.0) ඉහළ ගියේය. විදේශීය ආයතනයන්හි හා විදේශ රාජ්‍යයන් හි හා විදේශීය බැංකු ආයතනයන් හි තැන්පතු වගකීම් 1993 දී රුපියල් දශලක්ෂ 30,969 ක සිට 1994 දි රුපියල් දශලක්ෂ 35,658 දක්වා (සියයට 15) ඉහළ ගියේය. මෙයට ප්‍රධාන හේතුව වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තීව්‍ර කරන ලද ව්‍යුහාත්මක ගැළපුම් පහසුකම් (ESAF) යටතේ ණය පහසුකම් මුදහැරීමත් මහ බැංකුවෙහි ඇති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිණුම් ප්‍රති ඇගයීමත් නිසා වගකීම් ප්‍රමාණය ඉහළ යාමයි. මේ අතර දේශීය වගකීම් රුපියල් දශලක්ෂ 17,634 කින් වැඩි විය. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයන් සඳහා මහ බැංකුවෙහි ඇති වාණිජ බැංකු ගිණුම් සියයට 21 කින් (රුපියල් දශලක්ෂ 4,366) හා සංසරණයෙහි පවත්නා මුදල් රුපියල් දශලක්ෂ 7,132 කින් (සියයට 19.8) 1994 වර්ෂය තුළ දී ඉහළ ගියේය. අනෙකුත් වගකීම් 1993 අග දී රුපියල් දශලක්ෂ 40,399 ක සිට 1994 අග වන විට රුපියල් දශලක්ෂ 43,885 දක්වා ඉහළ ගියේය.

## මූල්‍ය ප්‍රතිපත්තිය

සමස්ත මූල්‍ය අගයන් හි පැවති අඛණ්ඩ ඉහළ වර්ධනය හේතුවෙන් 1994 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවට දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සිදු වූ නමුත් මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් අඩුවීම නිසා දැඩි ලෙස විවට වෙළෙඳපොළ කටයුතුවල යෙදීමේ හැකියාව සීමා විය. මේ අනුව අධි ද්‍රවශීලතාවය ඉවත් කිරීම සඳහා මහ බැංකු සුරැකුම්පත් වෙළෙඳපොළට නිකුත් කරනු ලැබිණ. සංචිත මුදල් හි ප්‍රසාරණය සීමා කිරීම සඳහා බැංකුව තම කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් නවතා දැමූ අතර, අර්බුදයන්ට මුහුණ දුන් මූල්‍ය සමාගම්වලට හැරුණ විට මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ නව මූල්‍ය පහසුකම් සැපයීමෙන් ද වැළකිණ. මීට අමතරව ණය ප්‍රසාරණය අඩු කිරීම සඳහා තැන්පතු වගකීම් සඳහා 1993 අගෝස්තු මස දී පනවනු ලැබූ සියයට 15 ක ඉහළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය(ව්‍ය.ස.අ.) 1994 වර්ෂය පුරාම පවත්වා ගණු ලැබිණ.

භාණ්ඩාගාර බිල්පත් මගින් විවට වෙළෙඳපොළ කටයුතුවල නිරතවීමට ඇති ඉඩ ප්‍රස්ථා සීමා කෙරෙන වාතාවරණයක් තුළ අධි ද්‍රවශීලතාවය ඉවත් කිරීම සඳහා මහ බැංකුව මාස 3-6 කල්පිරීමකින් යුත් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මහ බැංකු සුරැකුම්පත්වල ප්‍රමාණය 1993 අග දී රුපියල් දශලක්ෂ 2,155 ක සිට 1994 අග වන විට රුපියල් දශලක්ෂ 3,740 දක්වා ඉහළ ගියේය. මහ බැංකු සුරැකුම්පත්වල සාමාන්‍ය ඵලදායිතාවය සියයට 12.06-18.37 දක්වා වූ පොළී පරාසයක් තුළ පැවතිණි.

අඛණ්ඩව කරගෙන යනු ලැබූ විවට වෙළෙඳපොළ කටයුතු නිසා මහ බැංකුවට තම භාණ්ඩාගාර බිල්පත් දැරීමේ ප්‍රමාණය 1993 අග දී රුපියල් දශලක්ෂ 3,949 ක සිට 1994 සැප්තැම්බර් අග වන විට රුපියල් දශලක්ෂ 31 දක්වා අඩු කර ගැනීමට හැකි විය. කෙසේ වෙතත් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය දුර්වලවීම නිසා මහ බැංකුවෙහි භාණ්ඩාගාර බිල්පත් දැරීමේ ප්‍රමාණය 1994 දෙසැම්බර් මස දි රුපියල් දශලක්ෂ 5,093 දක්වා වැඩි විය.

සංචිත මුදල් හි ප්‍රසාරණය තවදුරටත් සීමා කිරීමේ පියවරක් ලෙස මහ බැංකුව සිය කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් නවතා දමනු ලැබිණ. මෙහි දී මහ බැංකුව නව සපිරි ග්‍රාමීය ණය වැඩපිළිවෙල හා අපනයන ණය ප්‍රතිමූල්‍ය වැඩපිළිවෙල යටතේ දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය ණය නවතා දමනු ලැබූ අතර, මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ නව ණය පහසුකම් ප්‍රදානය ද සීමා කරනු ලැබිණ.

නව සපිරි ග්‍රාමීය ණය වැඩපිළිවෙල යටතේ දෙනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකම් 1994 මාර්තු 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවනු ලැබිණ. එසේ වුව ද න. ස. ග්‍රා. ණය වැඩපිළිවෙල යටතේ සපයනු ලබන කෘෂිකාර්මික ණය සඳහා න. ස. ග්‍රා. ණය වැඩපිළිවෙලට සම්බන්ධ වන මූල්‍ය ආයතනයන්ට රජය මගින් පොළී සහනාධාරයක් ලබාදීමට වැඩපිළිවෙලක් සකස් කරනු ලැබිණ. වාණිජ බැංකු මගින් සපයනු ලැබූ පෙර නැව්ගත කිරීමේ ණය සඳහා සපයන ලද අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් 1994 මැයි 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නවතා දමනු ලැබිණ. මෙම වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙසින් මහ බැංකුව මගින් සපයනු ලබන කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් 1993 දෙසැම්බර් මස දී රුපියල් දශලක්ෂ 753 ක සිට 1994 දෙසැම්බර් මස දී රුපියල් දශලක්ෂ 72 දක්වා පහත වැටිණ.

අර්බුදවලට ලක් වූ මූල්‍ය සමාගම් මගින් ප්‍රතිමූල්‍ය සඳහා කරනු ලබන ඉල්ලීම්වලට ඉඩ සලසා දෙනු ලැබුව ද මහ බැංකුව මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ නව මූල්‍ය පහසුකම් ප්‍රදානයෙන් වැළකිණ. එසේ වුව ද, සපයනු ලබන ණය ප්‍රමාණය සීමා කරනු ලැබිණ. 1994 වර්ෂයේ දී මේ සඳහා රුපියල් දශලක්ෂ 263 ක මුදලක් ප්‍රදානය කරනු ලැබූ අතර, රුපියල් දශලක්ෂ 4 ක ප්‍රමාණයක් ආපසු අයකර ගනු ලැබිණ. මෙහි ප්‍රතිඵලයක් ලෙස මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ විපතට පත් මූල්‍ය සමාගම්වලට ප්‍රදානය කළ නොපියවා පැවති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය 1993 අග දී රුපියල් දශලක්ෂ 2,045 ක සිට 1994 අග වන විට රුපියල් දශලක්ෂ 2,304 දක්වා ඉහළ ගියේය. මෙම ක්‍රියාමාර්ගයන් මගින් කෙටිකාලීන, මැදි හා දිගුකාලීන පහසුකම් යටතේ ප්‍රදානය කරන ලද නොපියවා ඇති ප්‍රතිමූල්‍ය ප්‍රමාණය ණය අවදානම සඳහා කරනලද වෙන්කිරීම්හි වැඩිවීම වූ රුපියල් දශලක්ෂ 271 අඩුකළ පසු 1993 දෙසැම්බර් අග දී පැවති රුපියල් දශලක්ෂ 4,903 ක සිට 1994 අග දී රුපියල් දශලක්ෂ 3,376 දක්වා රුපියල් දශලක්ෂ 1,256 කින් පහළ යාමයි.

දේශීය ණය ප්‍රසාරණය සීමා කිරීම සඳහා මහ බැංකුව වාණිජ බැංකු තැන්පතු වගකීම් සඳහා සියයට 15 ක ඉහළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයක් පවත්වාගනු ලැබිණ. එසේ වුව ද, වාණිජ බැංකුවල විදේශ සංචිතය පුළුල් කර ගැනීමට බැංකු දිරිමත් කිරීම සඳහා හා එමගින් සංචිත මුදල් මත ඇති කරන බලපෑම අඩු කිරීම සඳහා විදේශයන් හි ඇති විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 1994 පෙබරවාරි 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 5 දක්වා අඩු කරනු ලැබිණ. ඉහළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයක් පවත්වා ගැනීම නිසා මූල්‍ය ගුණකය 1993 දෙසැම්බර් මස දී පැවති 2.86 ක සිට 1994 දෙසැම්බර් මසදී 2.84 දක්වා පහළ යාමට හේතු විය.

# පොළී අනුපාතිකයන්

## සමස්ත උපනතීන්

වර්ෂය තුළ දී කෙටිකාලීන පොළී අනුපාතිකයන් පුළුල් පරාසයක් තුළ උච්චාවචනය විය. ආර්ථිකයේ අධිද්‍රවශීල තත්ත්වයක් පැවතීමත් මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් අඩුවීමත් නිසා 1994 මුල් මාස දෙක තුළ දී කෙටිකාලීන පොළී අනුපාතිකයන් හි තියුණු පහළ යාමකට හේතුවිය. ඉන්පසු භාණ්ඩාගාර බිල්පත් හා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම මගින් අධි ද්‍රවශීලතා තත්වය මඟහැරීම නිසා 1994 මැයි මාසය දක්වා කෙටිකාලීන පොළී අනුපාතික ඉහළ ගියේය. මෙයින් පසු විදේශ ප්‍රාග්ධනය ගලා ඒම තුළින් මතු කෙරුන අධි ද්‍රවශීලතා තත්ත්වය හේතුකොටගෙන නැවතත් කෙටිකාලීන පොළී අනුපාතිකයන් ඔක්තෝම්බර් මාසය දක්වා පහළයාමේ නැඹුරුවක් ඉස්මතු විය. විදේශ ප්‍රාග්ධන ලැබීම් හි පහළ යාමත් රාජ්‍ය ණය ගැනීම් ඉහළ යාමත් වර්ෂයේ අවසාන මාස දෙක තුළ දී කෙටිකාලීන පොළී අනුපාතිකයන් තියුණු ලෙස ඉහළ යාමට තුඩු දුන්නේය. එසේ වුව ද මැදි හා දිගුකාලීන පොළී අනුපාතිකයන් 1993 දී පැවති පොළී අනුපාතිකයන්ට වඩා පහළ මට්ටමක පැවතිණ.

## කෙටිකාලීන පොළී අනුපාතිකයන්

විදේශ සම්පත් ගලා ඒමේ සැලකියයුතු විචලනයත් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අඩුවීමත් 1994 වර්ෂය තුළ දී පොළී අනුපාතිකයන් හි සැලකියුතු උච්චාවචනයකට තුඩු දෙනු ලැබිණ.

දේශිය මුදල් වෙළෙඳපොලෙහි සැලකිය යුතු ද්‍රවශීලතා තත්වයක් ඇති කරමින් 1993 වසර තුළ දී අත් දකිනු ලැබූ විදේශීය ප්‍රාග්ධනය විශාල ලෙස ගලා ඒම 1994 මුල් භාගය තුළ දී ද අඛණ්ඩව පැවතිණ. මහ බැංකුව වෙතැති සීමිත භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය නිසා අධි ද්‍රවශීලතාවය ඉවත් කිරීම සඳහා මහ බැංකුවට විවට වෙළෙඳපොළ කටයුතුවල නිරතවීමට ඇති ඉඩකඩ දැඩි ලෙස සීමා විය. මේ අනුව 1994 පෙබරවාරි අග වන විට ශුද්ධ වශයෙන් රුපියල් දශලක්ෂ 635ක් වටිනා මහ බැංකු සුරකුම්පත් නිකුතුවත් මහබැංකුව විසින් දරනු ලබන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 3,908 කින් පහල යාමත් සිදු වුවද වෙළෙඳ පොළෙහි අධි ද්‍රවශීලතා තත්වය භාණ්ඩාගාර බිල්පත් වල සාමාන්‍ය ඵලදයිතාවය පහළයාමට හේතුවිය. මේ අනුව ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්වල සාමාන්‍ය ඵලද අනුපාතිකය වර්ෂය ආරම්භයේ දී පැවති සියයට 18.09 ක සිට 1994 පෙබරවාරි අග වන විට සියයට 14.43 දක්වා ද හය මාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය සියයට 18.47 සිට 14.88 දක්වා ද දොළොස් මාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය සියයට 19.38 සිට 15.63 දක්වා ද පහත වැටුණි. මාස දෙකක පමණ කාලයක් තුළ දි සිදු වූ මෙම පහළයාම මගින් භාණ්ඩාගාර බිල්පත්වල සාමාන්‍ය ඵලද අනුපාතිතය ප්‍රතිශතාංක සියයට 3.7 කින් පමණ පහළ යාම තුළින් පෙන්නුම් කරනු ලැබිණ.


පොළී අනුපාතිකයන් හි මෙම පහළ වැටීම මාර්තු මැද දක්වා ම පැවතිණ. කෙසේ වුව ද, 1994 මාර්තු මාසයේ දි රුපියල් දශලක්ෂ 1,400 ක් වටිනා නව භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සහ රුපියල් දශලක්ෂ 686 ක් වටිනා මහ බැංකු සුරැකුම්පත් නිකුතුව මෙම පහළ යෑමේ නැමියාව වැළැක්වීමට හේතුවිය. අප්‍රියෙල් සහ මැයි මාසවල දී තවදුරටත් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ මහ බැංකු සුරැකුම්පත් නිසා පොළී අනුපාතිකයන් ඉහළ යෑමේ නැමියාවකට නැඹුරු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජූනි මස අවසානයේ දී ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්හි සාමාන්‍ය ඵලද අනුපාතිකය සියයට 15.39 කින් ද, පිළිවෙලින් භාණ්ඩාගාර බිල්පත් හි හයමාසික සහ දොළොස් මාසික සාමාන්‍ය ඵලද අනුපාතිකයන් සියයට 15.62 සහ 15.87 වශයෙන් ද ඉහළ නැගිණ.

ජූලි මාසය තුළ දී දක්නට ලැබුණ අධි ද්‍රවශීලතා තත්ත්වය ඉන්පසුව එළඹි මාසවල දී පොළී අනුපාතිකයන්හි පහළ යාමට මූලික විය. මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය පහළ යාමත්, කල්පිරෙන කෙටිකාලීන මහබැංකු සුරැකුම්පත් සඳහා නැවත සුරැකුම්පත් නිකුත් නොකිරීමත් හේතුවෙන්, 1994 ඔක්තෝම්බර් මාසයේ දී ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් ඵලදව සියයට 11.58 කින් සහ දොළොස් මාසික බිල්පත් අනුපාතය සියයට 12.20 කින් පහත වැටිණි.

විදේශ ප්‍රාග්ධන ගාලාඒම් හි පහළ යාමත්, සිය මූල්‍ය අවශ්‍යතාවයන් පියවා ගැනීම සඳහා 1994 දෙසැම්බර් මස දී රුපියල් දශලක්ෂ 3,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් සඳහා රජයෙන් ඇති වූ ඉල්ලුමත් අවසාන මස දෙක තුළ දී මෙම නැමියාව මුළුමනින් ම වෙනස් කිරීමට හේතුවිය. මූල්‍ය සමස්තයන් හි අධි වර්ධන අනුපාතය අඩු කිරීම සඳහා මහ බැංකුවට රුපියල් දශලක්ෂ 2,510 ක් වටිනා මහබැංකු සුරැකුම්පත් නිකුත් කිරීම මගින් විවට වෙළෙඳපොළ කටයුතු ශක්තිමත් කිරීමට සිදුවිය. මෙම සාධකයන් හේතුවෙන් 1994 දෙසැම්බර් මස දී පොළී අනුපාතිකයන් තියුණු ලෙස වැඩි විය. දෙසැම්බර් මස අග වන විට ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්වල ඵලද අනුපාතිකය 18.73 දක්වා ඉහළ ගිය අතර, හය මාසික හා දොළොස් මාසික භාණ්ඩාගාර බිල්පත්හි ඵලද අනුපාතිකය පිළිවෙලින් සියයට 19.29 හා 19.43 දක්වා ඉහළ ගියේය. මේ අනුව ඔක්තෝම්බර් අවසානයේ සිට දෙසැම්බර් අවසානය දක්වා වූ මාස දෙකක කාලය තුළ දී පොළී අනුපාතික සියයට 7.15 - 7.58 දක්වා වැඩි විය. කෙසේ වුව ද භාණ්ඩාගාර බිල්පත්හි ඵලද අනුපාතිකයන් තියුණු ලෙස ඉහළ ගිය ද සංචිත මුදල් ප්‍රසාරණයකට තුඩු දෙමින් මහ බැංකුව

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

වෙනැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය ඔක්තෝම්බර් අග දී රුපියල් දශලක්ෂ 1,433 ක සිට දෙසැම්බර් අග වනවිට රුපියල් දශලක්ෂ 5,093 දක්වා ඉහළ ගියේය. 1994 භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ බොහෝ අවස්ථාවල දී ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දි අධිද්‍රයකත්වයක් තිබීමයි.

මේ අතර අන්තර් බැංකු ඒක්ෂන මුදල් වෙළෙඳපොළෙහි අධි විචලනයන් වැලැක්වීම සඳහා 1943 ඔක්තෝම්බර් මස මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ ප්‍රති මිළදි ගැනීමේ වෙළෙපොළ පොදුවේ පොළී අනුපාතයන් හි විශාල ලෙස පහළයාම් වළක්වා දීමට සමත් විය. කෙසේ වෙතත් බොහොවිට මහ බැංකුව වෙනැති බිල්පත් ප්‍රමාණය අවසන් වූ කල්හි ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතයන් හි සැලකියයුතු පහළ වැටීම් දැකිය හැකි විය. 1993 දෙසැම්බර් අග දී සියයට 16.50 - 18.50 අතර පොළී පරාසයක් තුළ පැවති ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතයන් පහත වැටුණා පමණක් නොව මාර්තු අග වන විට සියයට 5.00 - 15.00 අතර පුළුල් පරාසයක් තුළ පැවතිණ. මහ බැංකුවෙහි එක් දින ප්‍රති මිළදී ගැනීමේ පොළී අනුපාතිකයන් 1993 අග දී සියයට 16.5 සිට මාර්තු අග භාගයේ දී සියයට 12 දක්වා ක්‍රමයෙන් පහත වැටිණ. මෙම පොළී අනුපාතය වෙළෙඳපොළෙහි තත්ත්වයන්ට අනුරූපව යමින් සැප්තැම්බර් මැද භාගය දක්වා සුළු විචලනයක් සහිතව එම මට්ටමෙහි ම පවත්වා ගනු ලැබිණ. මේ වන විට ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොළී අනුපාතිකයන් ඉතා පහළ මට්ටමක පැවති බැවින් ඒ අනුව යමින් එක් දින ප්‍රති මිළ දී ගැනීමේ අනුපාතිකයන් ඔක්තෝම්බර් මැද භාගය වන විට සියයට 7.00 දක්වා පියවර ගණනකින් පහළ වැටිණ. සැප්තැම්බර් මැද භාගය වන විට සියයට 04.00 - 08.00 පොළි පරාසයක් තුළ පැවති ඒක්ෂණ මුදල් වෙළෙපොළ පොළී අනුපාතිකයන් ඔක්තෝම්බර් අග වන විට සියයට 12.25 - 13.50 ක පොළි පරාසයක් කරා ක්‍රමයෙන් ඉහළ ගියේය. වසරෙහි අවසාන මාස දෙක තුළ දි පැවති අඩු ද්‍රවශීලති තත්ත්වය ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොළී අනුපාතිකයන් නොවැම්බර් මස දී සියයට 13.00 - 17.00 දක්වා ද දෙසැම්බර් මස දි සියයට 20.00 - 23.00 දක්වා ද ඉහළයාම මගින් පිළිබිඹු කෙරේණ. මහ බැංකුවෙහි එක් දින ප්‍රති මිළදී ගැනීමේ අනුපාතිකයන් ද නොවැම්බර් මස දී සියයට 13.75 දක්වා ද, දෙසැම්බර් මස අග දී සියයට 20.00 දක්වා ද ඉහළ යනු ලැබිණ.

වෙළෙඳපොළ ප්‍රවනතාවයට අනුකූලව මහබැංකු සුරැකුම්පත්වල ඵලද අනුපාතිකයන් ද විචලනය විය. ජනවාරි මාසය තුළ දී හය මාසික සුරැකුම්පත්හි ඵලද අනුපාතිකය සියයට 18.37 ක් විය. මෙය මැයි මාසයේ දි සියයට 14.79 දක්වා ක්‍රමයෙන් අඩු විය. ත්‍රෛමාසික සුරැකුම්පත් පමණක් නිකුත් කළ වසරේ අවසාන මාස කීපයේ දී පොළී අනුපාතිකයන් ඔක්තෝම්බර් මාසය මුල දී සියයට 13.00 සිට නොවැම්බර් අග දී 14.70 දක්වා ඉහළ ගියේය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ඉතියකිරීමේ තැන්පතු සඳහා පිරිනමනු ලබන පොළී අනුපාතිකයන් වසර පුරාම සියයට 14.00 ක් වශයෙන් පැවතුණි. සියයට 16-17 ත් අතර පොළී පරාසයක් තුළ පැවති ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොළී අනුපාතිකයන් දෙසැම්බර් මස දි සියයට 14.00 දක්වා පහළ දමන තෙක් එම මට්ටමෙහි ම නොවෙනස්ව පවත්වාගනු ලැබිණ. 1993 අග වන විට පහළ යමින් තිබූ වාණිජ බැංකු පොළී අනුපාතිකයන් 1994 වසර තුළ දී ද නොකඩවා පහත වැටිණ. වාණිජ බැංකුවල කාලීන තැන්පතු පොළී අනුපාතිකයන් 1993 අගදී පැවති සියයට 10.00-19.00 ක පොළී අනුපාතිකය හා සසඳා බලන කල 1994 අග වන විට සියයට 8.00-18.25ත් අතර පොළී පරාසයක් තුළ විචලනය වූ අතර ඉතිරි කිරීමේ තැන්පතු අනුපාතිකයන් 1993 අග දී සියයට 6.00-15.00 පොළී පරාසය හා සසඳා බලන කළ සියයට 5.5-13.0 අතර වූ පොළී පරාසයක් තුළ පැවතිණ. පොළී අනුපාතිකයන්හි ඇති වූ මෙම වෙනස්කම් පිළිබිඹු කරමින් හරිත සාමාන්‍ය තැන්පතු පොළී අනුපාතිකය 1993 දෙසැම්බර් මස දි සියයට 13.6 ක සිට 1994 දෙසැම්බර් මස දී සියයට 12.6 දක්වා පහත වැටිණ. වාණිජ බැංකුවල හරිත සාමාන්‍ය ප්‍රමුඛ ණයදීමේ අනුපාතිකය ද 1993 අග දී සියයට 20.4 ක සිට 1994 ඔක්තෝම්බර් අග වන විට සියයට 16.9 දක්වා පහළ ගිය ද වසර අග වනවිට භාණ්ඩාගාර බිල්පත්වල ඵලද අනුපාත වල වෙනස් වීම්වලට අනුරූපව සියයට 17.8 දක්වා ඉහළ ගියේයි.

## දිගුකාලීන පොලී අනුපාතිකයන්

සමස්ත වශයෙන් කෙටිකාලීන පොලී අනුපාතිකයන් හී පැවති පහළ යාමේ ප්‍රවනතාවයට අනුව යමින් 1994 වසර තුළ දි දිගුකාලීන පොලී අනුපාතිකයන් සාමාන්‍යයෙන් 1993 වසරට වඩා පහළ මට්ටමක පැවතිණ. අවුරුදු 3-5 දක්වා කාලයකින් කල්පිරෙන රාජ්‍ය සුරැකුම්පත් හී පොලී අනුපාතිකයන් 1993 පැවති සියයට 16.0-17.00 පොළී පරාසය හා සසඳා බලන කල සියයට 14.0-16.0 දක්වා වූ පොලී පරාසයක් තුළ පැවතුණි. 1994 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් නිකුතුන් 21 ක් සිදු කරනු ලැබිණ. අවුරුදු 6 හා 7 කාලයකින් කල්පිරෙන වඩාත් දිගුකාලීන රුපියල් සුරැකුම්පත් හී පොළී අනුපාතිකය සියයට 14.0-15.75 අතර පොළී පරාසයක් තුළ විචලනය විය. ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ දී අවුරුදු හතරකින් කල්පිරෙන සුරැකුම්පත් හි පොලී අනුපාතිකය සියයට 15 ක මට්ටමෙහි විචලනය වූ අතර අවුරුදු 5 හා 6 ක කල්පිරීමකින් යුතු සුරැකුම්පත් සියයට 14 ක හා 14.75 ක පොළී අනුපාතිකයක් මත නිකුත් කරනු ලැබිණ. වසරෙහි අග භාගයේදී සිව් වාර්ෂික සුරැකුම්පත් හි පොළී අනුපාතිකය සියයට 14 ක මට්ටමෙහි පැවතියේය. සය වාර්ෂික සුරැකුම්පත් හී පොළී අනුපාතිකය 1994 ජුනි මස පැවති සියයට 15.75 ක පොළී අනුපාතිකයට වෙනස්ව යමින් 1994 ඔක්තෝම්බර් මස දී සියයට 14.5 ක පහළ පොළී අනුපාතිකය ට නිකුත් කරන ලදි.

මේ අතර සමහර පොළී අනුපාතික එම මට්ටමෙහි ම නොවෙනස්ව පැවතිය ද දිගුකාලීන ණය දෙන ආයතනයන් හි පොළී අනුපාතිකයන් සියයට 1-2 ප්‍රමානයකින් පහත වැටිණ. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවෙහි ණය දීමේ පොළී අනුපාතිකය සියයට 18-24 ක පොළී පරාසයක සිට 18-22 ක පොලි පරාසයක් කරා සුළු වශයෙන් පහළ ගියේය. නිවාස ඉදිකිරීම් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව ණය දෙන පොළී අනුපාතිකය සියයට 19-22 ක සිට 18-21 දක්වා සියයට 1 කින් පහළ ගිය අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි අඩු ආදයම් ලබන්නන්ට නිවාස සහතික කිරීමේ වැඩපිළිවෙල යටතේ ණය දෙන පොළී අනුපාතිකය සියයට 20.5 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතිණ. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ණය මුදලෙහි ප්‍රමාණය මත පදනම්ව පොළී අනුපාතයන් අය කළ අතර එහි පොළී අනුපාතිකයන් සියයට 20.5-22.0 අතර පොළි පරාසයක් තුල පවත්වා ගනු ලැබිණ.වාණිජ බැංකුවල සාමාන්‍ය හරිත තැන්පතු අනුපාතිකය මත පදනම්ව තීරණය කරනු ලබන සුළු හා මධ්‍යම පරිමාන කර්මාන්ත (සු. ම. ක. IV) වැඩපිළිවෙල යටතේ දෙනු ලබන ප්‍රතිමූල්‍ය පොළී අනුපාතිකය 1993 අග දී සියයට 13.7 ක සිට 1994 අවසන් වන විට සියයට 13.6 දක්වා පහත වැටිණ.

## බැංකු සංවර්ධනය

### බැංකු ශාඛා ව්‍යාප්තිය

1994 වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ මුළු වාණිජ බැංකු සංඛ්‍යාව 23 ක් ලෙසින් නොවෙනස්ව පැවතිය ද එහි ශාඛා පද්ධතිය අඛණ්ඩව පුළුල් විය. වර්ෂය තුළ දී දේශීය වාණිජ බැංකු, නව ශාඛා 27 ක් විවෘත කරනු ලැබූ අතර විදේශීය බැංකු, නව ප්‍රධාන ශාඛා දෙකක් සහ උප කාර්යාලයක් පිහිටවනු ලැබීය. මේ අනුව මුළු වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව 1993 වර්ෂයේ දී 845 සිට 1994 වර්ෂයේ දී 875 දක්වා පුළුල් විය. මුළු ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව ද 17 ක් ලෙසින් නොවෙනස්ව පැවතිය ද ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා පද්ධතිය 1993 වර්ෂයේදී 163 සිට 1994 වර්ෂයේ දී 169 ක් දක්වා පුළුල් විය. මේ අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය ශාඛා පද්ධතිය පසුගිය වර්ෂය අවසානයේ දී 85 සිට 1994 වර්ෂය අවසානයේ දී 90 ක් දක්වා වැඩි කරනු ලැබිණ. මෙම වෙනස්වීම් සමඟ මුළු බැංකු ශාඛා සංඛ්‍යාව, 1993 වර්ෂයේ දී 1,093 සිට 1994 වර්ෂයේදී 1,134 ක් දක්වා වැඩි විය. ඒ අනුව බැංකු ඝනත්වය එනම් ජනගහනයෙන් සෑම 10,000 කට ඇති බැංකු ශාඛා සංඛ්‍යාව 1993 වර්ෂයේ දී පැවති 0.6210 සිට 1994 වර්ෂයේ දී 0.6349 දක්වා ඉහළ නැගුණි.

වර්ෂය තුළදී මහජන බැංකුව සිය මුළු ශාඛා සංඛ්‍යාව 323 දක්වා පුළුල් කරමින් කුරුණෑගල, නුගේගොඩ සහ ගල්කිස්ස යන ස්ථානයන්හි නව ශාඛා 3 ක් විවෘත කරනු ලැබූ

## 1.71 සංඛ්‍යා සටහන
## බැංකු ශාඛා ව්‍යාප්තිය 1992 - 1994

| වර්ගීකරණය | 1992 | 1993 | 1994 |
|---|---|---|---|
| 1. ආයතන සංඛ්‍යාව | 39 | 40 | 40 |
| 1.1 වාණිජ බැංකු සංඛ්‍යාව | 23 | 23 | 23 |
| 1.1.1 දේශීය බැංකු සංඛ්‍යාව | 6 | 6 | 6 |
| 1.1.2 විදේශීය බැංකු සංඛ්‍යාව | 17 | 17 | 17 |
| 1.2 ප්‍රා. ග්‍රා. සං. බැ. සංඛ්‍යාව (අ) | 16 | 17 | 17 |
| 2. ශාඛා සංඛ්‍යාව (ආ) | 1,051 | 1,093 | 1,134 |
| 2.1 වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව | 811 | 845 | 875 |
| 2.1.1 දේශීය බැංකු ශාඛා සංඛ්‍යාව (ඇ) | 782 | 812 | 839 |
| 2.1.1.1 කෘ.සේ.ම. ශාඛා සංඛ්‍යාව | 34 | 29 | 27 |
| 2.1.1.2. විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව | 29 | 33 | 36 |
| 2.2 ප්‍රා.ග්‍රා.සං.බැ. ශාඛා සංඛ්‍යාව | 156 | 163 | 169 |
| 2.3 ජා. ඉ. බැ. ශාඛා සංඛාව | 84 | 85 | 90 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1985 අංක 15 දරණ ප්‍රා. ග්‍රා. සං. බැ. පනත යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවන ලදී.

(ආ) ප්‍රධාන කාර්යාලද ඇතුළත්ය.

(ඇ) ව්‍යාප්ති කායසාිල, කච්චේරි ශාඛා, ගෙවීම් කායසාිල කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා සහ විදේශීය ශාඛා ඇතුළත් වේ.

අතර ත්‍රිකුණාමල වරාය තුළ පිහිටි සිය ශාඛාව වසා දමමින් කරතිව් ශාඛාව නැවත විවෘත කරන ලදි. ලංකා බැංකුව, සිය අග නගර ශාඛාව මගින් මෙතෙක් පවත්වාගෙන යනු ලැබූ රජයේ ගිණුම් පවත්වාගෙන යාම සඳහා කොළඹ යෝර්ක් විදියේ "තැප්‍රොබේන්" ශාඛාව නමින් නව ශාඛාවක් විවෘත කරනු ලැබීය. මේ අතර වාරියපොළ සහ පදවි-පරාක්‍රමපුර ක්‍රියාත්මක වූ සිය කෘෂි සේවා මධ්‍යස්ථාන අධි ශ්‍රේණිගත කිරීමත් සමඟ මුළු ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 259 සිට 1994 වර්ෂය අවසානය වන 262 දක්වා වැඩිවිය. මීට අමතරව ලංකා බැංකුව, කොළඹ 2, සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානයේ, මොරටුව විශ්ව විද්‍යාලයේ සහ ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්යාල 3 ක් පිහිටුවනු ලැබීය. පොළොන්නරුව කච්චේරි ශාඛාව නව නගර ශාඛාව සමග ඒකාබද්ධ කරනු ලැබිය. මෙම වෙනස්වීම් සමඟ 1994 දෙසැම්බර් මස අවසානය වනවිට ලංකා බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව 337 දක්වා පුළුල් විය.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව සිය ශාඛා පද්ධතිය 54 දක්වා වැඩිකරමින් වර්ෂය තුළ දී මොණරාගල, කිරිබත්ගොඩ, සහ කොළඹ 8 ඩී. එස්. සේනානායක මාවතෙහි නව ශාඛා 3 ක් විවෘත කරන ලැබීය. සීමාසහිත ලංකා වාණිජ බැංකුව සිය මුළු ශාඛා සංඛ්‍යාව 34 ක් දක්වා වැඩිකරමින් මිනුවන්ගොඩ, පානදුර සහ කොළඹ 11, කෙයිසර් විදිය යන ස්ථානයන්හි ශාඛා තුනක් විවෘත කරනු ලැබීය. සීමාසහිත සම්පත් බැංකුව සිය මුළු ශාඛා පද්ධතියට නව ශාඛා 3 ක් එක් කර ගත් අතර සීමාසහිත සෙලාන් බැංකුව, වැලිමඩ, කොච්චිකඩේ, පිටකොටුව, බෙලිඅත්ත, මාළඹේ, මතුගම, වරකාපොළ සහ දකුණු කොළඹ යන ස්ථානයන්හි නව ශාඛා 8 ක් විවෘත කරමින් සිය ශාඛා පද්ධතිය සැලකිය යුතු අන්දමින් පුළුල් කරනු ලැබීය. මේ අතර සීමාසහිත සෙලාන් බැංකුව රද්දොළුගම, ගනේමුල්ල, වැලිවේරිය. කොටගල සහ බගවන්තලාව යන ස්ථානයන්හි ක්‍රියාත්මක වූ ශාඛා කාර්යාල 5 අධිශ්‍රේණිගත කරනු ලැබීය.

හොංකොං සහ ෂැංහයි බැංකුව, බොරැල්ලෙහි උප ශාඛාවක් පිහිටවනු ලැබිය. වර්ෂය තුළ දී ඒ. එන්. ඉසෙඩ් ග්‍රින්ලේස් බැංකුව මහනුවර නව ශාඛාවක් පිහිටුවනු ලැබූ අතර සීමාසහිත හබීබ් ඒ. ජී. සූරිච් බැංකුව සිය කොල්ලුපිටියේ මුදල් හුවමාරු ඒකකය ප්‍රධාන ශාඛාවක් බවට අධිශ්‍රේණිගත කරනු ලැබීය.

බදුල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව, මීගහකිවුල, ලුනුගල, හල්දුම්මුල්ල සහ ගිරාඳුරුකෝට්ටේ යන ස්ථානයන්හි නව ශාඛා 4 ක් විවෘත කරනු ලැබූ අතර ගම්පහ සහ කෑගල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිළිවෙලින් මීනුවන්ගොඩ සහ යටියන්තොට ශාඛා පිහිටවනු ලැබීය. ඒ අනුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා පද්ධතිය (ප්‍රධාන ශාඛා ඇතුළුව) 1993 වර්ෂය අවසානයේ දී 163 සිට 1994 වර්ෂය අවසානයේ දී 169 දක්වා වැඩිවිය. විමසුමට ලක් වන කාලය තුළ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය මුළු ශාඛා සංඛ්‍යාව 90 දක්වා වැඩිකරමින් කඹුරුපිටිය, කොටහේන, වවුනියාව, ත්‍රිකුණාමලය සහ බලංගොඩ යන ස්ථානයන්හි ශාඛා 5 ක් විවෘත කරනු ලැබීය.

## නියෝජිත බැංකු කටයුතු

1994 වර්ෂය තුළ දී, රාජ්‍ය බැංකු දෙක ප්‍රජා ණය නියාමක ක්‍රමය තුළින් නියෝජිත බැංකු කටයුතුවල නිරත විය. වර්ෂය තුළ දී ලංකා බැංකුව සහ මහජන බැංකුව, ප්‍රජා ණය නියාමකයින් පිළිවෙලින් 119 දෙනෙකු සහ 7 දෙනෙකු පත්කිරීමත් සමඟ රාජ්‍ය බැංකු දෙක විසින් පත් කරන ලද මුළු ප්‍රජා නියාමකයින් සංඛ්‍යාව 1993 වර්ෂය අවසානයේ දී 10,250 සිට 1994 දෙසැම්බර් මස අවසානය වන විට 10,376 ක් දක්වා වැඩි විය. මෙම ක්‍රමය යටතේ වර්ෂය තුළ දී මහජන බැංකුව විසින් රුපියල් දශලක්ෂ 5 ක ණය පහසුකම් ලබාදෙන ලදී. කෙසේ වුව ද, මෙම ක්‍රමය යටතේ නොපියවා පැවති සිය මුළු ණය ප්‍රමාණය 1993 වර්ෂය අවසානයේ දී රුපියල් දශලක්ෂ 202 සිට 1994 වර්ෂය අවසානය වන විට රුපියල් දශලක්ෂ 72 දක්වා අඩුවිය. මේ අතර 1994 වර්ෂය තුළ දී ලංකා බැංකුව රුපියල් දශලක්ෂ 4 ක ණය පහසුකම් ප්‍රදානය කරන ලද අතර 1994 වර්ෂය අවසාන වන විට මේ ක්‍රමය යටතේ නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 229 ක් විය. සීමාසහිත සම්පත් බැංකුව, සිය සම්පත් සේවා සංයෝජක ක්‍රමය යටතේ නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 11.5 ක් වූ අතර 1994 වර්ෂය අවසාන වන විට සම්පත් සේවා සංයෝජකයින් ලෙස 76 දෙනෙකු පත් කර තිබිණ.

## සේවා පහසුකම්

1994 වර්ෂය තුළ දී වාණිජ බැංකු විසින් සපයනු ලැබූ සේවා පහසුකම් තවදුරටත් පුළුල් කරනු ලැබීය. විද්‍යුත් මුදල් හුවමාරු පහසුකම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම්, ණය කාඩ්පත්, විදේශ විනිමය බැංකු පහසුකම් සහ නව තැන්පතු සහ ණය ක්‍රම මෙම කාලය තුළ දී වාණිජ බැංකු විසින් පුළුල් කරන ලද මූලික සේවා පහසුකම් විය.

වෙළෙඳ ගණුදෙනු පහසුකම්, විදේශ විනිමය ගණුදෙනු, මුදල් පැවැරුම් සේවාවන් පහසු කරවන ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල තොරතුරු හුවමාරු කිරීමේ පද්ධතියක් (Society for worldwide interbank financial telecommunication - SWIFT) 1994 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආරම්භ කරනු ලැබිය. වර්ෂය තුළ දී වාණිජ බැංකු වැඩි සංඛ්‍යාවක් මෙම ස්විෆ්ට් (SWIFT) ක්‍රමයේ සාමාජිකයින් බවට පත්විය. සීමාසහිත සෙලාන් බැංකුව, සවුදි-ඇමෙරිකානු බැංකුව සමඟ සහයෝගිත්වයෙන් නවත් විද්‍යුත් මුදල් හුවමාරු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය.

මුදල් ආපසු ගැනීම අන්තර් ගිණුම් මුදල් හුවමාරුව, ගිණුම් ශේෂ විමසීම, මුදල්/චෙක්පත් තැන්පත් කිරීම් පණිවුඩ හුවමාරු පහසුකම්, ගෙවීම් අත්හිටුවීම් සහ චෙක්පොත් අයදුම් කිරීම ආදී පහසුකම් සපයමින් 1994 වර්ෂය තුළ දී වාණිජ බැංකු සිය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පද්ධතිය තවදුරටත් වර්ධනය කරනු ලැබීය. සීමාසහිත සෙලාන් බැංකුව, වර්ෂය තුළ දී "ස්මාට් කාඩ්" නම් ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පතක් වෙළෙඳපොළට හඳුන්වා දෙනු ලැබිය. බැංකු 8 ක් විසින් ක්‍රියාත්මක කරන ලද මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව වර්ෂය තුළ දී 32 කින් වැඩිවීමත් සමග 1994

වර්ෂය අවසානය වන විට මුළු ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 109 ක් විය. සීමාසහිත ලංකා වාණිජ බැංකුව, සිය ගණුදෙනුකරුවන්ට තම ගිණුම්වල ඇති ශේෂයන් දැනගැනීමට,විවිධ වර්ගයේ තැන්පතු හා ණය ක්‍රම සඳහා වූ පොළී අනුපාතිකයන් සහ විදේශ විනිමය අනුපාතිකයන් දැනගැනීමට මෙන්ම දුරකථන භාවිතයෙන් බැංකුව වෙත සිය පණිවුඩ දීමට පහසු කරවන "කොම්ටෙල්" (Comtel) නම් වූ නව දුරකථන බැංකු පහසුකමක් හඳුන්වා දෙන ලදී.

විමසුමට ලක් කෙරුන කාලය තුළ දී දේශීය බැංකු විසින් ආර්ථිකයේ විවිධ අංශයන් සඳහා නව ණය වැඩපිළිවෙලවල් හඳුන්වා දෙන ලදී. මහජන බැංකුව පෞද්ගලික අංශයේ තේ සැපයුම් කරුවන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා අයිරා පහසුකම් ප්‍රදානය කිරීම ආරම්භ කරන ලදි. මෙම වැඩපිළිවෙල යටතේ ණය පහසුකම් සපයන ලද්දේ සියයට 22 ක පොළී අනුපාතයක් යටතේය. මහජන බැංකුව, කාර්මික අංශය සඳහා තවත් නව ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිය. මෙම ක්‍රමය යටතේ සුළු හා මැදි පරිමාණ කාර්මික ව්‍යාපෘතීන් සඳහා රුපියල් දශලක්ෂ 100 ක මුදලක් ප්‍රදානය කරනු ලැබීය. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව සහ සීමාසහිත ලංකා වාණිජ බැංකුව කාර්මික ව්‍යාපෘතින් මූල්‍යකරණය කිරීමේ අරමුණින් "පෞද්ගලික මූල්‍ය සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය හා "සංවර්ධන මූල්‍ය වැඩපිළිවෙල" යටතේ නව ණය ක්‍රම දෙකක් හඳුන්වා දෙනු ලැබීය.

රාජ්‍ය නොවන සංවිධාන මගින් අනුමතකරනු ලබන ආදයම් ඉපයිය හැකි කාර්යයන් සඳහා ණය සැපයීමේ අරමුණින් ලංකා බැංකුව ජනසවිය භාරකාර ණය වැඩපිළිවෙල ආරම්භ කරනු ලැබිණ. සීමාසහිත ලංකා වාණිජ බැංකුව ද, තොප්පි නිෂ්පාදන ව්‍යාපෘති සහ කොහු නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘති සඳහා ජනසවිය භාරකාර අරමුදල යටතේ ණය ප්‍රදානය කරනු ලැබීය.

ග්‍රාමීය අංශය වෙත ණය පහසුකම් වැඩි කිරීමේ අරමුණින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව දෙවන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ ණය ක්‍රමයක් ද, දිළිඳුකම තුරන් කිරීමේ යෝජනා ක්‍රමය සහ ධීවර ජන කොටස් සංවර්ධනය සඳහා ද වශයෙන් ණය පහසුකම් ක්‍රම තුනක් ආරම්භ කරන ලදී. ගොවිජන සේවා පනත යටතේ ලියාපදිංචි ගොවි සංවිධානවල සාමාජිකයින් වෙත තෝරාගත් ආහාර භෝග වගා කිරීම පිණිස ණය සැපයීමසඳහා එම ගොවි සංවිධානය වලට ලංකා බැංකුව විසින් වගා ණය ප්‍රදානය කරනු ලැබීය. තව ද ලංකා බැංකුව නියාමක යෝජනා ක්‍රමයක් වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශේෂ පාරිභෝගික ණය ක්‍රමයක් 1994 වර්ෂයේ දී ආරම්භ කරනු ලැබීය. මෙම ක්‍රමය යටතේ සපයනු ලබන උපරිම ණය මුදල රුපියල් 5,000 ක් විය. මේ අතර වගා ණය ගෙවීමට නොහැකි වූ ණය කරුවන්ට සහන සැලසීමේ ක්‍රම ලංකා බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබීය.

එක් පවුල් ඒකකයකට රුපියල් 10,000 ක උපරිමයකට යටත්ව සුළු පරිමාණ ආදයම් උපයන ව්‍යවසායක කටයුතු සඳහා ණය සැපයීමට නව ණය ක්‍රමයක් ලංකා බැංකුව විසින් ආරම්භ කරන ලදි.

සීමාසහිත සම්පත් බැංකුව ද මහනුවර ප්‍රදේශයේ ස්වයං රැකියා යෝජනා ක්‍රමයන් සඳහා නව ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය. මෙම ණය ක්‍රමය යටතේ සියයට 22 ක පොළියක් මත රුපියල් 15,000 ක උපරිමයකට යටත්ව මාස 36 ක පරිනත කාලයක් සහිත ණය සපයනු ලැබීය.

සීමාසහිත සෙලාන් බැංකුව ද, ස්වයං රැකියා කටයුතුවල යෙදෙන්නන්ට පහසුකම් සලසමින් කුඩා පරිමාණ ව්‍යවසායක ණය ක්‍රමය නමින් නව ණය ක්‍රමයක් ආරම්භ කරනු ලැබීය. මේ යටතේ සපයනු ලබන ණය සඳහා පොළිය සියයට 13 කි. සීමාසහිත සෙලාන් බැංකුව රුපියල් දශලක්ෂයක උපරිමයකට යටත්ව නිවාස ඉදිකිරීම් සහ අලුත්වැඩියා කිරීම් සඳහා "රන් මාළිගා ණය ක්‍රමය" නම්වූ ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මීට අමතරව සීමාසහිත සෙලාන් බැංකුව විසින් දිගුකාලීන තැන්පතු හිමියන් සඳහා නිවාස ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ තැන්පතුකරුවන්ට තැන්පතුවල මුළු මුහුණත වටිනාකමක් දක්වා වූ ණය මුදලක් ලබා ගැනීමට පහසුකම් සලසනු ලැබුණි.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව "සිහිති රන් සුරැකුම්" නමින් විදේශ මුදල් තැන්පතු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම තැන්පතු ක්‍රමය යටතේ විදේශ රැකියාවක් කරන පුද්ගලයකුට ඔහුගේ/ඇයගේ බාලවයස්කාර දරුවකු වෙනුවෙන් විදේශ මුදල් ගිණුමක් විවෘත කිරීමට ඉඩකඩ සැලසේ. මෙම ගිණුමක අවම තැන්පතුව වනුයේ එ. ජ. ඩොලර් 25 කි. මෙම ගිණුම් සඳහා ගෙවනු ලබන පොළිය, අනේවාසික විදේශ මුදල් ගිණුම් සඳහා එවකට පවතින පොළී ප්‍රතිශතයට වඩා සියයට 1 කට වඩා වැඩි පොළියකි. මේ අතර සීමාසහිත සම්පත් බැංකුව අවුරුදු 4 ක සහ 5 ක කල්පිරීමකින් යුතු තැන්පතු සහතික නිකුත් කිරීම ආරම්භ කරන ලදී

වයස අවුරුදු 18-50 ක වයස් සීමාවට අයත් වන ඕනෑම පුද්ගලයකු සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් වූ "සෙලාන් ප්ලෑන්" නම් වූ නව ආයෝජන ක්‍රමයක් සීමාසහිත සෙලාන් බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. මේ අතර ආයතනික ගණුදෙනුකරුවන් විසින් වාණිජ පත්‍ර නිකුත් කිරීමේ දී, බැංකුකරු ලෙස ක්‍රියා කිරීමට වාණිජ බැංකු කිපයක් ම ඉදිරිපත් විය.

## ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

1994 වසර තුළ දී ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය තම ප්‍රධාන කාර්යයන්වන ණය තොරතුරු එක්රැස් කිරීම, ණයකරුවන් පිළිබඳ වාර්තා සැපයීම, සහ දත්ත පදනම පුළුල් කිරීම යන කටයුතු නොකඩවා කරගෙන ගියේය.

ණය දෙන ආයතන මගින් පවත්වාගෙන යන ණය ගිණුම් පිළිබඳ වාර්තා සැපයීමේ සීමාවන් විධිමත් නොවන ණය ගිණුම් සඳහා රු.100,000/- හා විධිමත් ණය ගිණුම් සඳහා රු.500,000/- වශයෙන් නොවෙනස්ව පැවතුණි. 1994 ජනවාරි මසයේ දී ණය තොරතුරු කාර්යාංශය බස්නාහිර පළාතේ බැංකු සහ බැංකු ශාඛා විශාල ප්‍රමාණයක විධිමත් නොවන ණය ගිණුම් යාවත්කාලීන කිරීම වැඩි දියුණු කළ අතර මාසික පදනම මත යාවත්කාලීන කිරීම ආරම්භ කරන ලදී. මෙම ගිණුම් රටේ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 95 ක් පමණ විය. විධිමත් ණය ගිණුම්හි යාවත්කාලීන කිරීමේ කාලපරිච්ඡේදය මාස 6 සිට මාස 3 දක්වා අඩු කරන ලදී. පිට පළාත්වල බැංකු ශාඛා සහ මූල්‍ය සමාගම්වල විධිමත් නොවන ණය ගිණුම්හි යාවත්කාලීන කිරීම් අර්ධවාර්ෂික පදනම මත සිදු කිරීම නොකඩවා කරගෙන ගියේය.

1994 වර්ෂය අවසානයේ දී ණය කාර්යාංශය මගින් විධිමත් නොවන ණය ගිණුම්හි 21,371 ක් ද, විධිමත් ණය ගිණුම් 31,373 ක් ද දත්ත පදනමෙන් ආවරණය කරන ලදී. 1994 වසර තුළ දී ණය තොරතුරු සේවාවන් ප්‍රයෝජනයට ගැනීමට ණය දෙන ආයතන වැඩි උනන්දුවක් දක්වන ලදී. ණය තොරතුරු කාර්යාංශය විසින් 1994 වසරේ දී ණය වාර්තා 71,623 ක් සඳහා වූ ඉල්ලුම්වලට තොරතුරු සැපයූ අතර 1992 දී මේ ප්‍රමාණය 49,577 ක් ද, 1993 දී 58,657 ක් ද විය.

කාර්යාංශයෙහි කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම් ඇති නොවිය. 1994 අවසානයේදී නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 25 ක් වූ අතර, එම ප්‍රමාණය එකක් රු. 100 ක් බැගින් වූ කොටස් 250,000 කින් සමන් විය. මෙම කොටස් හිමිකම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (සියයට 51) ඇතුළු කොටස් කරුවන් 52 අතර බෙදී ගිය අතර එයින් වාණිජ බැංකු 23 (සියයට 30), සංවර්ධන මුදල් සංස්ථාව, රාජ්‍ය උකස් ආයෝජන බැංකුව ජාතික ඉතිරි කිරීමේ බැංකුව සංවර්ධන බැංකුව සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් 24 ( සියයට 19) ක්ද දරන ලදී.

## ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය

### (අ) ග්‍රාමීය ණය ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ණය ප්‍රතිපත්තියෙහි සැලකිය යුතු වෙනසක් 1994 වර්ෂයතුළදී දක්නට ලැබුණි. බැංකුවලට ලබාගත හැකිව තිබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභදායී ප්‍රතිමූල්‍ය පහසුකම වෙනුවට 1994 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, රජයේ පොළී සහනාධාර

යටතේ බැංකු අරමුදල්වලින් ණය දීමේ ක්‍රමයක් නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමයට හඳුන්වාදීම තුළින් එහි විෂය ක්ෂේත්‍රය නවීකරනය විය. මෙම සංශෝධිත ක්‍රමය යටතේ ණයදෙන බැංකු තමන්ගේම අරමුදල්වලින් ණයදීම ආරම්භ කරන ලද අතර, ණය දීමේ පොළී අනුපාතිකය වසරකට සියයට 16 මට්ටමක පවත්වා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් සියයට 7.5 ක පොළී සහනාධාරයක් ණයදෙන බැංකුවලට ගෙවන ලදි. ගුණාකාර අන්දමින් මූල්‍ය ප්‍රසාරණක් කරා යොමු කරවන ප්‍රතිමූල්‍ය ණය පහසුකම්වල උද්ධමනාත්මක ස්වභාවයත්, බැංකුවල අධි ද්‍රවශීලතාවත් පැවතීම නිසා මෙවැනි බාහිර අරමුදල් සම්පාදනය අත්හිටුවීමේ අවශ්‍යතාවයත්, හේතු කොට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුවට සිය ප්‍රතිමූල්‍ය පහසුකම් අත්හිටුවීමට සිදු විය. ඒ අනුව, නව යෝජනා ක්‍රමය 1994 යල කන්නයේ සිට ක්‍රියාත්මක විය. නමුත් ණය දීර්ඝ කිරීමේ පහසුකම හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇප ආවරණය වැනි නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ පැවති අනෙකුත් ලක්ෂණ නොවෙනස්ව පැවතුණි.

විමර්ශනයට භාජනය වන වසර තුළදී ග්‍රාමීය ණය ප්‍රතිපත්තියෙහි සැලකිය යුතු විශේෂ ලක්ෂණයක් වූයේ ණය ආපසු ගෙවීමට නොහැකි වූ ගොවින්ට 1994 ඔක්තෝම්බර් මාසයේ දී රජය විසින් ප්‍රකාශිත සහනදායී පහසුකමයි. 1994/95 මහ කන්නයේ සිට ක්‍රියාත්මක වූ මෙම සහනදායී පියවර යටතේ බැංකුවලින් ලබාගත් වගා ණය ආපසු ගෙවීමට නොහැකි වූ ගොවීන්ට තමන් ආපසු ගෙවීම පැහැරහැරි ණය මුදලින් සියයට 25 ක් ආපසු ගෙවීමෙන් තමන්ගේ ණය බරින් නිදහස්වීමේ අවස්ථාවක් ලබාදෙන ලදි. මෙම ක්‍රමයට ගොවින් සිය කැමැත්ත ප්‍රකාශකිරීමෙන් අනතුරුව, ණය මුදලේ ඉතිරි සියයට 75 සහ ඊට අදළ වූ ඒ දක්වා ගණනය කරන ලද සමුච්චිත පොළිය ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය අතර එකඟ වූ පිළිවෙලකට අනුව බැංකු විසින් කපාහැරීමට කටයුතු කරනු ඇත. ඉන්පසුව එවැනි ගොවීහු වෙනත් සාමාන්‍ය ණය ගැණුම්කරුවන් මෙන් බැංකු ණය පහසුකම් ලැබීමට සම්පූර්ණ සුදුසුකම් ලබති.

සියයට 25 ක මූලික ගෙවීම සඳහා කැමැත්ත ප්‍රකාශ නොකරන ලද ණය ආපසු ගෙවීම පැහැරහැරි අයට බීජ සහ පොහොර සඳහා වන වියදම ආවරණය වන පරිද්දෙන් රජයේ ඉල්ලීම පරිදි රාජ්‍ය බැංකු දෙක විසින් සීමිත ණය පහසුකමක් සලසන ලදී. 1994/95 මහ කන්නය තුළදී අක්කර 2 ට වඩා අඩු බිම්ප්‍රමාණයක් වගා කරන ලද ගොවින්ට රුපියල් 4000 ක ණය මුදලක් ද, අක්කර 2 ඉක්මවා වගා කළ ගොවින්ට රුපියල් 8000 ක ණය මුදලක් ද මෙම ක්‍රමය යටතේ ලබාදෙන ලදි.

## (ආ) නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න. ස. ග්‍රා. ණ. ක්‍ර.)

නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ බැංකු විසින් මුද හරින ලද මුළු ණය ප්‍රමාණය පසුගිය වර්ෂයේ දී මුද හරින ලද ණය ප්‍රමාණයට වඩා සියයට 6.2 ක වැඩිවීමක් පිළිබිඹු කරමින් 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 976 ක් විය.

කෙසේ වුව ද, නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද මුළු ණය සංඛ්‍යාව, 1993 වර්ෂයේ දී 63,864 ක සිට 1994 වර්ෂයේ දී 58,836 දක්වා අඩු විය. 1993 නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අක්කරයකට දෙන ලද ණය වැඩි කරනු ලැබීම හේතුවෙන්, 1994 වර්ෂයේ දී මුද හරින ලද ණය ප්‍රමාණය වැඩි ඉහල යාමට හේතු විය. 1994 වර්ෂයේ දී නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ මුදහරින ලද මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 633 ක් මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ 1993/1994 මහ කන්නය තුළ දී බැංකු විසින් සපයනු ලැබූ අතර, 1994 යල කන්නය තුළ දී රුපියල් දශලක්ෂ 343 ක් බැංකු විසින් සිය අරමුදල් උපයෝගී කර ගනිමින් මුද හරින ලදී. බැංකු තම අරමුදල් භාවිතා කරන මුද හරින ලද මුදල් රජය විසින් සපයනු ලබන සියයට 7.5 ක වාර්ෂික පොළී සහනයකට හිමිකම් ලබනු ඇත. නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් ප්‍රදානය කරන ලද්දේ වී වගාව සඳහා වූ අතර එය 1994 වර්ෂය තුළ දී මුද හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 69 ක් විය. ඉතිරි සියයට 31 ක ප්‍රමාණය අතිරේක භෝග වගාව සඳහා ප්‍රදානය කරනු ලැබීය.

මහ කන්නය සඳහා ප්‍රදානය කරන ලද මුළු වගා ණය සංඛ්‍යාව, 1992/93 වර්ෂයේ දී ණය 43,929 ක සිට 1993/94 වර්ෂයේ දී ණය 38,868 ක් දක්වා තියුණු ලෙසින් අඩු වුවද, 1993/94

1.72 සංඛ්‍යා සටහන

## නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද වගා ණය 1994.12.31 දිනට පැවති තත්ත්වය

රුපියල් දශලක්ෂ

| වගා කන්නය | මහජන බැංකුව | | | ලංකා බැංකුව | | | හැටන් නැෂනල් බැංකුව | | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව | | | ලංකා වාණිජ බැංකුව | | | සෙලාන් බැංකුව | | | විවිධ සේවා සමුපකාර සමිති | | | දෙන ලද මුළු ණය | | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | |
| 1990/91 මහ | 165.3 | 20.4 | 185.7 | 228.4 | 52.2 | 280.6 | 13.0 | 3.9 | 16.9 | 105.0 | 27.6 | 132.6 | 0.2 | 0.1 | 0.3 | - | - | - | - | - | - | 511.9 | 104.2 | 616.1 |
| 1994 යල | 66.3 | 88.8 | 155.1 | 103.9 | 57.4 | 161.3 | 3.1 | 12.9 | 16.0 | 49.1 | 53.9 | 103.0 | - | 0.5 | 0.5 | - | - | - | - | - | - | 222.4 | 213.5 | 435.9 |
| වගාවර්ෂය 1991 | 231.6 | 109.2 | 340.8 | 332.3 | 109.6 | 441.9 | 16.1 | 16.8 | 32.9 | 154.1 | 81.5 | 235.6 | 0.2 | 0.6 | 0.8 | - | - | - | - | - | - | 734.3 | 317.7 | 1,052.0 |
| 1991/92 මහ | 185.4 | 28.7 | 214.1 | 179.7 | 65.0 | 244.7 | 18.0 | 5.4 | 23.4 | 100.3 | 49.3 | 149.6 | - | - | - | - | - | - | 0.4 | 0.07 | 0.5 | 483.3 | 148.5 | 632.2 |
| 1992 යල | 38.6 | 31.8 | 70.4 | 57.0 | 24.8 | 81.7 | 0.9 | 3.9 | 4.8 | 37.6 | 37.7 | 75.3 | - | 0.3 | 0.3 | - | - | - | - | - | - | 134.0 | 98.5 | 232.5 |
| වගාවර්ෂය 1992 | 224.0 | 60.5 | 284.5 | 236.7 | 89.8 | 326.4 | 18.9 | 9.4 | 28.3 | 137.9 | 87.0 | 224.9 | - | 0.3 | 0.3 | - | - | - | 0.4 | 0.07 | 0.5 | 617.8 | 247.1 | 864.9 |
| 1992/93 මහ | 155.2 | 32.4 | 187.6 | 159.4 | 56.7 | 216.1 | 15.6 | 15.2 | 30.8 | 86.5 | 80.6 | 167.1 | 1.6 | 0.2 | 1.8 | - | - | - | - | - | - | 418.3 | 185.1 | 603.4 |
| 1993 යල | 61.4 | 47.7 | 109.1 | 78.7 | 28.0 | 106.7 | 1.1 | 4.4 | 5.5 | 42.8 | 50.7 | 93.5 | 1.2 | 1.1 | 2.3 | - | - | - | - | - | - | 185.2 | 131.9 | 317.1 |
| වගාවර්ෂය 1993 | 216.6 | 80.1 | 296.7 | 238.1 | 84.7 | 322.8 | 16.7 | 19.6 | 36.3 | 129.3 | 131.3 | 260.6 | 2.8 | 1.3 | 4.1 | - | - | - | - | - | - | 603.5 | 317.0 | 920.5 |
| 1993/94 මහ | 157.4 | 34.5 | 191.9 | 150.2 | 50.0 | 200.2 | 20.5 | 21.0 | 41.5 | 121.9 | 73.4 | 195.3 | 2.9 | 0.5 | 3.4 | - | 0.9 | 0.9 | - | - | - | 452.9 | 180.3 | 633.2 |
| *1994 යල | 66.9 | 39.9 | 106.8 | 69.2 | 23.6 | 92.8 | 6.7 | 32.9 | 39.6 | 62.4 | 38.2 | 100.6 | 1.7 | 1.8 | 3.5 | - | - | - | - | - | - | 206.9 | 136.4 | 343.3 |
| වගාවර්ෂය 1994 | 224.3 | 74.4 | 298.7 | 219.4 | 73.6 | 293.0 | 27.2 | 53.9 | 81.1 | 184.3 | 111.6 | 295.9 | 4.6 | 2.3 | 6.9 | - | 0.9 | 0.9 | - | - | - | 659.8 | 316.7 | 976.5 |

* 1994 අප්‍රියෙල් මාසයේදී ප්‍රතිමූල්‍ය ක්‍රමය ඉවත්කර ඒ වෙනුවට පොලී සහනාධාර ක්‍රමය ආරම්භ කරන ලදී.

මූලය : ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.73 සංඛ්‍යා සටහන

## තැන්පතු සහ අත්තිකාරම් - ග්‍රාමීය අංශය *

රුපියල් දහස්

| | සමුපකාර ග්‍රාමීය බැංකු | | කෘෂි සේවා මධ්‍යස්ථානවල ඇති ලංකා බැංකු උප කාර්යාල | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | | සකසුරුවම් සහ ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 |
| 1. මුළු ඉතිරි කිරීම් ** | 5,196,746 | 6,359,432 | 366,578 | ලැ.නො. | 1,099,420 | 1,481,281 | 1,415,452 | 1,552,531 |
| 1.1 ඉතිරි කිරීම් | 4,665,514 | 5,551,550 | 315,010 | ලැ.නො. | 979,040 | 1,253,687 | 1,033,605 | 1,132,823 |
| 1.2 විශේෂ ඉතිරි කිරීම් | - | - | 8,818 | ලැ.නො. | - | - | 254,014 | 301,569 |
| 1.3 ස්ථාවර තැන්පතු | 531,232 | 807,882 | 42,750 | ලැ.නො. | 120,380 | 227,594 | 127,833 | 118,139 |
| 2. ප්‍රදානය කළ මුළු ණය *** | 538,881 | 536,455 | 233,270 | 257,892 | 966,438 | 1,118,229 | 1,086,011 | 1,204,885 |
| 2.1 කෘෂිකර්මය | 67,495 | 79,748 | 88,281 | 107,903 | 422,231 | 379,470 | 296,188 | ලැ.නො. |
| 2.2 සත්ත්වපාලනය | 33,611 | 18,479 | 1,922 | 2,233 | 31,880 | 24,503 | 25,562 | ලැ.නො. |
| 2.3 ධීවර | - | - | 10 | 12 | 22,026 | 29,347 | - | ලැ.නො. |
| 2.4 කුඩා කර්මාන්ත | 32,908 | 21,024 | 2,047 | 2,379 | 99,528 | 102,010 | 38,975 | |
| 2.5 නිවාස තැනීම, විදුලිකරණය සහ ජල සැපයුම | 264,208 | 261,188 | 10,851 | 12,607 | - | - | 76,361 | ලැ.නො. |
| 2.6 ව්‍යාපෘති/වාණිජ | 62,813 | 73,909 | 86,273 | 87,771 | 178,250 | 215,875 | - | ලැ.නො. |
| 2.7 වෙනත් | 77,846 | 82,107 | 43,886 | 44,987 | 212,523 | 367,024 | 648,925 | ලැ.නො. |

* ග්‍රාමීය ප්‍රදේශවල පිහිටා ඇති මහජන බැංකු හා ලංකා බැංකු ශාඛාවල තොරතුරු ඇතුළත් නොවේ.
** දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීම් වල මුළු වටිනාකම.
*** වර්ෂයතුල දෙන ලද ණයවල මුළු වටිනාකම.

මූලය : මහජන බැංකුව,
ලංකා බැංකුව,
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු,
සකසුරුවම් හා ණය ගණුදෙනු,
පිළිබඳ සමුපකාර සමිති.

මහ කන්නයේ දී මුදා හරින ලද මුළු ණය ප්‍රමාණය සියයට 5 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 633 ක් විය. වී වගාව සඳහා මෙන් ම අතිරේක ආහාර භෝග වගාව සඳහා ද ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව අඩු විය. 1993/94 වර්ෂයේ මහ කන්නයේ වී වගාව සඳහා දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 418 සිට 1993/94 වර්ෂයේ මහ කන්නයේ දී, රුපියල් දශලක්ෂ 453 දක්වා වැඩි වූ අතර අතිරේක භෝග වගාව සඳහා දෙන ලද ණය 1992/93 වර්ෂයේ දි රුපියල් දශලක්ෂ 185 ක සිට 1993/94 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 180 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. 1993/94 මහ කන්නය තුළ දී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය ද සියයට 2.5 කින් අඩු වී හෙක්ටයාර් 35,880 ක් විය. මහ කන්නය තුළ දී පැවති ගංවතුර, ණය ඉල්ලුම් සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

1994 වර්ෂයේ යල වගා කන්නය සඳහා බැංකු විසින් මුදා හරින ලද මුළු ණය ප්‍රමාණය වසරේ යල කන්නයට වඩා සියයට 8.5 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 343 ක් විය. මෙම තත්වය 1994 යල කන්නය සඳහා, මහබැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් ඉවත් කිරීමෙන් පසුව වුවද සිදුවූවක් බව සඳහන් කල යුතුය. ප්‍රදානය කරන ලද මුළු ණය සංඛ්‍යාව ද, 1993 වර්ෂයේ දී වූ 19,935 සමග සැසඳීමේ දී 1994 වර්ෂයේ දී 19,968 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. මෙයට මූළුමනින්ම හේතු වූයේ වී වගාව සඳහා ප්‍රදානය කරන ලද ණය මුදලේ ප්‍රමාණය මෙන් ම ණය සංඛ්‍යාවද වැඩි වීමයි. වී වගාව සඳහා මුදා හරින ලද ණය ප්‍රමාණය 1993 වර්ෂයේ දී වූ රුපියල් දශලක්ෂ 185 සමග සසඳන විට එය 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 220 ක් වූ අතර ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව 1993 වර්ෂයේ දී 11,539 සමග සසඳන විට එය 1994 වර්ෂයේ දී 13,058 ක් විය. 1994 වර්ෂය තුළ දී අතිරේක ආහාර භෝග වගාව සඳහා ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය අඩුවීමක් වාර්තා කරන ලදී. අතිරේක භෝග වගාව සඳහා මුදා හරින ලද ණය ප්‍රමාණය 1993 වර්ෂයේ දී වූ රුපියල් දශලක්ෂ 131 සමග සසඳනකල 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 124 ක්වූ ඇති අතර ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව 1993 වර්ෂයේ දි 8,396 ක සිට 1994 වර්ෂයේ දී 6,910 ක් දක්වා පහත වැටුණි.

ඇතැම් ප්‍රාදේශිය ග්‍රාමීය බැංකු විසින් මුහුණ පෑ අරමුදල්වල ඌනතාවය නිසා ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් 1994 වර්ෂය තුළ දී, මෙම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට, රුපියල් දශලක්ෂ 100 ක විශේෂ ප්‍රතිමූල්‍ය පහසුකම් දීර්ඝ කරන ලදි. මෙම විශේෂ පහසුකම යටතේ, ගොවීන් වෙත වාර්ෂිකව සියයට 16 ක් පොළියකට වගා ණය ප්‍රදානය කිරීම සඳහා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට, රාජ්‍ය බැංකු දෙකෙන් වාර්ෂිකව සියයට 20 ක පොළියකට ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාගත හැකිවනු ඇත. එවැනි කටයුතුවල දී, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට දැරීමට සිදුවන ඉහළ අරමුදල් පිරිවැය වෙනුවෙන් වාර්ෂිකව සියයට 11.5 ක පොළි සහනාධාරයක් රජයෙන් හිමි වනු ඇත. 1994 වර්ෂය යල කන්නය තුලදී ප්‍රාදේශීය සංවර්ධන බැංකු මෙම පහසුකම් යටතේ රුපියල් දශලක්ෂ 60 ක මුදලක් උපයෝගී කරගෙන ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ආවරණ ක්‍රමය යටතේ, ණය ගෙවීම් පැහැර හැරීම් වෙනුවෙන්, නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1994 වර්ෂයේ දි ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 37 ක් වූ අතර 1994 දෙසැම්බර් මස අවසානය වන විට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 138 ක් විය. මෙම වන්දි මුදල් නව සපිරි ණය ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණය වෙනුවෙන් බැංකු විසින් දැරීමට සිදුවූ පාඩුවෙන් සියයට 50 ක ප්‍රමාණයක් සඳහා විය.

## (ඇ) කෘෂි රක්ෂණ මණ්ඩලය (කෘ. ර. ම.)

1994 වගා වර්ෂය තුළ දී කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් හෙක්ටයාර 39,500 ක වී වගා බිම් ප්‍රමාණයක් රක්ෂණය කරන ලද අතර, එය පෙර වගා වර්ෂය හා සසඳන කළ සියයට 20 ක වැඩිවීමකි. 1994 වර්ෂය සඳහා රක්ෂණය කරන ලද බිම් ප්‍රමාණය වෙනුවෙන් අයකරගන්නා ලද රක්ෂණ වාරික මුදල රුපියල් දශලක්ෂ 17ක් වන අතර, එය 1993 වර්ෂයේ අයකරගත් මුදලට වඩා සියයට 18 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1994 වර්ෂය තුළ කෘ. පි. ර. ම. හි ක්‍රියාකාරිත්වයෙහි වඩාත් කැපීපෙනෙන ලක්ෂණය වූයේ 1993 වසරෙහි රුපියල් දශලක්ෂ 6 ට සීමා වූ රක්ෂණ

වන්දි ගෙවීම් 1994 වසරේ දී රු. ද. ල. 27 දක්වා තියුණු ලෙස වැඩිවීමයි. හතර ගුණයක පමණ මෙම වැඩිවීමට බලපැවේ 1993/94 මහ කන්නය තුළදී උතුරුමැද සහ නැගෙනහිර පළාත්වල සිදුවූ ගංවතුර ගැලීම නිසා දැඩි ලෙස වගාහානියට පත්වීමේ හේතුවෙන් වගා ණය ආපසු නොගෙවීමට නොහැකි වූ ගොවීන් වෙනුවෙන් කෘ. ර.ම. විසින් සියයට සියයක රක්ෂණ වන්දි මුදලක් ගෙවනු ලැබීමයි. 1994 මහ කන්නයේදී ගෙවන ලද රක්ෂණ වන්දි මුදල 1993 මහ කන්නයේ දී කෘ. ර. ම. විසින් ගෙවන ලද රක්ෂණ වන්දි මුදල මෙන් දෙගුණයක් දක්වා එනම් රුපියල් දශලක්ෂ 20 ක් දක්වා ඉහළ නැගුණි.

## (ඈ) ග්‍රාමීය අංශය සඳහා ණය පහසුකම්

ග්‍රාමීය අංශය සඳහා ණය පහසුකම් ප්‍රධාන වශයෙන් සපයනු ලැබූයේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැං.) , සමූපකාර ග්‍රාමීය බැංකු (ස.ග්‍රා. බැං.), ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි පිහිටි ලංකා බැංකු උප කාර්යාල ( ලං. බැං. උ. කා.) සහ සකසුරුවම් හා ණයදෙන සමූපකාර සමිති (ස.ණ.ස) මගිනි. මෙම ආයතන මගින් 1994 වසර තුල දී දෙන ලද ණය මුදල රුපියල් බිලියන 3.1 වන අතර, එය 1993 වසරේ දෙන ලද රුපියල් බිලියන 2.8 හා සසඳන කළ සියයට 10 ක වැඩිවීමකි.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති මගින් ලබාදී ඇති ණය ප්‍රමාණ පිළිවෙලින් සියයට 16 සහ සියයට 11 යන ප්‍රමාණවලින් වැඩිවීම නිසා එම ආයතන මගින් ලබාදී ඇති ණය මුදල් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් බිලියන 1.1 සහ රුපියල් බිලියන 1 ක් වි ය. කෙසේ වුව ද, සමූපකාර ග්‍රාමීය බැංකු මගින් මුදහැර ඇති ණය ප්‍රමාණය 1994 දී රුපියල් දශලක්ෂ 536 ක් දක්වා සුළු වශයෙන් අඩුවිය.

## (ඉ) ග්‍රාමීය ඉතිරිකිරීම් රාශීකරණය

ග්‍රාමීය අංශයේ ඉතිරිකිරීම් මූලික වශයෙන්, සමූපකාර ග්‍රාමීය බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, සකසුරුවම් හා ණය දෙන සමිති සහ කෘෂි සේවා මධ්‍යස්ථාන වෙත රාශීගතවී ඇත. 1993 වසරේ දී රාශිකරණය වූ මුළු ඉතිරිකිරීම් ප්‍රමාණය වන රුපියල් බිලියන 7.7 සමග සසඳා බැලූ විට සියයට 22 ක වර්ධනයක් දක්වමින් 1994 වසරේ දී එම ප්‍රමාණය රුපියල් බිලියන 9.4 ක් දක්වා වැඩිවී ඇත. සමූපකාර ග්‍රාමීය බැංකු මගින් රාශීගත කර ඇති මුළු ඉතුරුකිරීම් ප්‍රමාණය රුපියල් බිලියන 6.4 ක් වන අතර, රුපියල් බිලියන 1.5 බැගින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ කෘෂි සේවා මධ්‍යස්ථාන මගින් ද ඉතුරුම් වශයෙන් රැස්කරගනු ලැබිණ.

# අනෙකුත් මූල්‍ය ආයතන

## ඉතිරිකිරීමේ ආයතන

ආර්ථිකයේ ඇති වූ තිරසාර වර්ධනයත් සාපේක්ෂ වශයෙන් පිරිනමන ලද ඉහළ පොළී අනුපාතිකත් සමඟ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු රාශිකරණය නවදුරටත් අඛණ්ඩ වර්ධනයක් වාර්තා කරන ලදි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මුළු තැන්පතු, 1994 වර්ෂය අවසානය වන විට රුපියල් දශලක්ෂ 11,169 කින් හෙවත් සියයට 27 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 53,326 ක් විය. පසුගිය වර්ෂය තුළ දී මෙහි වැඩිවීම වූයේ රුපියල් දශලක්ෂ 9,280 කින් හෙවත් සියයට 28 කිනි. 1993 වර්ෂයෙහි දී වාර්තා වූ සියයට 25 ක (රුපියල් දශලක්ෂ 5,131) වර්ධනය සමඟ සසඳන කළ විවිධ කල්පිරීම්වලින් යුක්ත ස්ථාවර තැන්පතු සියයට 29 ක (රුපියල් දශලක්ෂ 7,575) වැඩිවීමක් වාර්තා කරන ලදි. මේ අතර ඉතිරිකිරීමේ තැන්පතු රුපියල් දශලක්ෂ 3,595 (සියයට 22) කින් වර්ධනය විය. භාණ්ඩාගාර බිල්පත් එලද අනුපාතිකයන් සහ වාණිජ බැංකු තැන්පතු අනුපාතිකයන් අඩු වීමත් සමග 1994 දෙසැම්බර් මස 01 දිනට බලපැවැත්වෙන පරිදි ස්ථාවර තැන්පතු සඳහා පිරිනමන ලද පොළී අනුපාතිකයන් අඩු කරන ලදී. එක් අවුරුදු කල්පිරීමකින් යුතු තැන්පතු සඳහා පොළී අනුපාතිකයන් සියයට 16.0 ක සිට සියයට 14 ක් දක්වා අඩු කරන ලදී. මාසිකව පොළී ගෙවනු ලබන එක් අවුරුදු තැන්පතු සඳහා ද පොළිය සියයට 15.3 සිට

## 1.74 සංඛ්‍යා සටහන

## දිගු කාලීන ණය දෙන ආයතන වලින් අනුමත කරන ලද හා දෙන ලද ණය - අරමුණු අනුව

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| අරමුණු | ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික සංවර්ධන බැංකුව(2) | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | | එකතුව | | අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණය% | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 | 1993 | 1994 |
| 1. කෘෂිකර්මය | 110 | 308 | - | | - | 12 | - | - | 148 | 324 | - | - | 258 | 644 | 2.2 | 4.4 |
| I. වැවිලි | 110 | 308 | - | | - | - | - | - | - | - | - | - | 110 | 308 | 0.9 | 2.1 |
| II. දේශිය | - | - | - | | - | - | - | - | 148 | 324 | - | - | 148 | 324 | 1.3 | 2.2 |
| III. කිරිපට්ටි හා සත්ව පාලනය | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| IV. ධීවර කර්මාන්තය | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| V. කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් මිලට ගැනීම | - | - | - | | - | 12 | - | - | - | - | - | - | - | 12 | - | - |
| 2. කර්මාන්ත | 2,298 | 2,718 | - | | - | - | - | - | 2,566 | 2,510 | - | - | 4,864 | 5,228 | 42.0 | 35.9 |
| I. වැවිලි කර්මාන්තයේ කාර්මික සැකසුම් | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| II. කෘෂි භෝග වල කාර්මික සැකසුම් | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| III. ඉංජිනේරු කටයුතු සහ ගොඩනැගිලි ව්‍යාපාර | 86 | 201 | - | | - | - | - | - | - | - | - | - | 86 | 201 | 0.7 | 1.4 |
| IV. පතල් කැනීම් | 11 | 16 | - | | - | - | - | - | - | - | - | - | 11 | 16 | 0.1 | 0.1 |
| V. ආහාර පාන සහ දුම්කොළ | 329 | 463 | - | | - | - | - | - | 603 | 564 | - | - | 932 | 1,027 | 8.0 | 7.1 |
| VI. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 330 | 311 | - | | - | - | - | - | 778 | 496 | - | - | 1,108 | 807 | 9.6 | 5.5 |
| VII. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 239 | 326 | - | | - | - | - | - | - | 64 | - | - | 239 | 390 | 2.1 | 2.7 |
| VIII. ලෝහ රසායනක ඉංජිනේරු | 502 | 431 | - | | - | - | - | - | 645 | 933 | - | - | 1,147 | 1,364 | 9.9 | 9.4 |
| IX. අනෙකුත් නිෂ්පාදන | 801 | 970 | - | | - | - | - | - | 540 | 453 | - | - | 1,341 | 1,423 | 11.6 | 9.8 |
| 3. සංචාරක | 448 | 694 | - | | - | - | - | - | 95 | 505 | - | - | 543 | 1,199 | 4.7 | 8.2 |
| 4. වෙළෙඳ (සේවා කර්මාන්ත) | - | - | - | | - | - | - | - | 1,005 | 1,312 | - | - | 1,005 | 1,312 | 8.7 | 9.0 |
| 5. මූල්‍ය | 110 | 181 | 580 | 470 | - | - | - | - | 299 | 70 | - | - | 989 | 721 | 8.5 | 5.0 |
| I. මූල්‍ය ආයතනවලට දෙන ලද ණය | 110 | 181 | 580 | 470 | - | - | - | - | 26 | 70 | - | - | 716 | 721 | 6.2 | 5.0 |
| II. ආයෝජන ණය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| III අනෙකුත් | - | - | - | - | - | - | - | - | 273 | - | - | - | 273 | - | 2.4 | - |
| 6. නිවාස | - | - | 156 | 236 | 884 | 670 | 192 | 291 | - | - | 755 | 547 | 1,987 | 1,744 | 17.1 | 12.0 |
| I. නිවාස මිලදී ගැනීම | - | - | 12 | 58 | 170 | 182 | 27 | 151 | - | - | 290 | 248 | 499 | 639 | 4.3 | 4.4 |
| II. ඉදිකිරීම් | - | - | 144 | 178 | 714 | 488 | 165 | 140 | - | - | 465 | 299 | 1,488 | 1,105 | 12.8 | 7.6 |
| 7. ණයෙන් නිදහස් වීම | - | - | - | | 15 | 11 | 82 | - | - | - | - | - | 97 | 11 | 0.8 | 0.1 |
| 8. අනෙකුත් ණය | 197 | 657 | 1,510 | 2,028 | 138 | 31 | - | - | - | 979 | - | - | 1,845 | 3,695 | 15.9 | 25.4 |
| එකතුව (අනුමත කරන ලද) | 3,163 | 4,558 | 2,246 | 2,734 | 1,037 | 724 | 274 | 291 | 4,113 | 5,700 | 755 | 547 | 11,588 | 14,554 | 100 | 100 |
| ප්‍රදානය කරන ලද ණය (1) | 1,928 | 2,748 | 2,245 | 2,734 | 674 | 635 | 249 | 255 | 4,100 | 5,418 | 534 | 454 | 9,730 | 12,244 | | |
| ප්‍රදානය කරන ලද ණය අනුමත කරන ලද ණයෙන් ප්‍රතිශතයක් වශයෙන් | 61 | 60 | 100 | 100 | 65 | 88 | 91 | 88 | 100 | 95 | 71 | 83 | 84 | 84 | | |

සටහන (1) පසුගිය වර්ෂයේදී අනුමත කරන ලදුව සහ මෙම වර්ෂයේදී දෙන ලද ණය ද ඇතුළත් වේ.
(2) ප්‍රතිමූල්‍ය ණය සහ ප්‍රාග්ධන ආයෝජනයන්ද ඇතුළත්වේ.

මූලයන් : ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව,
ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව,
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව,
ජාතික සංවර්ධන බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

සියයට 13.2 දක්වා අඩු කරන ලදි. ඉතිරිකිරීමේ තැන්පතු සඳහා පිරිනමන ලද පොළී අනුපාතිකය 1994 වර්ෂය තුළ දී සියයට 14 ක් ලෙසින් නොවෙනස්ව පැවතිණි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කටයුතුවල සැලකිය යුතු තවත් වර්ධනයක් වූයේ ප්‍රධාන ශාඛා කාර්යාලයේ ගිණුම් හිමියන් සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හඳුන්වා දීමය. වර්ෂය තුළ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව රුපියල් සුරැකුම්පත් මත ආයෝජනය කිරීම වැඩි කළේය. මෙම සුරැකුම්පත්වල මුළු ආයෝජනය වර්ෂය තුළ දී රුපියල් දශලක්ෂ 19,608 ක් විය. භාණ්ඩාගාර බිල්පත් හි ආයෝජනය රුපියල් දශලක්ෂ 20,096 සිට රුපියල් දශලක්ෂ 13,396 ක් දක්වා අඩු විය. මේ අතර වර්ෂය තුළදී ණය දීමේ කටයුතු තවදුරටත් වර්ධනය විය. මුදා හරින ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 2,734 ක් වූ අතර එය ස්ථිර තැන්පතුවල සුරැකුම මත ලබාදෙන ලද ණයවලින් සියයට 74 කි.

සංචිත වල ඇති වූ වර්ධනයත් සමග සේවක භාරකාර අරමුදල තවදුරටත් පුළුල් විය. සාමාජිකයින් විසින් කරන ලද මුළු දායකත්වය පසුගිය වර්ෂයේ දි වූ රුපියල් දශලක්ෂ 1,183 ට එරෙහිව රුපියල් 1,418 කින් වැඩි විය. මේ අතර සේවක භාරකාර අරමුදලෙහි සාමාජිකයන් සතු අරමුදල් ශේෂය 1993 වර්ෂය අවසානයේ දි රුපියල් දශලක්ෂ 7,883 සිට 1994 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 9,969 දක්වා වැඩි විය.

සේවක භාරකාර අරමුදලේ සම්පත්වලින් වැඩි ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය. වර්ෂය තුළ දි රජයේ සුරැකුම්පත්වල යෙදවූ මුළු ආයෝජනයන් රුපියල් දශලක්ෂ 5,869 සිට රුපියල් දශලක්ෂ6,539 දක්වා රුපියල් දශලක්ෂ 670 කින් වැඩිවිය. අනෙකුත් ප්‍රධාන ආයෝජනයන් වූයේ සමාගම්හි හිමිකරු ප්‍රාග්ධනයන් (රුපියල් දශලක්ෂ 1,174) සහ ණයකරයන්ය. (රුපියල් දශලක්ෂ 1,365)

## දිගුකාලින ණය දෙන ආයතන

ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ණයදීමේ කටයුතු තවදුරටත් පුළුල් වීමක් පිළිබිඹු කරමින් එමගින් ප්‍රදානය කරනු ලැබූ මුළු ණය ප්‍රමාණයේ වටිනාකම පසුගිය වර්ෂයේදී පැවති රුපියල් දශලක්ෂ 1,928 ට එරෙහිව 1994 දී රුපියල් දශලක්ෂ 2,748ක් විය. කෙසේ වුව ද, විදේශ මාර්ගයන්ගෙන් ලැබුණු ණය පහසුකම් අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබුණු මුළු අරමුදල් 1993 වර්ෂයේ දි වූ රුපියල් දශලක්ෂ 4,548 සමඟ සංසන්දනාත්මකව බලන කළ 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 4,215 ක් විය. අරමුදල් ලැබුණු ප්‍රධාන මාර්ගයන් වූයේ ණය මුදල් ආපසු අයකර ගැනීම් (රුපියල් දශලක්ෂ 2,385) ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ආසියානු සංවර්ධන සංගමය යටතේ වූ විදේශ ණය ගැනීම් (රුපියල් දශලක්ෂ 500) සහ කල්බදු ආපසු ගෙවීම්ය. (රුපියල් දශලක්ෂ 400) පසුගිය වර්ෂයේදී අනුමත කළ ණය සංඛ්‍යාව වූ 551 ත් සමග සංසන්දනාත්මකව බලන කල වර්ෂය තුළ දී අනුමත කළ ණය සංඛ්‍යාව 678 ක් දක්වා වැඩිවිය. අනුමත කළ ණය වලින් වැඩි ප්‍රමාණයක් කෘෂිකාර්මික අංශයට යොමු වූ අතර එම ණය සංඛ්‍යාව 88 කින් වැඩිවිය. මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයේ වටිනාකම පසුගිය වර්ෂයේදි වූ රුපියල් දශලක්ෂ 1,928 හා සසඳන කළ 1994 දී රුපියල් දශලක්ෂ 2,748 ක් විය. වර්ෂය අවසානයේ දි නොපියවා පැවති මුළු ණය ප්‍රමාණයේ වටිනාකම රුපියල් දශලක්ෂ 7,223 ක් දක්වා වැඩි විය. මේ අතර සංවර්ධනය මූල්‍ය සංස්ථාව ව්‍යාපෘතීන් 20 ක් සඳහා ද රුපියල් දශලක්ෂ 589 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන මූල්‍ය පහසුකම් සපයා දෙනු ලැබිය. මෙයින් ව්‍යාපෘතින් 9 ක් කාර්මික අංශයේ වූ අතර එම ව්‍යාපෘති සඳහාරුපියල් දශලක්ෂ 423 ක අරමුදල් ලබා දෙන ලදී.

කාර්මික අංශය වෙත ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,295 ක් වූ අතර ඉන් වැඩි ප්‍රමාණයක් ආහාර පාන වර්ග සහ දුම්කොළ අංශය වෙත යොමු විය. සංචාරක (රුපියල් දශලක්ෂ 679), කෘෂිකාර්මික (රුපියල් දශලක්ෂ 307) සහ ගමනාගමන සේවා (රුපියල් දශලක්ෂ 516) යන අංශයන් සැලකිය යුතු ණය ප්‍රමාණයන් ලබාදුන්අනෙකුත් ප්‍රධාන අංශයන් විය. පසුගිය කාලයේ දී මෙන්ම නොපියවා පැවති ණයවලින් වැඩි ප්‍රමාණයක් (සියයට 63) මැදි කාලින කාණ්ඩයට අයත් විය.

වර්ෂය තුල දී ජාතික සංවර්ධන බැංකුවේ සම්පත් පදනම මෙන්ම ණය දීමේ කටයුතු ද තවදුරටත් පුළුල් විය. ජාතික සංවර්ධන බැංකුවවෙත ලැබුණු මුළු සම්පත් රුපියල් දශලක්ෂ 5,433 දක්වා රුපියල් දශලක්ෂ 504 කින් වැඩි විය. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් ගණුදෙනුකරුවන්ගේ ණය ආපසු අයකර ගැනිම තුළින් සිදුවිය. ණය ආපසු අය කරගැනිම් පසුගිය වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 2,143 සිට රුපියල් දශලක්ෂ 3,356 ක් දක්වා වැඩි විය. අරමුදල් ලැබුන අනෙකුත් ප්‍රධාන මාර්ගයක් වූයේ ණය ක්‍රම යටතේ ලැබුණු අරමුදල් (රුපියල් දශලක්ෂ 733) සහ සංචිත භාවිතයයි.(රුපියල් දශලක්ෂ 686)

වර්ෂය තුළ දී, ජාතික සංවර්ධන බැංකුව අනුමත කළ මුළු ණය ප්‍රමාණයරුපියල් දශලක්ෂ 4,114 සිට රුපියල් දශලක්ෂ 5,418 දක්වා වැඩිවිය. ණය සංඛ්‍යාව 262 සිට 352 දක්වා වැඩි විය. මීට අමතරව ව්‍යාපෘතීන් 22 ක් සඳහා රුපියල් දශලක්ෂ 281 ක ප්‍රාග්ධන මූල්‍ය පහසුකම් සපයන ලදී. අනුමත කරන ලද ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් එනම් රුපියල් දශලක්ෂ 2,337 ක මුදලක්ද කාර්මික අංශයට යොමු විය. සේවා අංශය (රුපියල් දශලක්ෂ 1,307) දේපල සංවර්ධනය (රුපියල් දශලක්ෂ 874) සහ කෘෂිකාර්මික (රුපියල් දශලක්ෂ 324) යන අංශයන් ණය මුදල් අනුමත කළ අනෙකුත් අංශයන් විය. 1994 වර්ෂය තුළ දී කාර්මික අංශයෙහි ප්‍රධාන උප අංශයන් වන ආහාර පාන වර්ග සහ දුම්කොළ (රුපියල් දශලක්ෂ 564) සහ රසායනික සහ ප්ලාස්ටික් නිෂ්පාදන (රුපියල් දශලක්ෂ 729) සහ ඇඟළුම් සහ සම් භාණ්ඩ (රුපියල් දශලක්ෂ 402) යනාදිය සඳහා ණය ප්‍රධාන ලෙස ලබා දුනි.

ශ්‍රී ලංකාවෙ නිවාස ණය දීමේ ප්‍රමුඛ පෙළේ ආයතනයක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ක්‍රියාකාරීත්වයේ මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරන ලදී. රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව වෙත ලැබුණු මුළු සම්පත් ප්‍රමාණය 1993 වර්ෂයේ දී පැවති රුපියල් දශලක්ෂ 1,029 ක සිට 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 1,336 දක්වා වැඩි විය. ගණුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 789 ක් වූ අතර පසුගිය වර්ෂවලදී මෙන් ම එය සැපයීම සඳහා අවශ්‍ය සම්පත්වලින් වැඩිම ප්‍රමාණයකට දයක විය.

නිවාස ඉදිකිරීම්, නිවාස මිළදී ගැනිම් සහ ගොඩනැගිලි තැනීම් සඳහා මුද හරින ලද මුළු ණය ප්‍රමාණය පසුගිය වර්ෂය තුළ දී රුපියල් දශලක්ෂ 674 ක මුදල සමග සංසන්දනාත්මකව බලන කල රුපියල් දශලක්ෂ 634 ක් විය. අනුමත කරන ලද ණයවලින් සියයට 77 ක ප්‍රමාණයක් රුපියල් 100,000 - රුපියල් 1,000,000/- පරාසයක වූ ණය ප්‍රමාණයන්ට ඇතුළත් විය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස සඳහා ණය දෙන අනුපාතය 20.5-22.0 පරාසයක විය. රුපියල් 500,000 කට වැඩි ණය මුදල් සඳහා අදළ පොළිය සියයට 22.0 වූ අතර රුපියල් 500,000 කට අඩු ණය මුදල් සඳහා වූ පොළිය සියයට 20.5 ක් විය.

## මූල්‍ය සමාගම්

මූල්‍ය සමාගම් කටයුතුවල සැළකිය යුතු වර්ධනයක් පිළිබිඹු කරමින් මූල්‍ය සමාගම්වල මුළු වත්කම් ප්‍රමාණය, පසුගිය වර්ෂයේදි වාර්තා වූ සියයට 12.4 (රුපියල් දශලක්ෂ 1,297) ක අඩුවීමට එරෙහිව 1994 වර්ෂයේදි සියයට 31.6 (රුපියල් දශලක්ෂ 2,853) කින් වැඩි විය. මහ බැංකුවේ වලංගු බලපත්‍ර සහිත මුළු මූල්‍ය සමාගම් සංඛ්‍යාව 24 ක් ලෙසින් නොවෙනස්ව පැවතුණි.

කල්බදු මූල්‍ය පහසුකම් වෙනුවෙන් ලබා දී ඇති මුළු මුදල රුපියල් දශලක්ෂ 3,384 ක් දක්වා රුපියල් දශලක්ෂ 1,108 කින් වැඩිවීමත් සමඟ නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,134 ක සැළකියුතු වර්ධනයක් පෙන්නුම් කළේය. පසුගිය වර්ෂයේදි වාර්තා වූ රුපියල් දශලක්ෂ 678 ක අඩුවීමට එරෙහිව වර්ෂය තුළදී කුලී පිට ගැනුම් කටයුතු ද, රුපියල් දශලක්ෂ 78 කින් වැඩි විය. මේ අතර අනෙකුත් සමාගම්වල ආයෝජනයන් සහ රජයේ සුරැකුම්පත් ඇතුළු ආයෝජනයන් රුපියල් දශලක්ෂ 482 කින් වැඩි විය. වගකීම් අංශයෙහි මූල්‍ය සමාගම්වල මුළු තැන්පතු ප්‍රමාණය 1993 වර්ෂයේදී සියයට 2.6 (රුපියල් දශලක්ෂ 49) කින් අඩුවීමෙන් පසු 1994 වර්ෂයේදී සියයට 23.6 (රුපියල් දශලක්ෂ 1,295) කින් වැඩි වී වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 6,788 ක් විය. තැන්පතු වගකීම් මත සංචිත අවශ්‍යතා වැඩිවීමත්

## 1.75 සංඛ්‍යා සටහන
## මූල්‍ය සමාගම් අරමුදල් ලබාගත් මාර්ග සහ ඒවා යෙදවූ මාර්ග

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| ශීර්ෂය<br>අරමුදල් ලබාගත් මාර්ග | 1993 දෙසැම්බර් 31 දිනට | 1994 මාර්තු 31 දිනට | 1994 ජුනි 30 දිනට | 1994 සැප්තැම්බර් 30 දිනට | 1994 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| 1. ප්‍රාග්ධන ගිණුම් | 1,335.1 | 1,556.1 | 1,758.3 | 1,833.3 | 2.183.6 |
| 2. තැන්පතු | 5,492.6 | 5,901.7 | 6,271.9 | 6,525.3 | 6,788.4 |
| 3. ණය ගැනීම් | 1,157.7 | 1,198.9 | 1,245.7 | 1,235.1 | 1,335.1 |
| 4. අනෙකුත් වගකීම් | 1,035.7 | 1,177.6 | 1,591.4 | 1,478.9 | 1,566.4 |
| එකතුව | 9,021.1 | 9,834.3 | 10,867.3 | 11,072.6 | 11,873.5 |
| අරමුදල් යෙදවූ මාර්ග | | | | | |
| 1. කුලී පිට ගැණුම් කටයුතු | 2,140.7 | 2,140.8 | 2,157.0 | 2,172.4 | 2,218.6 |
| 2. නොපියවන ලද ණය | 3,138.8 | 3,516.8 | 3,714.6 | 3,893.2 | 4,273.3 |
| 3. ආයෝජන | 1,383.4 | 1,537.8 | 1,691.2 | 1,717.3 | 1,864.8 |
| 4. අනෙකුත් වත්කම් | 2,358.2 | 2,638.9 | 3,304.5 | 3,289.7 | 3,516.8 |
| එකතුව | 9,021.1 | 9,834.3 | 10,867.3 | 11,072.6 | 11,873.5 |
| මහ බැංකුවේ වලංගු බලපත්‍ර සහිත මූල්‍ය සමාගම් | 24 | 24 | 24 | 24 | 24 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.76 සංඛ්‍යා සටහන
## වණික් බැංකු කටයුතුවල ප්‍රගතිය 1993 - 1994

රුපියල් දශලක්ෂ

| | 1993 | 1994* |
|---|---|---|
| 1. කල් බදු මගින් උපයන ලද ආදායම | 168.5 | 289.9 |
| 2. වාණිජ බිල්පත් වට්ටම් කිරීමෙන් ලද පොළිය | 168.4 | 275.5 |
| 3. මූල්‍ය සහ අලෙවි උපදේශක සේවා | 13.3 | 7.2 |
| 4. ප්‍රාරක්ෂණ කොමිස් මුදල් | 10.6 | 18.3 |
| 5. රක්ෂණ කොමිස් මුදල් | 3.1 | 1.5 |
| 6. ආන්තික වෙළඳුම මත පොළි | 11.9 | 52.9 |
| 7. කොටස් ආයෝජන මත පොළි | 35.9 | 175.9 |
| 8. භාණ්ඩාගාර බිල්පත් මත පොළී | 11.1 | 85.4 |
| 9. අනෙකුත් ආදායම් | 106.8 | 243.9 |
| එකතුව | 529.6 | 1,150.5 |

* තාවකාලික

මූලයන් : මර්වන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්;
පීපල්ස් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්;
සෙලාන් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්;
වණික් ඉන්කෝපරේෂන් ලිමිටඩ්;
ඒෂියා කැපිටල් ලිමිටඩ්.

සමඟ සංචිත ඇතුලත් ප්‍රාග්ධන අරමුදල් රුපියල් දශලක්ෂ 1,335 ක සිට රුපියල් දශලක්ෂ 2,184 ක් දක්වා වැඩි විය. මේ අතර, අතැති මුදල් සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු ඇතුලත් ද්‍රවශීල වත්කම් වැඩිවීමේ හේතුවෙන් මුළු තැන්පතු මත ද්‍රවශීල වත්කම් ප්‍රමාණය 1993 වර්ෂයේදී සියයට 19 ක සිට 1994 වර්ෂය අවසාන වන විට සියයට 21.5 දක්වා වැඩි විය. කෙසේ වුවද, රජයේ සුරැකුම්පත් හි මුළු ආයෝජන, මුළු තැන්පතු වලින් සියයට 11.7 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ අර්බුදවලට ලක්වූ මූල්‍ය සමාගම්වල තැන්පතු වගකීම් සඳහා සහන සැලසීම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මූල්‍ය සමාගම් 2 ක් සඳහා රුපියල් දශලක්ෂ 263 ක මුදල් ප්‍රමාණයක් වර්ෂය තුළදී සපයන ලද අතර ප්‍රතිමූල්‍ය ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 4 ක් විය. ඒ අනුව මහ බැංකුව විසින් සපයන ලද නොපියවා පැවති මුළු ප්‍රතිමූල්‍ය පහසුකම්, රුපියල් දශලක්ෂ 2,045 ක සිට 1994 අවසානයේදී රුපියල් දශලක්ෂ 2,304 ක් දක්වා වැඩිවිය.

## විශේෂිත මූල්‍ය ආයතන

### වාණිජ බැංකු

1994 වර්ෂය වාණිජ බැංකු කටයුතුවල ශක්තිමත් ක්‍රියාවලියක් පෙන්නුම් කළ තවත් වර්ෂයක් ලෙසින් වාර්තාගත විය. "සීමාසහිත ඒෂියා කැපිටල් සමාගම" නම් වූ තවත් සමාගමක් පිහිටුවීමත් සමග 1994 වර්ෂය අවසාන වන විට ක්‍රියාකාරී මුළු වාණිජ බැංකු සංඛ්‍යාව 5 ක් දක්වා වැඩි විය.

වාණිජ බැංකුවල මුළු ආදායම සියයට 117 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 1,151 ක් විය. 1993 වර්ෂයේ දි මෙහි වැඩිවීම වූයේ සියයට 69 කිනි. මෙම ආදායම් වැඩිවීම මූලික වශයෙන් ම කල්බදු ගැනීම් (රුපියල් දශලක්ෂ 121), වෙළෙඳ බිල්පත් වට්ටම් කිරීම ( රුපියල් දශලක්ෂ 107) සහ කොටස් විකිණීම්වල ලාභාංශ (රුපියල් දශලක්ෂ 140) යනාදියෙන් ලද ආදායම් ඉහළ යාම හේතුවෙන් සිදුවූවකි.

### කල්බදු සමාගම්

කල්බදු කටයුතුවල පමණක් නියැලුන මුළු සමාගම් සංඛ්‍යාව 3 ක් ලෙසින් නොවෙනස්ව පැවතුණි. "ලංකා ඔරෙක්ස් ලීසින් කම්පැණි ලිමිටඩ්" "කොමර්ෂල් ලීසින් කම්පැණි ලිමිටඩ්" සහ "මර්කන්ටයිල් ලීසින් කම්පැණි ලිමිටඩ්" මෙම සමාගම් විය. මෙම සමාගම්වල මුළු වත්කම් ප්‍රමාණය 1993 වර්ෂය අවසානයේ දි රුපියල් දශලක්ෂ 2,162 ක සිට 1994 වර්ෂය අවසානයේ දී රුපියල් දශලක්ෂ 2,956 ක් දක්වා වැඩි වූ අතර සපයන ලද කල්බදු මූල්‍ය ප්‍රමාණය 1993 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 1,134 ක සිට 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 1,918 ක් දක්වා රුපියල් දශලක්ෂ 784 කින් වැඩි විය.

උපකරණ වර්ගීකරණය අනුව, අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් උපයෝගී කරගනු ලැබූයේ වාණිජමය කටයුතුවල නිරත වන වාහන (රුපියල් දශලක්ෂ 1,056) මගී වාහන (රුපියල් දශලක්ෂ 347), යන්ත්‍ර සූත්‍ර (රුපියල් දශලක්ෂ 315) ආදිය සඳහාය. එක් එක් අංශයට ලබාදුන් කල්බදු පහසුකම් වශයෙන් බලන කල කර්මාන්ත (රුපියල් දශලලක්ෂ 408 ක්), වෙළෙඳ (රුපියල් දශලක්ෂ 915) ක් සහ සේවා (රුපියල් දශලක්ෂ 256) ක් යන උප අංශ සඳහා අරමුදල් යෙදවුණි.

## ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

ව්‍යවසායක ප්‍රාග්ධන සැපයුම්කරුවන් ලෙස ක්‍රියාත්මක මුළු සමාගම් සංඛ්‍යාව 1993 වර්ෂයේ දි 6 සිට 1994 වර්ෂයේ දි 7 ක් දක්වා වැඩි විය. දිගුකාලීන ණය සහ කොටස් ප්‍රාග්ධන නිකුතුත් මගින් ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්වලට ලැබුණු මුළු අරමුදල් ප්‍රමාණය 1994 වර්ෂය අවසානයේ දි සියයට 27 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 666 ක් විය. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් විසින් ව්‍යාපෘතීන් සඳහා කරන ලද ආයෝජනයන් 1994 වර්ෂයේදී දෙගුණයටත් වඩා වැඩි වී වර්ෂය අවසානයේ දී රුපියල් දශලක්ෂ 417 ක් විය. මෙම මුළු මුදලින් සියයට 44 ක් නව ක්‍රියාකාරී කටයුතු සඳහාත්, සියයට 20 ක් ව්‍යාපෘතීන් වැඩි දියුණු කිරීම සඳහාත්, සියයට 9 ක් පවරා ගැනීම් හෝ මිලට ගැනීම් සඳහාත් වූ අතර ඉතිරි සියයට 27 අනෙකුත් කටයුතු සඳහා විය. එක් එක් අංශයට ලබා දුන් පහසුකම් අනුව අරමුදල් වලින් සියයට 66 ක් නිෂ්පාදන අංශය සඳහාත් සියයට 20 ක් සේවා අංශයන් සඳහාත් ප්‍රදනය කරන ලද අතර සියයට 9 ක් කෘෂිකාර්මික අංශය යොමු විය.

## රක්ෂණ සමාගම්

ජීවිත රක්ෂණ සමාගමක් වන" සීමාසහිත ජනශක්ති ජීවිත රක්ෂණ සමාගම" වර්ෂය තුළ දී අළුතින් ආරම්භ කිරීමත් සමග රට, තුළ ක්‍රියාත්මක වන මුළු රක්ෂණ සමාගම් සංඛ්‍යාව 6 ක් දක්වා වැඩිවිය. ජීවිත රක්ෂණ මෙන් ම සාමාන්‍ය රක්ෂන කටයුතු ද වර්ෂය තුළ දී තවදුරටත් ව්‍යාප්ත විය.

රක්ෂණ සමාගම්වල ජීවිත රක්ෂනසහතික අරමුදලේ මුළු වටිනාකම 1993 වර්ෂය අවසානයේදි පැවති රුපියල් දශලක්ෂ 5,507 ක සිට 1994 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 7,731 ක් දක්වා වැඩි විය. රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 493,780 සිට 633,000 ක් දක්වා වැඩිවිය. ජීවිත රක්ෂණ වාරික ආදයම රුපියල් දශලක්ෂ 1,313 ක සිට රුපියල් දශලක්ෂ 2,031 ක් දක්වා වැඩිවිය. මේ අතර සාමාන්‍ය රක්ෂණ කටයුතු වලින් ලැබූ රක්ෂණ වාරික ආදයම, රුපියල් දශලක්‍ෂ 1,793 ක සිට රුපියල් දශලක්‍ෂ 2,359 ක් දක්වා වැඩිවිය. මුලු සමාන්‍ය රක්ෂණ වාරික ලැබීම් වලින් සියයට 51 ත් සඳහා දයක වෙමින් මෝටර් රථ රක්ෂණය, පසුගිය වර්ෂයේ දී මෙන්ම සාමාන්‍ය රක්ෂන අංශයේ ප්‍රධානතම අංශය බවට තවදුරටත් පැවතුණි. සාමාන්‍ය අනතුරු රක්ෂණය සියයට 26 කට දයක වෙමින් දෙවන කාණ්ඩය බවට පත් වූ අතර ගිනි රක්ෂණය සියයට 10 ක් සඳහා දයක විය.

# මුදල් වෙළෙඳපොළ

## සමස්ත උපනතීන්

මූල්‍ය ආයතන විසින් නව මූල්‍ය උපකරණ වෙළෙඳපොළට හඳුන්වා දීමත්, මුදල් වෙළෙඳපොළෙහි දැනට ගණුදෙනු වන මූල්‍ය උපකරණ භාවිතයෙහි දියුණුවත් සමඟ මුදල් වෙළෙඳපොළ කටයුතු 1994 වර්ෂය තුළ දී තවදුරටත් වර්ධනය විය. මෑත කාලයේ මුදල් වෙළෙඳපොළ පොළී අනුපාතිකය තීරණය වීම සම්බන්ධයෙන් ප්‍රධාන සාධකය ලෙස බලපානු ලැබුවේ භාණ්ඩාගාර බිල්පත්වල ඵලදයිතා අනුපාතිකයේ උච්චාවචනයන් ය. මූල්‍ය ක්ෂෙත්‍රයේ අධි ද්‍රවශීලතාව ඇද ගැනීමේ උපකරණයක් ලෙස නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම්පත්වල ඵලදයිතා අනුපාතිකය භාණ්ඩාගාර බිල්පත්වල ඵලදයිතා අනුපාතිකයේ වෙනස්වීම්වලට අනුකූලව යමින් භාණ්ඩාගාර බිල්පත් ඵලද අනුපාතිකයේ වෙනස්වීම්වලට අනුරූපව වෙනස්විය. වර්ෂය ආරම්භයේ දි ශුද්ධ විදේශීය වත්කම් විශාල වශයෙන් නොකඩවා රට තුළට ගලා ඒමත්, වර්ෂය අවසානයේ මෙම වත්කම්වල සාපේක්ෂ වශයෙන් ඇති වූ හීන වීමත් යන කරුණු මුදල් වෙළෙඳපොලේ ද්‍රවශීලතාවය කෙරෙහි බලපෑමක් ඇති කළ අතර, එම බලපෑම වෙළෙඳපොළ පොළී අනුපාතිකයන් වෙනස් කිරීම කෙරෙහි ද බලපෑවේය. 1993 ඔක්තෝබර් මස දී මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිළදී ගැනීමේ වෙළෙඳපොළෙහි කටයුතු මුදල් වෙළෙඳපොළෙහි කෙටිකාලීන පොළි අනුපාතිකයන් ක්‍ෂණිකව විශාල වශයෙන් පහළ යාම අඩු කිරීමට උපකාරී විය.

## 1.77 සංඛ්‍යා සටහන

# මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය (1992 - 1994)

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| කාලච්ඡේදය | ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ | | ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | | | | | ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ණයටදීම් ණයට ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවා පැවති ප්‍රමාණයන් (අ) | නොපියවා පැවති මුළු බිල්පත් | නිකුත් කළ ප්‍රමාණය | පිළිගත් ප්‍රමාණය (මිළදී ගැනීම්) | | | | මුළු විකුණුම් | මුළු මිළදී ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවා පැවති තත්ත්වය |
| | | | | | මහ බැංකුව | වාණිජ බැංකු | අනෙකුත් | එකතුව | | | |
| **1992** | | | | | | | | | | | |
| 1 කාර්තුව | 40,912 | 580 | 73,722.4 | 43,723.3 | 21,652.8 | 4,245.7 | 17,824.8 | 43,723.3 | 32,158 | 12,520 | 2,103 |
| 2 කාර්තුව | 58,123 | 1,265 | 76,967.7 | 65,821.3 | 38,341.5 | 8,591.3 | 18,888.5 | 65,821.3 | 41,328 | 10,832 | 1,927 |
| 3 කාර්තුව | 45,823 | 1,288 | 82,295.7 | 47,115.7 | 28,346.2 | 8,351.5 | 10,418.0 | 47,115.7 | 24,345 | 11,234 | 3,869 |
| 4 කාර්තුව | 62,307 | 1,458 | 87,095.7 | 38,147.9 | 20,851.9 | 12,722.0 | 4,574.0 | 38,147.9 | 21,535 | 15,026 | 3,696 |
| **1993** | | | | | | | | | | | |
| 1 කාර්තුව | 78,122 | 1,059 | 88,095.7 | 35,632.2 | 11,120.2 | 13,749.0 | 10,763.0 | 35,632.2 | 27,670 | 16,565 | 3,285 |
| 2 කාර්තුව | 100,584 | 1,571 | 92,495.7 | 50,735.9 | 16,610.9 | 20,467.0 | 13,658.0 | 50,735.9 | 27,026 | 13,000 | 3,962 |
| 3 කාර්තුව | 98,377 | 1,004 | 94,495.7 | 42,028.9 | 14,076.3 | 12,896.6 | 15,056.0 | 42,028.9 | 27,377 | 8,150 | 5,742 |
| 4 කාර්තුව | 97,907 | 1,192 | 97,195.7 | 30,459.3 | 6,394.0 | 17,622.5 | 6,422.8 | 30,459.3 | 12,690 | 9,136 | 2,777 |
| **1994** | | | | | | | | | | | |
| 1 කාර්තුව | 126,036 | 1,125 | 97,995.7 | 29,301.5 | 3,601.0 | 13,549.5 | 12,151.0 | 29,301.5 | 6,948.4 | 2,505.6 | 1,560 |
| 2 කාර්තුව | 88,612 | 2,144 | 98,095.7 | 36,151.6 | 4,147.4 | 22,885.1 | 9,119.0 | 36,151.6 | 5,546.2 | 5,792.2 | 2,688 |
| 3 කාර්තුව | 114,341 | 1,811 | 95,395.7 | 45,660.1 | 4.475.0 | 29,702.1 | 11,483.0 | 45,660.1 | 5,484.8 | 2,069.7 | 2,939 |
| 4 කාර්තුව | 139,475 | 1,242 | 98,895.7 | 57,255.3 | 7,880.8 | 35,812.5 | 13,562.0 | 57,255.3 | 3,208.3 | 9,097.0 | 1,415 |

(අ) සෑම කාර්තුවකම අවසාන සතියේදී නොපියවා පැවති ප්‍රමාණය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## අන්තර් බැංකු ඒක්ෂන මුදල් වෙළෙඳපොළ

1993 දී පැවැති අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ කටයුතුවල වූ වර්ධනය 1994 වර්ෂය පුරා ද පැවතුණි. කලින් වසරේ සියයට 81 කින් වර්ධනය වූ පිරිවැටුම 1994 වර්ෂයේදී සියයට 25 (රුපියල් දශලක්ෂ 468,464) කින් වර්ධනය විය. 1993 දෙසැම්බර් මාසයේ දී ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි සියයට 16.50 - 28.00 පරාසයක පැවැති පොළී අනුපාතික, 1994 ජූනි මස සියයට 2.50 -17.00 පරාසයකට පහත වැටුණ අතර එය තවදුරටත් 1994 සැප්තැම්බර් මාසයේ දී සියයට 0.25-14.00 දක්වා පරාසයකට පහත වැටුණි. සැප්තැම්බර් මාසයෙන් පසුව මෙම පොළී අනුපාතිකය ඉහළ යාමට පටන් ගත් අතර එය 1994 දෙසැම්බර් මාසයේ දී සියයට 14.00-28.00 පරාසයක් දක්වා වැඩි විය.

## භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

### (අ) ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

1993 වර්ෂයේ ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළට ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙහි මුළු වටිනාකම වූ රුපියල් බිලියන 158.9 හා සසඳන කළ1994 වර්ෂයේ දී එම වටිනාකම රුපියල් බිලියන 168.4ක් විය. රජයේ අයවැය කටයුතු සඳහා වර්ෂය තුළ නිකුත් කරන ලද නව නිකුතුවල වටිනාකම රුපියල් බිලියන 5.5 ක් වූ අතර රුපියල් බිලියන 3.8 ක් වටිනා බිල්පත් පියවනු ලැබිය. මේ අනුව 1994 වර්ෂය තුළ අලුතින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 1.7 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස දැනට නොපියවා ඇති භාණ්ඩාගාර බිල්පත්වල මුළු මුහුණත වටිනාකම 1993 අවසානයේ පැවති රුපියල් බිලියන 97.2 සිට 1994 වසර අවසානයට රුපියල් බිලියන 98.9 දක්වා ඉහළ නැගිණි. 1993 අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පැවැති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 3.9 ක 'වූ අතර එය 1994 සැප්තැම්බර් මාසය වන විට නොසැලකිය යුතු තරම් මට්ටමකට පහත වැටුණි. කෙසේ වුවද මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය අඩුවීමත්, වර්ෂය අවසාන කාර්තුවේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම වැඩිවීමත් යන කරුණු නිසා 1994 අවසානය වන විට මහ බැංකුව සතු නොපියවා ඇති බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 5.1 දක්වා ඉහළ නැගිනි. මෙය 1993 අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සතු ව පැවැති මුළු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වලින් සියයට 4.8 ක ප්‍රමාණයට සාපේක්ෂව 1994 අවසානයට සියයට 5.7 දක්වා වැඩි විය.1994 ප්‍රාථමික වෙළෙඳපොළට නිකුත් කල භාණ්ඩාගාර බිල්පත් වලින් රුපියල් බිලියන 20.1 (සියයට 11.9) ක් මහ බැංකුව විසින් මිලදී ගත් අතර රුපියල් බිලියන 101.9 (සියයට 60.6) ක් වාණිජ බැංකු විසින් ද, රුපියල් බිලියන 46.3 (සියයට 27.5) ක් අනෙකුත් ආයතන විසින් ද මිලදී ගන්නා ලදී. කෙසේ වුවත් අන්තර් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයන් පිළිබිඹු කරමින් 1994 අවසානය වන විට නොපියවන ලද මුළු භාණ්ඩාගාර බිල්පත් (නාමික වටිනාකම අනුව) මහ බැංකුව සතුව සියයට 5.7 ක් ද, වාණිජ බැංකු සඳහා සියයට 16.8 ක් ද අනෙකුත් අංශයන් සතුව සියයට 77.5 ක් ද ආදී වශයෙන් ව්‍යාප්තව පැවැතුණි.

### (ආ) මහ බැංකුවේ ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළෙහි විකුණන ලද (වට්ටම් කරන ලද) භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1994 දී තවදුරටත් පහත වැටිණි. පෙර වසරේ පැවැති රුපියල් බිලියන 94.8 ට සාපේක්ෂව 1994 විකුණන ලද මුළු බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 21.2 ක් විය. ද්විතීයික වෙළෙඳපොළෙහි බිල්පත් අලෙවිය මෙලෙස පහළ මට්ටමකට බැසීමට හේතු වූයේ මහ බැංකුව සතුව තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අඩුවීමත්, මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද නැවත මිළදී ගැනීමේ පහසුකම් වෙත වූ වැඩි නැඹුරුවත් යන සාධකයන්ය. විකුණුම් මත වූ ඵලදයිතා අනුපාතිකයන් ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදයිතා අනුපාතිකයන් සමඟ සම්බන්ධ වූ අතර එම නිසාම ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදායිතා අනුපාතයේ වෙනස්වීම් ස්වරූපය ද්විතීයික වෙළෙඳපොළේ ඵලදයිතා අනුපාතයේ වෙනස්වීම් සම්බන්ධයෙන් ද දක්නට ලැබුණි. මහ බැංකුව විසින් අලෙවි කරන ලද ත්‍රෛමාසික බිල්පත් සඳහා වූ ඵලදයික

අනුපාතය 1993 අග භාගයේ දී පැවැති සියයට 17.84 සිට 1994 මාර්තු අවසානය වන විට සියයට 12.90 දක්වා පහත වැටුන අතර 1994 ජූනි මස අවසානය වන විට සියයට 15.14 තෙක් ඉහළ නැගුණි. මෙම ඵලදායිතා අනුපාතිකය නැවත වරක් ජූනි මාසයෙන් පසුව පහත වැටුන අතර ඔක්තෝබර් මස අවසානය වන විට සියයට 11.33 දක්වා පහළ මට්ටමකට ළඟා විය. ප්‍රාථමික වෙළෙඳපොළෙහි ඵලදායිතා අනුපාතිකය ඉතා සීඝ්‍ර ලෙස ඉහළ යෑම හේතුකොටගෙන 1994 අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතියික වෙළෙඳපොළෙහි අලෙවි කරන ලද ත්‍රෛමාසික බිල්පතක ඵලදායිතා අනුපාතිකය සියයට 18.48 දක්වා වැඩිවිය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීයික වෙළඳපොළෙහි මිළදී ගන්නා ලද (ප්‍රතිවට්ටම්) බිල්පත්වල ඵලදායිතා අනුපාතිකය ද ඒ අයුරින්ම වෙනස්විය. 1993 අවසානයේදී පැවැති ප්‍රතිවට්ටම් කරන ලද ත්‍රෛමාසික බිල්පත් සඳහා වූ සියයට 20.84 ක් වූ ඵලදායිතා අනුපාතිකය 1994 ඔක්තෝම්බර් මස අවසානයේ දී සියයට 14. 83 දක්වා අඩු වුවත් 1994 වසර අවසානයේ දී එය සියයට 22.98 මට්ටමකට ළඟා විය.

## (ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිළදී ගැනීමේ වෙළෙඳපොළ

1993 ඔක්තෝම්බර් මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලද ප්‍රති මිළදී ගැනීමේ වෙළෙපොළ කටයුතු යටතේ වූ බිල්පත් අලෙවිය 1994 දී පුළුල් විය. ඒක්ෂන මුදල් වෙළෙඳපොළේ පොළී අනුපාතිකයන් ස්ථාවර කිරීමත්, විවට වෙළෙඳපොළ කටයුතු සඳහා උපකරණයක් ලෙස යොද ගැනිමත් යන ප්‍රධාන අරමුණු දෙක 1994 දී යම් තරමකට ඉටුකර ගැනිම සම්බන්ධයෙන් මෙම උපකරණය ප්‍රයෝජනවත් විය. කෙසේ නමුත් ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පැවැති භාණ්ඩාගාර බිල්පත් අඩුවී යාම මෙම වෙළෙඳපොළෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි නිරන්තරව බලපෑ බාධකයක් විය. මුදල් වෙළෙඳපොළෙහි ඉහළ ද්‍රවශිලතාවයක් පැවැති තත්වයක් යටතේ ප්‍රති මිළදී ගැනීමේ වෙළෙඳපොළ කටයුතු වඩා ඵලදායක විය.

ප්‍රති මිලදී ගැනීමේ වෙළෙඳපොළ තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1994 දී අලෙවි කරන ලද මුළු බිල්පත් ප්‍රමාණයේ පිරිවැටුම රුපියල් බිලියන 230.9 ක් වූ අතර 1993 මෙම වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය පැවැති මාස 3 තුළ මුළු පිරිවැටුම රුපියල් බිලියන 38.9 ක් විය. මෙම වෙළෙඳපොළෙහි එක් දිනක් සඳහා අදළ වන පොළී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන අතර ඒ සඳහා භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි පවත්නා පොළී අනුපාතිකය ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පවත්නා ද්‍රවශිලතාවය සහ පොදු ආර්ථික ක්‍රියාකාරිත්වය යන සාධක මහ බැංකුව විසින් සැලකිල්ලට ගනු ලැබීය. 1993 අවසානයේ සියයට 16.5 ක්ව පැවැති එක් දින පොළී අනුපාතිකය 1994 ජූනි මස අවසානය වන විට සියයට 11.5 දක්වා ක්‍රමයෙන් අඩු කරන ලදි. එය 1994 ජූනි හා අගෝස්තු මාසවල සුළු වශයෙන් වැඩි කරන ලද අතර නැවත සැප්තැම්බර් මාසයේ සියයට 10.00 දක්වා අඩු කරන ලදි. ඒක්ෂණ මුදල් වෙළෙඳපොළේ පැවැති හිඟ ද්‍රවශිලතා තත්වය සහ මහ බැංකුව විසින් මූල්‍ය පාලනය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග නිසා ප්‍රති මිළදී ගැනීමේ වෙළෙඳපොළ පොළී අනුපාතිකය 1994 අවසාන මාස දෙක තුළ අවස්ථා කිපයකදී ඉහළ දමන ලද අතර වර්ෂය අවසානයේ දී එය සියයට 20.00 මට්ටමක ළඟා වි තිබුණි.

## මහ බැංකු සුරැකුම්පත්

මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සීමිතව පැවති තත්වයක් යටතේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපකරණයක් ලෙස මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම 1994 දී කවදුරටත් සිදු විය. වර්ෂයේ ප්‍රථම භාගය තුළ හය මසකින් කල්පිරෙන බිල්පත් නිකුත් කරන ලද අතර වසරේ දෙවන භාගයේ දී නිකුත් කරන ලද බිල්පත් ප්‍රධාන වශයෙන් තුන් මසකින් කල්පිරෙන ඒවා විය. මහ බැංකු සුරැකුම්පත්වල ඵලදායිතා අනුපාතය භාණ්ඩාගාර බිල්පත්වල ඵලදායීතා අනුපාතයට අනුරූපව වෙනස් විය. මහ බැංකුවේ සුරැකුම්පත් මත නොපියවූ වගකීම් ප්‍රමාණය 1993 අවසානයේ පැවැති රුපියල් දශලක්ෂ 2,155 සිට 1994 අවසානයේ පැවැති රුපියල් දශලක්ෂ 3,740 දක්වා වැඩිවිය.

## අන්‍යොන්තර විදේශීය විනිමය වෙළෙඳපොළ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි මැදිහත් මූල්‍ය ඒකකය වන ඇමෙරිකානු ඩොලරයෙහි මිළදී ගැනීම් හා විකිණීම් සඳහා අදළ වන එතැන් විනිමය අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම 1994 වර්ෂයේ දී ද සිදු කරන ලදී. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගයෙහි ඉහළයාම නිසා 1993 අවසානයේ දී රුපියල් 49.31 පැවැති ඩොලරය මිළදී ගැණුම් අනුපාතය 1994 අප්‍රේල් අවසානය වන විට රු. 48.79 දක්වා අඩුවිය. ඇමෙරිකානු ඩොලරයෙහි විකුණුම් මිළ මෙම කාලය තුළ රුපියල් 49.80 සිට රුපියල් 49.28 දක්වා පහත වැටුණි. 1994 අප්‍රියෙල් මාසයෙන් පසුව එහි අගය පහත වැටුනු නමුත් 1994 ජුනි මස සහ ඔක්තෝම්බර් මාසයෙන්හි රුපියලෙහි අගය යම් තරමකට වැඩි විය. දෙසැම්බර් මස අග භාගයේ දි ඩොලරය මිළදී ගන්නා අනුපාතය රු.49.73 ක් වූ අතර අලෙවි කරන අනුපාතය රු.50.23 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1994 දි මිලදී ගන්නා ලද විදේශ විනිමය ප්‍රමාණයෙහි වටිනාකම ඩොලර් මිලියන 652 ක් වූ අතර එය 1993 තුළ මිළදි ගත් වටිනාකම වූ ඩොලර් මිලියන 642 හා සාපේක්ෂව බලන විට සියයට 2 ක ඉහළ යාමකි. මහ බැංකුව විසින් අළෙවි කරන ලද විදේශ විනිමයෙහි වටිනාකම 1993 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 20 සිට 1994 දි අමෙරිකානු ඩොලර් මිලියන 12 දක්වා සියයට 38 කින් අඩු විය.

## අක්වෙරළ වෙළෙඳපොළ

වාණිජ බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි ක්‍රියාකාරිත්වයෙහි 1993 වසරේ ඇති වූ ආන්තික පසුබැස්ම හා සසඳන විට 1994 දි සියයට 15 කින් පමණ වර්ධනය විය. ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මක වන විදේශීය ව්‍යවහාර මුදල් ඒකක 23 හි වත්කම්/වගකීම්වල මුළු වටිනාකම 1993 අවසානයේ පැවැති ඇමෙරිකානු ඩොලර් (ඇ.ඩො.) මිලියන 1,135 සිට 1994 දී ඇ. ඩො. මිලියන 1,304 දක්වා වැඩි විය. මෙම බැංකු ශාඛාවල වත්කම් අංශය සලකා බලන විට අනේවාසිකයන්ට සපයන ලද ණය සහ අත්තිකාරම්වල වටිනාකම ඇ.ඩො. මිලියන 540 දක්වා සියයට 18.6 කින් ඉහළ ගිය අතර නේවාසිකයන්ට සපයන ලද ණය සහ අත්තිකාරම්වල වටිනාකම ඇ.ඩො. මිලියන 725 දක්වා සියයට 14.6 කින් වර්ධනය විය. නේවාසික අංශය සලකා බලන කල ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යාපාර සඳහා ලබාදෙන ලද අත්තිකාරම්වල වටිනාකම සියයට 28.7 කින් වර්ධනය වූ අතර දේශීය ව්‍යාපාරයන් සඳහා ලබා දෙන ලද අත්තිකාරම්වල වටිනාකම සියයට 15.5 කින් පහත වැටුණි. වගකීම් අංශයෙන් සලකා බලන විට අනේවාසිකයිනගේ තැන්පතුවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 665 දක්වා සියයට 10.6 වර්ධනය වූ අතර නේවාසිකයන්ගේ තැන්පතු වටිනාකම ඇ. ඩො. මිලියන 537 දක්වා සියයට 22.0 කින් වර්ධනය විය.

## තැන්පතු සහතික

වාණිජ බැංකු සහ මූල්‍ය සමාගම් 1994 තුළ තැන්පතු සහතික නිකුත් කිරීම තවදුරටත් සිදු කරන ලදී. 1993 අවසානයේ දි රුපියල් දශලක්ෂ 5,045 ක් ව පැවැති වාණිජ බැංකු හා මූල්‍ය සමාගම් විසින් නිකුත් කරන ලද නොපියවා පැවැති තැන්පතු සහතිකවල මුළු වටිනාකම 1994 අවසානය වන විට රුපියල් දශලක්ෂ 6,592 දක්වා සියයට 31 කින් වර්ධනය විය. මෙම සහතිකපත් සඳහා වාණිජ බැංකු විසින් ගෙවන ලද පොළී අනුපාතය 1993 පැවැති සියයට 14 - 21 දක්වා පරාසයේ සිට 1994 දී සියයට 9-22 පරාසයක් දක්වා වෙනස් විය. 1994 මූල්‍ය සමාගම් විසින් තැන්පතු සහතික සඳහා ගෙවන ලද පොළී අනුපාතික සියයට 16 - 22 අතර පරාසයක පැවැති අතර එය 1993 පැවැති පොළී අනුපාතික පරාසයට සමාන විය.

## නව ණය උපකරණ

1994 තුළ දී, වත්කම් මත පදනම් වූ නව ණය උපකරණයක් වන භාණ්ඩාගාර බිල්පත් මත පදනම් සුරැකුම්පත් හඳුන්වා දෙන ලදී. මෙම නව සුරැකුම්පත්වල විශේෂ ලක්ෂණය වන්නේ එම සුරැකුම්පත් නිකුත් කරන්නා සතුව පවතින රජයේ භාණ්ඩාගාර බිල්පත් මගින් එහි ආරක්ෂාව සහතික කිරීමයි. භාණ්ඩාගාර බිල්පත් මත පදනම් වූ සුරැකුම්පත්හි මුල් නිකුතුවේ වටිනාකම රුපියල් දශලක්ෂ 192 ක් වූ අතර එහි කල්පිරෙන කාලසීමාව එක් අවුරුද්දක් විය.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ

විදේශ ප්‍රාග්ධනය තවදුරටත් ගලාඒමේ බලපෑම යටතේ වසර ආරම්භයේ දී කොටස් වෙළෙඳපොළ දිගින් දිගට වර්ධනය වුව ද, ඉන්පසු මාසයන්හි දී ජාතික මැතිවරණ හා බටහිර ආර්ථිකයන්හි පොළී අනුපාත ඉහළයෑමේ උපනතියක් සහිත පසුබිමක් තුළ, වෙළෙඳපොළෙහි පසුබෑස්මක් දක්නට ලැබුණි. 1993 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී 979.0 සිට 1994 වසරේ පෙබරවාරි මස අවසානයේ දී 1375.1 දක්වා සියයට 40 කට අධික ප්‍රමාණයකින් වර්ධනය වූ කොළඹ කොටස් හුවමාරුවේ සමස්ත කොටස් මිල දර්ශකය, පස් මාසයක් තුළ පහත වැටිණි. මෙම දර්ශකය 1994 වසරේ දී ජූලි මස අවසානයේදී 976.5 දක්වා සියයට 29 කින් අඩුවිය. අගෝස්තු හා සැප්තැම්බර් මාස තුළ තත්වය සුළු වශයෙන් යහපත් අතට හැරුන ද, මෙය කෙටිකාලීන වර්ධනයක් විය. වසරේ අවසාන කාර්තුව තුළ කොටස් මිළ නැවතත් පහත වැටුණි. වසර අවසානයේ දී සමස්ත කොටස් මිළ දර්ශකයේ අගය 986.7 විය.

1993 වසරේ සියයට 62 ( දර්ශක අංක 374) ක වර්ධනයක් වාර්තා කළ සමස්ත කොටස් මිළ දර්ශකය 1994 වසරේ සියයට 1 ( දර්ශක අංක 8) කට අඩු ප්‍රමාණයක වර්ධනයක් වාර්තා කළේය. 1993 වසරේ දී සියයට 75 කින් (දර්ශක අංක 615) කින් ඉදිරියට ගමන් කළ සංවේදී මිළ දර්ශකය, 1994 වසරේදී සියයට 0.3 (දර්ශක අංක 04) ක ආන්තික අඩුවීමක් දැක්විය. අළෙවි කළ කොටස් සංඛ්‍යාව හා එම කොටස්වල වටිනාකම අනුව බලන කල 1994 වසරේදී දෙවැනි භාගයට වඩා ප්‍රථම භාගය තුළදී කොටස් වෙළෙඳපොළේ වැඩි ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබිණ. කෙසේ වුව ද, සමස්තයක් වශයෙන් 1994 වසර ගත්කල කොටස් වෙළෙඳපොළෙහි කොටස් විකිණීමේ වාතාවරණයක් පැවතුණ නමුත්, 1993 වසරට වඩා සැලකියුතු ප්‍රමාණයකින් 1994 වසරේ කොටස් වෙළෙඳපොළේ ක්‍රියාකාරිත්වය වැඩිවිය. අළෙවි කළ කොටස්වල වටිනාකම 1993 වසරේ රුපියල් දශලක්ෂ 18,579 සිට 1994 වසරේ රුපියල් දශලක්ෂ 34,522 දක්වා වැඩි විය. අලෙවි කරන ලද කොටස් සංඛ්‍යාව 1993 වසරේ දශලක්ෂ 351 සිට 1994 වසරේ දශලක්ෂ 506 දක්වා .වැඩිවිය. 1993 වසර අවසානයේ දී රුපියල් බිලියන 123.8 ක් වූ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 1994 පෙබරවාරි මසදී අවසානය වන විට රුපියල් බිලියන 175.8 ක් දක්වා වැඩි වී වර්ෂය අවසානයේදී රුපියල් බිලියන 143.2 ක් විය.

1994 වසර තුළ තවත් සැලකියයුතු වර්ධනයක් වූයේ ශ්‍රී ලාංකික ආයතනයක් මගින් ප්‍රථම වරට එ. ජ. ඩොලර් දශලක්ෂ 33 ක වටිනාකමකින් යුතු ලෝක ව්‍යාප්ත නැන්පතු ලදුපත් නමින් යූරෝ නිකුතුවක් මාර්තු මස තුළ නිකුත් කිරීමයි. "ද සිලෝන් ෆන්ඩ්" නැමැති අරමුදලට ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීමට අවසර දීමත් සමඟ ලංකා කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීමට අවසර ලත් දේශ අරමුදල් සංඛ්‍යාව 1994 වසර අවසානයේ දී 4 දක්වා වැඩි විය. ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කිරීමට අවසර ලත් කලාපීය අරමුදල් සංඛ්‍යාව 1994 වසර අවසානයේ දී 195 ක්ව පැවතිණි.

## ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ

කොටස් මිළ දර්ශකවල සමස්ත වර්ධනයක් 1994 වසරේ දී ඇති නොවුවද, 1993 වසරේ දී වූ නව නිකුතු හා සසඳන විට මෙම වසරේ නව නිකුතු 15 ක් විය. 1994 වසරේ සිදුවූ නව නිකුතු වලින් 14 ක් ආරම්භක පොදු මහජන නිකුතුන් වූ අතර, එක් නිකුතුවක් පවතින ලැයිස්තුගත සමාගමක් විසින් කරන ලදී. නව නිකුතු සඳහා නිකුත් කිරීමේ සම මිළ (රු.10.00 සිට 100.00)

එනම් රු.90.00ක අධිභාරයක් සහිතව) දක්වා පරාසයක් තුළ පැවතිණි. කොටස් වෙළෙඳපොළේ අපේක්ෂිත අනාගත ක්‍රියාකාරිත්වය පිළිබඳ ආයෝජකයින් තුළ පැවති අදහස වසරේ ප්‍රථම කාර්තු තුන තුළ කරන ලද සියළුම නව නිකුතු විශාල ලෙස අධි දයකත්වයක් පෙන්නුම් කිරීමෙන්, (එක් අවස්ථාවක දී දයකත්වය වෙළෙඳපොළ නිකුතු මිල මෙන් 42 ගුණයකට වඩා වැඩි විය.) හා අවසාන කාර්තුව තුළ කරන ලද නිකුතු අව දයකත්යක් පෙන්නුම් කිරීමෙන්, යම් සේ ඇගයීමට හැකිය. 1993 වසරේ දී වූ නිකුතුන් හි කොටස් දශලක්ෂ 49.0 (මුළු සම වටිනාකම රුපියල් දශලක්ෂ 490.5) හා සසඳන විට 1994 වසරේ නිකුතුන් හි මුළු කොටස් ප්‍රමාණය දශ ලක්ෂ 139.4 ක් (මුළු සම වටිනාකම රුපියල් දශලක්ෂ 1,394.0) ක් විය. 1993 වසරේ රුපියල් දශලක්ෂ 1,246.8 ක මුළු වෙළෙඳපොළ නිකුතුන් හි වටිනාකමක් හා සසඳන විට 1994 වසරේ මුළු වෙළෙඳපොළ නිකුතුන් හි වටිනාකම රුපියල් දශලක්ෂ 3,075.0 විය. 1993 වසරේ මෙන් ම නව නිකුතුවන්හී වැඩි ප්‍රමාණයක් බැංකු, මූල්‍ය හා රක්ෂණ උප කාණ්ඩය මගින් නිකුත් කරන ලදී.

## ද්විතියික වෙළෙඳපොළ

වසරේ පළමු දෙමාසය තුළ 1993 දී ද්විතියික වෙළෙඳපොළ අත්කරගත් වර්ධනය තවදුරටත් පැවතුණි. සමස්ත මිළ දර්ශකය 1993 දෙසැම්බර් මස අවසානයේ දී පැවති 979 න් 1994 පෙබරවාරි අවසන් වන විට 1,375.1 (සියයට 40.5) ක් දක්වා වැඩි වී තිබුණු අතර, සංවේදී මිළ දර්ශකය දෙසැම්බර් අග පැවැති 1,442.4 න් පෙබරවාරි අගදී 2,093.8 දක්වා (සියයට 45.2) වැඩිවී තිබුණි. එසේ වුව ද, ඉන්පසු දර්ශක දෙකම පහත වැටීම ආරම්භ විය. ජූලි මස අවසන් වන විට සමස්ත මිළ දර්ශකය පෙබරවාරි මට්ටමින් සියයට 29 (979.5 දක්වා) කින් පහත වැටී තිබුණු අතර, සංවේදී දර්ශකය සියයට 30.5 කින් (1,455.1) දක්වා පහත වැටුණි. අගොස්තු හා සැප්තැම්බර් මාසය තුළ වෙළෙඳපොළ මඳ වශයෙන් යථා තත්වයට පැමිණියද, වසරේ අවසාන කාර්තුව තුළ කොටස් මිළ මට්ටම්හි පහත වැටීම නැවතත් ඇරඹිණි. 1994 වසර අවසන් වන විට සමස්ත මිළ දර්ශකයේ අගය 986.7 ක්ව(1993 අවසානයේ දි වූ මට්ටමින් සියයට 0.8 ක් ඉහළින්) පැවතුණු අතර, සංවේදී මිළ දර්ශකයේ අගය 1,438.8ක් (1993 අවසානයේ දි මට්ටමින් සියයට 0.3 ක් පහළින්) විය. වසරේ වැඩි කාලයක් තුළ මිළ දර්ශකයන්හි විචලනය වෙළෙඳපොළ දිරිමත් නොකළ නමුත් 1994 වසර තුළ දී වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය 1993 වසරට වඩා සැළකියයුතු ප්‍රමාණයකින් ඉහළ පැවතිණ. අලෙවි කළ කොටස්වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 34,522 වූ අතර මෙය 1993 මට්ටමට වඩා සියයට 86 ක වැඩිවීමකි. ගණුදෙනු වූ කොටස් සංඛ්‍යාව 1993 දි දශලක්ෂ 351 සිට 1994 දී දශලක්ෂ 506 ක් දක්වා සියයට 44.2 කින් වැඩි විය.

1994 වසරේ දී වෙළෙඳපාළ තුළ කොටස් මිළෙහි පහත වැටීමට හේතු වූයේ විදේශීය ආයෝජකයන්ගේ මිළදී ගැනීම් අඩුවීමය. 1993 වසරේ හා 1994 වසරේ පළමු මාස දෙක තුළ මිල දර්ශකයන්හී වේගවත් ඉහළ යැමට හේතු වූයේ විජාතික ආයෝජකයින්ගෙන් වෙළෙඳපොළට පැමිනි අරමුදල්ය. 1993 දි මුළු පිරිවැටුමෙන් සියයට 51 ක් විජාතික මිළදී ගැනීම් වූ අතර, මුළු පිරිවැටුමෙන් සියයට33 ක් විජාතික විකිණීම් විය. විජාතික මිළදී ගැනීම්, විජාතික විකිණීම් මෙන් සියයට 155 ක් විය. එසේ ම, 1994 ජනවාරි සිට පෙබරවාරි කාල පරිච්ඡේදය තුළ දී විජාතික මිළ දී ගැනීම් මුළු පිරිවැටුමෙන් සියයට 45 ක් වූ අතර විජාතික විකිණීම් පිරිවැටුමෙන් සියයට 28ක් විය. විජාතික මිළදී ගැනීම්, විජාතික විකිණීම් මෙන් සියයට 159 ක් විය. එසේ වුවද පෙබරවාරි මාසයට පසුව ලංකාවෙහි පැවැති දේශපාලන අවිනිශ්චිත භාවයේ බලපෑම මෙන් ම ලෝකයේ දියුණු මූල්‍ය වෙළෙඳපොළවල්හී පැවැති පොළී අනුපාතයන් ඉහළ යෑමේ බලපෑම නිසා, විජාතික මිළදී ගැනීම් අඩුවිය. සමස්තයක් වශයෙන් වසර සැලකූ කළ, විජාතික මිළදි ගැනීම් මුළු පිරිවැටුමෙන් සියයට 42 ක් වූ අතර, විජාතික විකිණීම් මුළු පිරිවැටුමෙන් සියයට 38 ක් විය. විජාතික මිළදී ගැනීම් විජාතික විකිණීම් මෙන් සියයට 110 ක් විය.

වටිනාකම අනුව බලන කළ, බැංකු මූල්‍ය හා රක්ෂණ උප කාණ්ඩ වඩාත් ම ගණුදෙනු කරන ලද සමාගම් උප කාණ්ඩය ලෙස තවදුරටත් පැවතුණි. මුළු පිරිවැටුමෙන් සියයට 42 ක් මෙම උප කාණ්ඩය අත්කර ගත්තේය. නිෂ්පාදන උප කාණ්ඩය මුළු පිරිවැටුමෙන් සියයට 23 ක ට දයක විය. ගණුදෙනු කරන ලද කොටස් සංඛ්‍යාව අනුව බලන කළ, ගණුදෙනු වූ මුළු කොටස් සංඛ්‍යාවට සියයට 29 ක් දයක වූ බැංකු මූල්‍ය හා රක්ෂණ උප කාණ්ඩ වඩාත් ම ක්‍රියාකාරී වූ උප කාණ්ඩය වූ අතර, නිෂ්පාදන උප කාණ්ඩය ගණුදෙනු වූ මුළු කොටස් ප්‍රමාණයට සියයට 25 ක් දයක විය.

## ඒකක භාර

ශ්‍රී ලංකාව තුළ ඒකක භාර හතරක් තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පැවතිණ. මෙම ඒකක භාරයන් හතරෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම 1993 අවසානයේදී පැවති රුපියල් දශලක්ෂ 3,566 සිට සියයට 10.7 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 3,947 විය. 1993 වසරේ ශුද්ධ වත්කම් වටිනාකමෙහි වැඩිවීම සියයට 83.5 ක් විය. මෙම අඩු වූ වර්ධනයෙන් වසර දෙක තුළ කොටස් මිළ ගණන්වල සිදුවූ වෙනස්කම් පිළිබිඹු වේ. ඒකක භාරයන්හි මුළු වත්කම් වලින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ආයෝජනය වූ ප්‍රමාණය සියයට 64 ක් ලෙස 1994 වසරේ පැවතිණි.

1.78 සංඛ්‍යා සටහන

## කොටස් වෙළෙඳ පොළ දර්ශකයන් 1991 - 1994

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 |
|---|---|---|---|---|
| 1. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය(දෙසැ.31 දිනට) (රුපියල් දශලක්ෂ) | 81,840 | 66,200 | 123,789 | 143,210 |
| 2. නව නිකුතුන් සංඛ්‍යාව | 6 | 12 | 12 | 15 |
| 3. නිකුත් කළ මූළ් කොටස් සංඛ්‍යාව | 12.51 | 78.24 | 49.05 | 139.4 |
| 4. නිකුත් කළ කොටස්වල වටිනාකම (රුපියල් දශලක්ෂ) | 326 | 1,370.1 | 1,246.8 | 3,075.0 |
| 5. අලෙවි කළ කොටස් සංඛ්‍යාව (දශලක්ෂ) | 79 | 88 | 351 | 506 |
| 6. අලෙවි කළ කොටස්වල වටිනාකම (රුපියල් දශලක්ෂ) | 4,304 | 4,969 | 18,579 | 34,522 |
| 7. මිල දර්ශක-සියළු කොටස් මිල දර්ශකය දෙසැම්බර් 31 වැනි දිනට | 837.79 | 605.31 | 978.97 | 986.73 |
| සංවේදී කොටස් මිල දර්ශකය දෙසැම්බර් 31 වැනි දිනට | 1,198.60 | 826.57 | 1,442.44 | 1,438.82 |

මූලය : කොළඹ කොටස් හුවමාරුව.

1.79 සංඛ්‍යා සටහන

## 1991 - 1994 වර්ෂ තුළ ආයෝජන වර්ගය අනුව නිකුත් කරන ලද නව කොටස් ගණන

| ආයෝජන වර්ගීකරණය | 1991 | 1992 | 1993 | 1994 |
|---|---|---|---|---|
| බැංකු මූල්‍ය හා රක්ෂණ | 2 | 1 | 3 | 6 |
| බීම වර්ග. ආහාර හා දුම්කොළ | - | 2 | - | 3 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | - | - | - | - |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | - | - | - | - |
| පාවහන් හා රෙදිපිළි | 1 | 1 | - | 1 |
| හෝටල් හා සංචාරක | 1 | 2 | 4 | - |
| ආයෝජන භාර | - | - | - | - |
| ඉඩම් හා දේපල | - | - | - | 1 |
| නිෂ්පාදන | 1 | 3 | 2 | 4 |
| මෝටර් රථ | - | - | 1 | - |
| ඔයිල් පාම් | - | - | - | - |
| සේවා | - | 1 | - | - |
| ගබඩා හා සැපයුම් | - | - | - | - |
| වෙළඳ | 1 | 2 | 2 | - |
| එකතුව | 6 | 12 | 12 | 15 |
| ඉදිරිපත් කළ කොටස් ගණන (දශ ලක්ෂ) | 12.51 | 78.24 | 49.05 | 139.4 |
| ඉදිරිපත් කළ කොටස්වල වටිනාකම (සම අගය) (රුපියල් දශ ලක්ෂ) | 158.14 | 377.4 | 490.5 | 1,394.0 |

මූලය : කොළඹ කොටස් හුවමාරුව.

1.80 සංඛ්‍යා සටහන

## 1994 වර්ෂය තුළ දී සමාගම් විසින් සිදු කරන ලද නව කොටස් නිකුතුන්

| සමාගමේ නම | ඉදිරිපත් කළ කොටස් ගණන | සම අගය (රුපියල්) | අධි මිල (රුපියල්) | ඉදිරිපත් කළ කොටස් වටිනාකම | දායක වූ කොටස් වල ගණන | දායක වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| පීපල්ස් මර්චන්ට් බැන්ක් ලිමිටඩ් | 3,125,000 | 10 | 10 | 62,500,000 | 131,673,423 | 102,919 |
| ලංකා වෝල්ටයිල්ස් ලිමිටඩ් | 8,000,000 | 10 | 40 | 400,000,000 | 193,394,800 | 7,840,000 |
| කොකො ලංකා ලිමිටඩ් | 1,000,000 | 10 | 15 | 25,000,000 | 10,255,400 | 20,650 |
| රෝයල් සෙරමික්ස් ලංකා ලිමිටඩ් | 6,400,000 | 10 | 20 | 192,000,000 | 218,180,200 | 64,339 |
| ඉක්විටි වූ ලිමිටඩ් | 1,550,000 | 10 | 10 | 31,000,000 | 4,516,000 | 5,740 |
| වේයන්ගොඩ ටෙක්ස්ටයිල් මිල්ස් ලිමිටඩ් | 7,500,000 | 10 | 08 | 135,000,000 | 13,457,461 | 17,217 |
| ෆර්න්ට් ලිමිටඩ් | 2,000,000 | 10 | 20 | 60,000,000 | 5,936,500 | 2,757 |
| සී. එෆ්. වෙන්චර් ෆන්ඩ් ලිමිටඩ් | 3,333,593 | 10 | 05 | 50,003,895 | 34,149,393 | 20,456 |
| ඒෂියා කැපිටල් ලිමිටඩ් | 25,000,000 | 10 | 20 | 750,000,000 | 48,912,600 | 10,077 |
| ෆෝබර්ස් සිලෝන් ලිමිටඩ් | 62,500,000 | 10 | 0 | 625,000,000 | 74,682,800 | 15,038 |
| සිලෝන් ග්ලාස් කම්පැනි ලිමිටඩ් | 6,625,000 | 10 | 30 | 265,000,000 | 54,838,266 | 27,984 |
| බයිරහා ෆාර්ම්ස් ලිමිටඩ් | 4,000,000 | 10 | 18 | 112,000,000 | 9,501,700 | 6,266 |
| සෙලින්කෝ සිකියුරිටීස් ඇන්ඩ් ෆිනෑන්සියල් සර්විසස් ලිමිටඩ් | 5,000,000 | 10 | 10 | 100,000,000 | 83,841,800 | 51,850 |
| ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් | 2,377,700 | 10 | 90 | 237,770,000 | 8,117,271 | 12,776 |
| ඩබ්. එම්. මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් | 990,200 | 10 | 20 | 29,706,000 | - | - |

මූලය : කොළඹ කොටස් හුවමාරුව.

1.81 සංඛ්‍යා සටහන

**1994 වර්ෂය තුළදී ද්විතියික කොටස් වෙළෙඳ පොළෙහි අලෙවි වූ කොටස් ආයෝජන වර්ගීකරණය අනුව බෙදියාම**

| ආයෝජන වර්ගීකරණය | කොටස් ගණුදෙනු ප්‍රමාණය | කොටස් ප්‍රමාණය | වටිනාකම රුපියල් |
|---|---|---|---|
| බැංකු මූල්‍ය හා රක්ෂණ | 135,679 | 143,506,754 | 14,486,125,751 |
| බීම වර්ග. ආහාර හා දුම්කොළ | 39,387 | 87,319,472 | 2,280,153,301 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | 3,840 | 3,033,149 | 265,390,838 |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | 5,464 | 8,970,439 | 361,216,093 |
| පාවහන් හා රෙදිපිළි | 18,296 | 11,230,007 | 433,757,887 |
| හෝටල් හා සංචාරක | 41,593 | 61,563,381 | 1,999,145,739 |
| භාරකාර ආයෝජන | 6,600 | 7,704,656 | 1,912,658,273 |
| ඉඩම් හා දේපල | 23,843 | 28,125,323 | 872,305,653 |
| නිෂ්පාදන | 106,083 | 124,419,677 | 8,100,283,230 |
| මෝටර් රථ | 6,430 | 8,735,737 | 809,015,752 |
| ඔයිල් පාම් | 30 | 22,918 | 11,252,501 |
| සේවා | 719 | 1,647,842 | 94,488,246 |
| ගබඩා හා සැපයුම් | 3,310 | 5,109,632 | 1,394,252,078 |
| වෙළෙඳ | 11,679 | 16,526,773 | 1,542,998,247 |

මූලය : කොළඹ කොටස් හුවමාරුව.